ජේතවනාරාම විහාරය
නුදෙක් නිවන් අවබෝධය සඳහා පමණි

# ඛණ නිබ්බාන මග



ආරාමයේ පැවති දේශනා

නව දේශනා මාලාව - 3

05 දෙසැම්බර්, 2020 | පූජ්‍ය බත්තරමුල්ලේ අමාදස්සන හිමි

- ✓ ඔබේ කාලය නමැති මුදල් ආයෝජනය කරන්න පුලුවන් හොදම බැංකුව සම්බුද්ධ ශාසනය බව...

- ✓ දේශනාව අහන වෙලාවක ඒ සම්බොජ්ජංග ධර්ම සියල්ලම සමව වැඩෙන අතර ඒ වෙලාවට පමණක් සෝතාපන්න ඵලය පිහිටන බව...

- ✓ බණ පදය අහන වෙලාවේ පින්වතුනේ සෝතාපන්න ඵලයත් ශක්‍ර දේවේන්ද්‍ර පදවියත් එකට ලැබෙන්න නම් බණ ඇසීම  කොයි වගේ පිනක් ද බව...

- ✓ අනන්ත සසරක් පසු කර ආ අපි මේ බුදු බණින් ඒ සසර ඉදිරියට යාම වැලකිය හැකි බව.

- ✓ දුගති ලෝකයට දුගතිය කියලා කියන්නේ කියන බුදු බණ තේරෙන්නේ නැති නිසා බව...

- ✓ මේ මරණය කියන එකට නෙමෙයි අපි බය වෙන්න ඕනි, ජාතියටයි බය වෙන්න ඕනේ, නැත්නම් ඉපදීමටයි බයවෙන්න ඕනේ බව...

- ✓ ආර්යන් වහන්සේලා පිළිකුල් කරන දේවල් අනායෝයා පිළිකුල් නොකරයි. ආර්යන් වහන්සේලා පිළිකුල් නොකරන දේවල් අනාර්යයෝ පිළිකුල් කරයි

- ✓ මනුෂ්‍ය ලෝකයේ පය ගහපු පලියට ඔබ ඕක සුගතියක් කියලා විශ්වාස නොකොට සුගතියක් කරගතයුතු බව...

- ✓ දහම තියෙන්නෙ තමන්ව නිවාගන්න මිස තර්ක කරන්න නොවන බව...

- ✓ කෙනෙක් සෝතාපන්න වෙන්නේ ගුරුවරයෙක් ගාව ඉපදිච්ච දහම හොඳට ඇහුම්කන් දීලා. එහෙනං වැදගත්ම කොටස ඇහුම්කන්දීම බව...

- ✓ මේ සම්බුද්ධ සාසනය වෙනුවෙන් කවුරුත් කරන්නෑ දේවල්. ඔක්කොම කරන්නේ තමන් වෙනුවෙන්ම බව...

- ✓ නිවන ප්‍රායෝගික දෙයක්. ඒක කරන්න ඕන දේ විතරක් නෙමෙයි, කරන විදිහ අතිශය වැදගත් බව...

- ✓ සම්බුදු සාසනයේ ඉන්නේ ශ්‍රාවකයෝ මිසක් දේශකයෝ නෙවෙන බව..

- ✓ කර්මයකින් කරන්න පුළුවන් දුක හදන එක විතරක් බව...

- ✓ සංසයා ඇසුරු කරන්න ඕනේ දහමට නෙමේ නිවනට ලන්වෙන්න බව...

- ✓ දහම් වැඩීම හා මග වැඩීම දෙකක් බව...

සුභදයි, තෙරුවන් සරණයි සියලු දෙනාටම! අදත් පින්වතුනි අපි සියලු දෙනාම දැන් සූදානම් වෙන්නේ සද්ධර්මය දේශනාවක් ශ්‍රමවණය කිරීමට. ඉතින් ඔබ සියලු දෙනාම දැන් ඒ සඳහා ලෑස්ති වෙලා ඇති. සූදානම් වෙලා ඇති. චුට්ටක් බලන්න තමන්ගේ වටපිටාව දිහා, තමන් ඉන්න පරිසරය හැකි උපරිමයෙන්, දේශනාවක් අවධානයෙන් ශ්‍රවවණය කරන්න පුළුවන් වාතාවරනය මේ වෙලාවේ සූදානම් කර ගන්න.

නිරන්තරයෙන්ම අපි මේක ඔබට මතක් කරනවා, ඒකට විශේෂ හේතුව පින්වතුනි, ඔබ විවිධාකාරයේ වැඩ කර කර දේශනාවක් අහනවා ඇති කියලා අපි විශ්වාස කරන නිසා නෙමෙයි, නමුත් සාමාන්‍යයෙන් ඔබ ආරණ්‍යඅයට එන දවසට ඔබට මතක ඇති, දේශනාවක් බොහොම අවධානයෙන් තමන්ගේත්, අනුන්ගේත්, දහම් සමාධියට බාධා නොවන අයුරින් ඒ දේශනාව අහන්න ඕන කියන කාරණාව පින්වතුනි අපි මතක් කරනවා. මොකද ඒක ඉතාමත් වැදගත් කෙනෙක්ගෙ දහම් අවබෝධය සඳහා.

ඉතින් විශේෂයෙන් ඔබ දැන් මේ වෙලාවේ අපිට ඇහැට පේන මානේ නැති නිසා ඔබ ඉන්න පරිසරය ගැන අපිට නිච්චියක් නැති නිසා, ඔබට සිදු වෙනවා, ඔබ ඉන්න පරිසරය ඒ සඳහා පුළුවන් තරමින් සූදානම් කර ගන්න. ඒ කියන්නේ ගෙදර ඉන්න මිනිස්සු ඔක්කොම එළවන්න කියලා නෙමෙයි කියන්නේ. තමන්ට පුළුවන් මට්ටමින්, මේ දහම් ශ්‍රලවණය කරන්න ලෑස්ති වෙන වෙලාවේ, ඔබේ, ඔබත් එක්ක එකට බණ අහන්න ඉන්න, පිරිසක් ඉන්නව නම් ඒ අයත් එක්ක එකතුවෙලා, විශේෂයෙන් ඔබ ජංගම දුරකථන වගේ දේවල් පාවිච්චි කරනවා නම්, පාවිච්චි නොකරන කෙනෙක් අද නැති තරම්, නමුත් ඒකෙන් නෙමෙයි නම් ඔබ අද මේ දේශනාව ශ්‍ර වණය කරන්නේ, හැකියාවක් තියෙනවනම් ඒ විවිධ අංගෝපාංග පැත්තකින් තියලා, පොඩි වෙලාවකට මේ දේශනාව ශ්‍රවවණය කරන්න සූදානම් වෙන්න. එතකොට ඔබට දේශනාවෙන් ගන්න තියෙන උපරිම දේ ගන්න පුළුවන් වෙයි. ඒ විතරක් නෙමෙයි පින්වතුනි දේශනාවෙන් ගන්න තියෙන දේ විතරක්, දේශනාවෙන් ගන්න දේ විතරක් උපරිමයෙන් ගන්න විතරක් නෙමෙයි, මතක තියාගන්න, මේ දේශනාව ශ්‍රයවණය කරන්නට, ඔබට මේ ලෝකෙ තියෙන වටිනාම දේ, මේ වෙලාවේ වැය කරන්න සිද්ධ වෙනවා පින්වතුනි. ඒ තමයි ඔබට ලැබිලා තියෙන මනුස්ස කාලය. ඉතින් කාලයට වටිනාකමක් දෙන්න තමයි ඔබ හැම වෙලාවෙම උත්සාහ කරන්නේ. මේ ලෝකෙ සත්වයා හැමෝමත් එහෙමයි. තමන්ගේ කාලෙට වැඩිම වටිනාකමක් දීගන්න, ඉතින් මේ වෙලාවේ ඔබ පැය එකහමාරක්, පැය දෙකක්, මේ දේශනාව ශ්‍රතවණය කරන්න නම් සූදානම් වෙන්නේ, ඒ ඔබේ ජීවිතයෙන් පැය දෙකක් බව හොඳින් මතක තියාගෙන ආන් ඒ පැය දෙකට දේශනාව අහන්නවනම්, ඒ පැය දෙක තුළ ඒ කරන දේ අපි, උපරිම සාර්ථක වෙන්න පුළුවන් විදියට කරගන්න එක තමයි නුවණට හුරු. ඉතින් ඒ නිසා, ඒ කරුණුත් හොඳින් සිහියේ තියාගෙන අපි හැමෝම දේශනාව ශ්‍රහවණය කරන්න සූදානම් වෙමු. හොඳයි එහෙනම් පින්වතුනි, පළමුකොටම, තිසරණය සහිත පංච සික්ෂා පද සමාදන් වීම සඳහා සියලු දෙනාම ඔබට දැන් මේ තියෙන පරිසරය සුදුසුයි නම් ඒ

සඳහා, අසුන් වලින් නැගිට, තිසරණය සමාදන් වීම සඳහා, මා කිව්වායින් පසු මේ ආකාරයට සමාදන් වෙන්න.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස!
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස!!
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස!!!

බුද්ධං සරණං ගච්ඡාමි......
ධම්මං සරණං ගච්ඡාමි......
සංඝං සරණං ගච්ඡාමි.......

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි...
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි...
දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි.......

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි...
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි...
තතියම්පි සංඝං සරණං ගච්ඡාමි....

සරණාගමනං සම්පූණ්ණං....

පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි,
අදින්නාදානා වේරමණී සික්ඛා පදං සමාදියාමි,
මුසාවාදා වේරමණී සික්ඛා පදං සමාදියාමි,
කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛා පදං සමාදියාමි,
සුරාමේරය මජ්ජ පමාදට්ඨානා වේරමණී සික්ඛා පදං සමාදියාමි,

තිසරණේණ සද්ධින් පංචසීලං ධම්මං සාධුකං සුරක්ඛිතංකත්වා, අප්පමාදේන සම්පාදේත.

හොඳයි සියලුදෙනාම අසුන් ගන්න.....

ඒ වගේම දේශනාව ශ්‍රවණය කරන්න ආරම්භ කරන්න මත්තෙන් මේ දස දහසක් ලෝක ධාතුවක ජීවත්වෙන, වාසය කරන, අනන්ත සංසාරයක් පුරාවට, ඔබත් එක්ක සහ සම්බන්ධ වෙලා මේ සංසාරය පුරාවට කටයුතු කරගෙන ආපු, මහා අති දැවැන්ත පිරිසක් ඉන්නවා පින්වතුනි. ආන් ඒ සියලු දෙනාටත් අද ඔබට මේ ලැබිලා තියෙන අවස්ථාව සලසා දෙන්නටයි දැන් අපි මේ සූදානම් වෙන්නේ....

ඒ වගේම ඒ අතර ඉන්නවා ඔබේ අතින් අවැඩකම් අසාධාරණකම් වලට ලක් වෙලා, ඉතාමත් දුක්ඛිත අත්බැව් වල ඉපදිලා ඉන්න පිරිස්, සමහරවිට අද ඒ අය ඔබේ නිවන් මඟට බාධා කරනවා කියලා හිතන් ඉන්න පිරිසක් වෙන්නත් පුළුවන් පින්වතුනි, ගැලවුමකට එකම එක දෙයයි තියෙන්නේ. පුළුවන් තරමින් ඒ අයට ඒ යහපත සලසලා

දෙන එකයි, එදා ඔබේ අතින් අවැඩකම්, අසාධාරණකම් වෙච්ච පිරිස් අද ඔබේ අතින් ඒ අය කෙරෙහි යහපත සිද්ධ වෙන්න පටන් ගනිද්දි, ඒ අයගේ සුබ සිද්ධිය උදෙසා කටයුතු කරන්න ඔබ පටන් ගනිද්දි, ඒ පැත්තට ඔබේ හිත නැඹුරු වෙද්දී, ඒ පිරිස ක්රුමක්රටමයෙන්, ඔබත් එක්ක ඒ තිබ්බ හිත් අමනාපකම් අතහරින්න පටන් ගන්නවා.

ඉතින් අන්න ඒ නිසා අපි දැන් මේ වෙලාවේ දේශනාව ශ්ර්වණය කරන්න සූදානම් වෙන්න කලින්, දස දහසක් ලෝක ධාතුවේ වැඩසිටින සියලුම දෙවි දේවතාවුන් වහන්සේලාත්, ඒ අතර විශේෂයෙන්, සක්රල දේවේන්ද්රවතුමා ප්ර ධාන ඉන්ද්රත, උපේන්ද්ර්, චන්ද්රඅසේකර, ප්රනජාපත්ති, කියන්නාවූ ඒ සතරවරම් දෙවි රජදරුවන් ඇතුළු ඒ පරිවාර සේනා පිරිසටත්, ඒ වගේම අනන්ත සංසාරයක් පුරාවට ඔබත් එක්ක නොයෙක් ආකාරයේ සහ සම්බන්ධ වෙලා, සහ සම්බන්ධකම් කරගෙන, නොයෙක් ආකාරයෙන් සහ සම්බන්ධ වෙලා, කටයුතු කරගෙන ආපු පිරිසටත්, මේ ස්ථානයට එන්නට කියලා ආරාධනය කරගමු, ඇවිදින් මේ ශ්රී් සද්ධර්මය ශ්රකවණය කරගෙන උත්තරීතර මාර්ගඵල අවබෝධය කිරීම සඳහා. එහෙම නම් මං දැන් දේව ආරාධනාව කරනකොට ඔබ සියලු දෙනාම හිතින් ඒ අරමුණෙන් මේ ලෝක සත්වයා කෙරෙහි මහත් වූ අනුකම්පාවෙන් අප්රිමාණ මෙත්තා සහගත චේතනාවෙන් ඒ ආරාධනාව ඒ සියලු දෙනා කෙරෙහි විහිදුවා පතුරුවා හරින්න. ඇවිදින් මේ සද්ධර්මය ශ්රවවණය කරන්න. මේ මහා පුණ්යත කර්මය දැකබලා ගන්න. සිත් පහදවාගෙන අභව්යන ස්ථානවල ඉපදිලා ඉන්නවානම් එයින් අතමිදීලා, සුගති අත්බව ලබලා, තථාගත සද්ධර්මය දේශනාව අවබෝධ කරගෙන උත්තරීතර මාර්ගඵල අවබෝධ කරගැනීම සඳහා.

සමන්තා චක්ක වාලේසු - අත්රා ගච්චන්තු දේවතා
සද්ධම්මං මුනි රාජස්ස - සුනන්ත්තු සග්ග මොක්ඛදං

ධම්මස්සවන කාලෝ - අයං බදන්තා,
ධම්මස්සවන කාලෝ - අයං බදන්තා,
ධම්මස්සවන කාලෝ - අයං බදන්තා.

ඒ වගේම සියලු දෙනාම පින්වතුනි මේ අනන්ත සංසාරය පුරාවට තමන්ගේ අතින් වෙච්ච ආර්ය උපවාද, ඒ වගේම මේ ශ්රී් සම්බුද්ධ ශාසනයේ තමන්ගේ අතින් වෙච්ච හිංගි හිංසා අකටයුතුකම් දැන් මේ මොහොතේ කමා කරගන්නයි මේ සූදානම් වෙන්නේ. සියළු දෙනාම තරයේ මේක හිතට ගන්න ඕනි, පින්වතුනි මේ කියන කාරණාව ඉතාමත් වැදගත් නිසයි මෙහෙම හැමදාම මතක් කරන්නේ.

ඔබේ අතින් එදා වුණු ආර්ය උපවාද තමයි අද ඔබ ආර්ය මාර්ගයේ යද්දි, ඒ මාර්ගයට අවහිරකම් බාධා ඇති කරන්නේ. එදා ඔබේ අතින් සම්බුදු ශාසනයට පින්වතුනි වෙච්ච අවැඩකම්, අකටයුතුකම් තමයි පින්වතුනි අද ඔබ සම්බුද්ධ ශාසනයක ඵල නෙලාගන්න උත්සාහ කරද්දී ඔබේ ඒ මගට බාධා කරන්නේ. ආන් ඒ නිසයි මේ ඔබේ නිවන් මග කරගන්න සූදානම් වෙන වෙලාවේ ඒ උත්තරීතර ගුණ දරා ගත්ත, උත්තරීතර තථාගතයන් වහන්සේලාට, ඒ වගේම ඒ උත්තමයන් වහන්සේලාගේ ඒ උත්තරීතර ගුණ දරා ගන්න උන්වහන්සේලාට නිදහසර සලසලා දුන්න ඒ සම්බුදු

ශාසනයට තමන්ගෙ අතින් වෙච්ච අපවාද උපවාද තියෙනවනම් ඒ සියල්ල කමාකර ගන්නයි මේ සූදානම් වෙන්නේ.

ඒ නිසා සියලු දෙනාම මං මේ කියන ආකාරයට මොහොතක් සිහිපත් කරගෙන, බොහොම අවංක චේතනාවකින් යුක්තව, බොහෝම යටහත් පහත්ව, ඉතාමත්ම නිහතමානී සිතින් තමන්ගේ අතින් වෙච්ච අවැඩකම් අසාධාරණකම් වැරදි ඒකාන්තයෙන්ම මගේ අතින් සිදුවුණා කියන තැනට තමාගේ හිත පත්කරගෙන, අවංකව මේ ආර්ය උපවාද කමාකරගන්න, අන්න ඒ විදියට කල්පනා කරගන්න.

අනන්ත සංසාරයක් පුරාවට මගෙ හිත කය වචනය යන තිදොරෙන් ඒ උත්තරීතර වූ බුද්ධ රත්නයට, ධම්ම රත්නයට, සංඝ රත්නයට සහ සම්මා සම්බුදු පියාණන් වහන්සේලාට, පසේ බුදු පියාණන් වහන්සේලාට, අරහත් බුදු පියානන් වහන්සේලාට, අනාගාමී සකෘදාගාමී සෝතාපන්න මගඵල ලාභී ඒ උත්තරීතර ආර්යයන් වහන්සේලාට, ශ්රීා සම්බුද්ධ ශාසනයට, දැන හෝ නොදැන, බිංදු මාත්රදයකින් හෝ වරදක් හිංගියක්, හිංසාවක්, අකටයුත්තක්, අපවාදයක්, උපවාදයක්, අපහාසයක්, උපහාසයක් කිසියම් පමණකින් හෝ සිදුවී ඇත්නම්... ඒ උත්තරීතර ආර්යයන් වහන්සේලා මා හට දස දහසක් වර, කෝටි ලක්ෂයක් වර, කමා කර වැඩ වදාරණ සේක්වා!... කියලා සියලු දෙනාම ආර්ය උපවාද කමා කරගන්න.

ඒ වගේම මේ ආර්ය උපවාද කමා කරගන්න වෙලාවේ පින්වතුනි සියලු දෙනාම එකවර අධිෂ්ඨානයක් හිතට ගන්න තමන්ගේ අතින් මින් මත්තට කිසිදිනක වත් මේ සිත, කය, වචනය, යන තිදොරින් ඒ ආර්යයන් වහන්සේලාට අපවාද, උපවාද, වෙන්නට මම කොහෙත්ම ඉඩදෙන්නේ නෑ... කියන අධිෂ්ඨානය හිතේ තියාගෙන ඒ විදියට මොහොතක් කල්පනා කරගන්න.

ඒ වගේම පින්වතුනි සියලු දෙනාම හිතට දැඩි අධිෂ්ඨානයක් ගන්න මේ දම්සභා මණ්ඩපය තුළ දීම, මේ ධර්ම දේශනාව තුළ දීම චතුරාර්ය සත්යාය ධර්මය අවබෝධ කරගෙන නිවන් මහට ප්රයවිශ්ටයක් ගන්නට උත්සාහ ගන්නවා. ඒ කියන්නේ සතර අපායෙන් සදහටම මිදිලා උත්තරීතර සෝතාපන්න ඵලයේ පිහිටනවා, පිහිටන්න මම උත්සාහ ගන්නවා, වෙර වීරිය කරනවා, ඒ වෙනුවෙන් මම සසර පුරාවට කරගත්ත යම්තාක් පුන්යඝ කුසල කර්ය ඇත්නම් ඒ සියල්ලක්ම මේ මොහොතේ ඇදිලා ඇවිල්ලා මට පිහිට වෙන්නට කියලා අධිෂ්ඨාන කරන්න. ඒ වගේම සෝතාපන්න ඵලයේ පිහිටලා ඉන්න යම් කිසි කෙනෙක් ඉන්නවනම් පින්වතුනි, මේ දහම් දේශනාව අවබෝධ කරගෙන ඉදිරි මාර්ග පලයන් උපසම්පදා කරගන්නවා, අද මේ ශ්රමවණය කරන දහම් දේශනාව ඔබ සියලු දෙනාටම ඒකාන්තයෙන් උපකාර වෙත්වා කියලා සියලු දෙනාම අධිෂ්ඨාන කරලා, සාධුකාරයක් පවත්වලා, සදහම් දේශනාව ශ්ර වණය කරන්නට සූදානම් වෙමු.

හොඳයි. දැන් අපි බොහොම වැදගත් වැඩක් කරන්නයි මේ සූදානම් වෙන්නෙ. දේශනාව පටන් ගන්න වෙලාවෙත් මං සඳහන් කරා පින්වතුනි, ඔබ දැන් මේ ගත කරන්න යන්නේ ඔබට තියෙන වටිනාම දේ. අපි, වටිනා දෙයක් වෙන්කරන්න ඕනේ, කැප කරන්න ඕනේ, එහෙමත් නැත්නම් වචනයෙන් කියනවා නම්, ආයෝජනය කරන්න ඕනේ, ඒ වගේම හෝ එහෙමත් නැත්නම් ඊටත් වඩා වටිනා දෙයක් ගන්නවා

කියන අධිෂ්ඨානයේ ඉඳන්. එහෙම නැත්නම් පින්වතුනි අර අපේ කටවහරේ කියනවා වගේ අතින් පාඩුයි. ඔබ කාලය කියන ඉතාමත්ම වටිනා සම්පත වියදම් කරලා, ඊට වඩා අඩු වටිනාකමකින් යුක්ත දෙයක් නම් අනිත් පැත්තට ලබාගන්නේ, ඇත්තටම අතින් පාඩුයි. මතක් කරලා බලන්න පින්වතුනි, ඔබ මේ හැමෝම ගත කරන්නේ, එසේ මෙසේ දෙයක් නෙමෙයි. ඔව්... කාලය තමයි, එසේ මෙසේ කාලයක් නෙමෙයි. මොකද ඔබ හැමෝටම පින්වතුනි මේ කාලය ලබාගන්න බොහෝම දුක් ගැහැට මැද්දේ ලොකු වෙහෙසක් දරන්න සිද්ධ වුණා.

මොකද පින්වතුනි මේ ගතවෙන්නේ ඔබට මේ ලැබිලා තියෙන්නේ මනුෂ්‍යයේ කාලය. ඒ වගේම තථාගතයන් වහන්සේ නමක් මේ ලෝකයේ උන්වහන්සේ දේශනා කරපු දහම මේ ලෝකයේ පවතින කාලය. ඒ දහම තුළ හැසිරෙන, ඒ දහම තුළ හික්මෙන, ඒ දහම තුළ නිවෙන්න, ඒ වගේම ඒ දහම තුළ නිවෙන ගමන් අනෙක් අයටත් නිවෙන්න උදව් කරන, මහා සංඝරත්නය වැඩ ඉන්න කාලය.

ඔබට මං ගිය සතියේ මතක් කරලා දුන්නා තථාගතයන් වහන්සේගේ නැත්නම් බෝධිසත්වයන් වහන්සේගේ බෝධිසම්භාර පුරන්න දරපු ශ්‍රසමය, පරිශ්‍රරමය ඒ වෙහෙස, ඒ කාලයට හිලව් කරගන්න පුළුවන් දේ තමයි පින්වතුනි මහා සංඝරත්නය ඇසුර. ඔබ මං කියන එකේ අර්ථය ගන්න. මං කියන්නේ නෑ එකට එකක් කියලා. නමුත්, බෝධිසත්වයන් වහන්සේට සංඝරත්නයක් කියලා එකක් හිටියේ නැහැ, උන්වහන්සේගේ බුද්ධත්වය සාක්ෂාත් කරගන්න උදව් කරගන්න. ආන් ඒ නිසා විසිඅසංක කල්ප ලක්ෂක් අප්‍රතමාණ දුක් ගැහැට විඳින්න සිද්ධ වුණා. හැබැයි උන් උන්වහන්සේ බුදු වෙච්ච් ගමන් පින්වතුනි උන්වහන්සේට වැටහිච්ච කාරණාවක් තියෙනවා, ඒ තමයි “මට මේක මෙච්චර කල් කරලා, මෙච්චර දුක් විඳලා ලබාගන්න සිද්ද උනාට, මේ අනිත් ලෝක සත්වයාට මෙච්චර මේක දුක්විඳලා ලබාගන්න ඉඩ තියන්න බැහැ මට”. මේ බුදුවරුන්ට හිතෙන විදිහ වෙන්න ඇති. ඔබ කල්පනා කරලා බලන්න ඕනේ ඇයි උන්වහන්සේගේ ශාසනය පනවන්නේ කියලා පින්වතුනි. උන්වහන්සේගේ ඒ පළවෙනි දේශනාවෙම මේ සාසනයක් පැනෙව්වානේ. පලවෙනි දේශනාව අවසන් වෙනකොටම පින්වතුනි කොණ්ඩඤ්ඤ තාපසයා වෙලා හිටපු පුද්ගලයා, පළවෙනි දේශනාව අවසන් වෙනකොටම අඤ්ඤාසිවත ගෝ කොණ්ඩඤ්ඤ ඒ කියන්නේ, පළමුවෙන්ම අවබෝධ කරගත්ත කොණ්ඩඤ්ඤ කියන විරුදාවලිය තථාගතයන් වහන්සේගේ අතින් පිරිනැමුණා. ඒ උන්වහන්සේ මහා සීහනාදයක් කරා. ඉතින් පින්වතුනි ඒක මහා හිතාගන්නවත් බැරි මහා ශ්‍රේසෂ්ඨ අවස්ථාවක්. මොකද මතක තියාගන්න ඕනි මේ බුදුකෙනෙක් පින්වතුනි මේ සීහනාදය කරන්නේ. සම්මා සම්බුදු කෙනෙක්. පසේ බුදුරජාණන් වහන්සේ නමක් නෙමෙයි නේ.

මොකද පසේ බුදුරජාණන් වහන්සේ නමක්... අපි විශ්වාස කරමු..., දන්නවා ඇති උන්වහන්සේට මේ දහම දේශනා කරාට අනෙක් පිරිසට අවබෝධ කරගන්නට බැරි බව. කියමුකෝ උන්වහන්සේ දන්නවා ඇති කියලා. මොකද උන්වහන්සේ සර්වඥ නෙමෙයිනේ. ඒ නිසා අපිට එහෙම ඒකාන්තයෙන් නිගමනය කරන්න අපහසුයි. නමුත් උන්වහන්සේලා මහා ප්‍රඡ්ඥාවන්ත පිරිස් පින්වතුනි. අපිට හිතන්නවත් බැහැ උන්වහන්සේලා හිතන දේවල්, ඒ කොහොමද උන්වහන්සේලා කටයුතු කරන්නේ කියලා. බුදුවරුන්ට, සම්මා සම්බුදුවරුන්ට විතරයි දෙවැනි. සාරිපුත්‍ර්යන් වහන්සේට

වඩා ප්‍රාඥාවක් තියෙන උත්තමයන් වහන්සේ නමක් තමයි පින්වතුනි පසේ බුදුරජාණන් වහන්සේ නමක් කියලා කියන්නේ. ඉතින් ඒවා අපිට හිතාගන්නවත් බැරි දේවල්. නමුත් පසේ බුදුරජාණන් වහන්සේ නමක් බෝධිසම්භාරධර්ම පුරන්නේ පින්වතුනි තමන්ගේ විමුක්තිය තමන් විසින්ම අවබෝධ කරගන්න ඕනේ කියලා.

නමුත් උන්වහන්සේලායි, සම්මා සම්බුදුරජාණන්වහන්සේලායි අතරෙ තියෙන වෙනස ඔබ දන්නවා,... සම්මා සම්බුදුරජාණන් වහන්සේලා පාරමිතා ධර්ම පුරන්නේ මේක මට විතරක් අවබෝධ කරගන්න නෙමෙයි, අනිත් ලෝක සත්වයෝ සියලු දෙනාටම මේක අවබෝධ කරල දෙන්න ඕනි කියලා. ඉතින් මෙහෙමයි උන්වහන්සේ බුදු වෙච්ච ගමන් උන්වහන්සේ දන්නවා මං ඒ හිතාගත්ත දේ හිතා ගත්ත විදිහට සිදු වෙන්නේ නෑ කියලා. ඒකයි ඒ අවිද්‍යාසව පහ වෙන්නේ පින්වතුනි උන්වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත් වුණාට පස්සේ. ඒ කියන්නේ මේ ලෝක සත්වයා කියන කොටස, කොටසින් උන්වහන්සේලාට ගොඩදාන්න පුළුවන් උන්වහන්සේලාගේ ශාසනය තුළ අර මහ මුහුදට කෙස් රොදක් දාලා ඒ කෙස් රොද උඩට ගනිද්දී මහ මුහුදෙන් ඒකෙ රැඳෙන වතුර බිංදුව තරම් ප්‍රඩමාණයක් තමයි මහ මුහුදට සාපේක්ෂව ගත් කල උන්වහන්සේලාට එක ශාසනයක් තුළ බේරගන්න පුළුවන් ප්‍රමාණය කියලා, බුදුවරුන්ට ඒක වැටහෙන්නේ බුදු වුණාට පස්සේ. ඉතින් බුදු වෙනකම් ඒක තේරෙන්නෙ නෑ. බුදු වෙනකන් උන්වහන්සේලා හිතන්නේ මේ පයට පෑගෙන කුඹුවගෙ ඉඳන් නිල් තල්මසා දක්වා මේ කාම ලෝකයේ ඊට පස්සේ සදෙව් ලෝකයේ ඉන්න සියලු දෙනාවත් ඊට පස්සේ බ්‍රමහ්මලෝකයේ ඉන්න සියලු දෙනාවත් ඒ කියන්නේ මහා බ්‍රවහ්මයා දක්වා පින්වතුනි ඇහැට පේන්නෙ නැති ඇමීබාවගේ ඉඳන් මහා බ්‍ර හ්මයා දක්වා සියලු දෙනාවම මං ගොඩදානවා කියලා තමයි බෝධිසත්වයන් වහන්සේලාට විවිධ අවස්ථාවල හිතෙනවා ඇත්තේ. එහෙම හිතෙනවා ඇති. මට නම් එහෙම හිතිලා නෑ කවදාක්වත්. එහෙම හිතෙනවා ඇති. අපි ඉතින් මේ යන්තම් අපේ වැඩේ කරගෙන අපිත් එක්ක යන කීප දෙනෙක් ඉන්නවා ඇති, ඒ ඔබ කියන පිරිස පින්වතුනි, ඔබටත් යහපතක් කරලා දෙන්න තමයි අපි උත්සාහ කරන්නේ.

බුදුවරුන් බෝධිසත්වයන් වහන්සේලාට තියෙන ඒ අනන්ත අප්‍රමාණ මෙත්තා කරුණාව පින්වතුනි, අපිට පහල වෙයි කියලා හිතන්න අමාරුයි. ඉතින් ඒ නිසා අපි, මොකද අපි යන්නේ පින්වතුනි ඊට ගොඩක් මෙහා පැත්තෙන්. යන්තම් වැඩේ කරගන්න පුළුවන් ගමනක් තමයි මේ යන්නේ. ඉතිං ආන් ඒ ගමන, ඔබ තමයි ඔබ සියලු දෙනා එකතු වෙලා ඉන්නේ, කොහොමත් සම්මා සම්බුදු වෙලා මේ ගමන කරගන්න යනවා නම් එහෙනම් ඉතින් මේ සාසනයෙන් ගොඩයන්න බැහැ. මොකද බුදුවරු දෙනමක් එක කාලයක පහළ වෙන්නේ නැහැ.

අපි කියාගෙන ආපු කාරණාව තමයි සම්මා සම්බුදු පියාණන් වහන්සේ නමක් පින්වතුනි පලවෙනි දේශනාව, උන්වහන්සේගේ මංගල දේශනාව කරලා ඒකෙන් එක පුද්ගලයෙක් හෝ සෝතාපන්න ඵලයේ පිහිටද්දි ඒ උත්තමයන් වහන්සේලා පින්වතුනි ඒ වෙලාවේ බුදු හිතටත් පින්වතුනි මහා ප්‍රසාදය ජනිත වෙනවා. ආන් ඒ ජනිත වෙන ප්‍රසාදය නිසා තමයි පින්වතුනි උන්වහන්සේ සීහ නාදයක් පවත්වන්නේ. "අඤ්ඤාසි වත බො කොණ්ඩඤ්ඤ" කියලා ඒ උන්වහන්සේ මහා සතුටට පත්වෙලා, මේ

කොණ්ඩඤ්ඤ මේක පළමුව තේරුම් ගත්තා කියලා උන්වහන්සේ ප්‍රසාදය පළ කරනවා.

ඉතින් ඒකේ අපි ගන්න තියෙන කාරණාව, උන්වහන්සේ සම්මා සම්බුදු වෙන්න ගියපු කාරණාව ඉෂ්ඨ වුනා කියන එක තමයි උන්වහන්සේලා ඒ වෙලාවේ එහි ප්‍රකාශ කරන්නේ. මොකද පසේ බුදුන් වහන්සේලා ඔය කියන සීහ නාදය කරන්නේ නැහැ. එහෙම කරන්න උන්වහන්සේලාට බලාපොරොත්තුවක් ඇත්තේත් නැහැ. එහෙම එකක් පසේබුදු කෙනෙක්ගේ ශාසනයක් තුළ, නැත්නම් ඒ බුදු රජාණන් වහන්සේ නමකගේ ජීවිත කතාව බැලුවොත් එහෙම, එහෙම කොටසක් නැහැ. ඒක පසේ බුදුන් වහන්සේලාට වලංගු දෙයක් නෙමෙයි. ඒක බුදුවරුන්ට. සම්මා සම්බුදුවරුන්ට අයිති දෙයක්. ඉතින් උන්වහන්සේලා පින්වතුනි කල්පනා කරනවා මොකද, හිතාගන්න බැරි මෙත්තාවක් කරුණාවක් තියෙන හිත් පින්වතුනි. මෙහෙම කිව්වොත් මෙත්තාවේ... උල්පත. එහෙම කිව්වොත් අපි නිවැරදියි. කරුණාවේ... උල්පත. ඒ කියන්නේ එතනින් තමයි පින්වතුනි මෙත්තාව කරුණාව වගේ දේවල් මේ ලෝකෙට උපදින්නේ. එහෙම කල්පනා කරගත්තට වරදක් නෑ. ඒ කියන්නේ සම්මා සම්බුදුපියාණන් වහන්සේගේ නමකගේ හිතකින්.

ඉතින් එතකොට උන්වහන්සේලාට කල්පනා වෙනවා ඇති මම බෝධිසම්භාර ධර්ම පුරන්නේ, විසියාසංඛ්‍යා කල්ප ලක්ෂයක් දුක් වින්දා. හැබැයි ඒ දුක් වින්දේ මට ගුරුවරයෙක් හිටපු නැති නිසා. මට කල්‍යාණ මිත්‍රයෝ පිරිසක් හිටියේ නැති නිසා. විවිධාකාරයේ පිරිස් ආවා තමයි උදව් කරන්න. ආලාරකාරම, උද්දකරාමපුත්‍රක ලා පස්වග තවුසන් ඒ හැමෝම උදව් කරා තමයි පින්වතුනි, නමුත් කල්‍යාණ මිත්‍රත්වය උන්වහන්සේට දෙන්න කවුරුත්, කිසිම ජගතෙක් හිටියේ නැහැ. කල්‍යාණ මිත්‍රත්වය කියලා කිව්වේ, මේ නිවන් මඟ දැකපු, නිවන් මගේ යන්න උදව් කරන්ඩ පුළුවන්, පිරිසක් උන්වහන්සේට හිටියේ නැහැ. ඒ නිසාම තමයි පින්වතුනි උන්වහන්සේලාට එච්චර කාලයක් පාරමිතා ධර්ම පුරන්න සිද්ධවෙන්නේ.

ඔබ මතක තියාගන්න ඕනේ අනිත් එක, ගෞතම බුදුරජාණන් වහන්සේ කියලා කියන්නේ, ප්‍රඥා අධික බුදුවරයෙක්. බුදුවරු දෙනමක් අතර ප්‍රඥාවේ වෙන්සක් නැහැ. නමුත් උන්වහන්සේලා ආපු ගමන් මගේ වෙන්ස්කම් තියෙන්න පුළුවන්. ඉතින් ඒ නිසා තමයි, වීර්‍ය්‍යාධික බුදුවරුන්, ශ්‍රද්ධාධික බුදුවරුන්, ප්‍රඥාධික බුදුවරුන් වශයෙන් පින්වතුනි ඉතින් එහෙම නම් කරන ක්‍රමවේදයක් තියෙනවා. නමුත් ඔබ දන්නවා බුදුවරුන් දෙනමක් අසමසමයි. ඒ කියන්නේ බුදුකෙනෙක් අසමසමයි. උන්වහන්සේ වෙන කිසිම කෙනෙක්ට සමාන නෑ. උන්වහන්සේ සමාන වෙනවා නම් සමාන වෙන්නේ, තවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමකට විතරයි. ඉතින් සමාන වෙනවා නම් සියලු ආකාරයෙන් එහෙනම් අපිට කියන්න බෑ, එක්කෙනෙක්ගේ ප්‍රඥාව මෙච්චරයි, මේවා පින්වතුනි, කතා කරන්නවත් වටින දේවල් නෙවෙයි. කතා කරන්න කිසිම සුදුසුකමක් ලබපු අය නෙමෙයි පින්වතුනි අපි. බුදු කෙනෙක්ගෙ ප්‍රඥාවක් කතා කරන්න පුළුවන් ජගතෙක් පින්වතුනි මේ තුන් ලෝකේ ඉන්නවනම් ඒ ඉන්නේ බුදු කෙනෙක්ම විතරයි. ඉතින් අපිත් හරි හරියට ඒවා කතා කරනවා, හරියට අපිට ගෝචර වෙන දේවල් වගේ, ඒවා අපිට ගෝචර වෙන දේවල් නෙවෙයි. නමුත් ඔබට මේ යම් කරුණක් මේ කියන්න උත්සහ ගන්නේ ඔබ කොයිතරම් වාසනාවන්තයි ද කියන

කාරණාව සහ ඔබට මේ ගත වෙන්නේ මොකක්ද කියන එක ගැන ඔබට මතක් කරලා දෙන්න.

ඉතින් බුදු කෙනෙක්ට කල්පනා වෙනවා ඇති පින්වතුනි මේ මට මෙච්චර කාලයක් දුක් විඳින්න සිද්ධ වුණේ මට කල්‍යාණ මිත්‍රයෝ පිරිසක් හිටියේ නැති නිසා කියලා. ඒක කොයි වගේද කියලා කියනවා නම්, හරියට පින්වතුනි ඔබ අම්මා කෙනෙක් නම්, තාත්තා කෙනෙක් නම්, ඔබට මතකද ඔබ දරුවෝ ළඟට අරගෙන වාඩි කරවගෙන සමහරවිට දරුවන්ට කියලා දෙනවා,

"පුතේ උඹලා දන්නෑ අපි ඉගෙනගන්න කොච්චර දුක් වින්දද කියල. පුතේ උඹලා දන්නෙ නැහැ තාත්තා ඕගොල්ලො පොඩි කාලේ ඕන් ඔය කියන මල්ල කිහිල්ලෙ ගහගෙන තමයි හැමදාම උදේ තුනට නැගිටලා මාකට් එකට ගියේ. ගිහිල්ලා තමයි එහේ එළවළු විකුණලා පුතාට ඉස්කෝලේ යන්න සල්ලි හම්බ කළේ. ඉතින් පුතාලාව ලොකු මහත් කරන්න, පුතාලට උගන්වන්න, මේ ගෙවල් දොරවල් හදන්න තාත්තා ගොඩක් දුක් වින්දා.''..

ඉතින් ඔය කතාව කියන්නේ පින්වතුනි අර දරුවන්ට උනන්දු කරවන්න. එහෙම නේ? දරුවන්ට උනන්දු කරවලා සහ දරුවන්ට ඒ තියෙන දේ වටිනාකම පෙන්වලා දෙන්න. ඒ කියන්නේ, මේ ඕගොල්ලන්ට උඹලට මේ ලැබෙන දේවල් මේ ගස්වලින් ගෙඩි එනවා වගේ ආපු දේවල් එහෙම නෙමෙයි. ඒවා වෙනුවෙන් ගොඩක් මහන්සි වුණා, අම්මා තාත්තා. ඉතින් මහන්සි වෙච්ච නිසා ඕගොල්ලන්ට ඒකෙ වටිනාකමක් තේරෙන්න ඕනේ. ඒව නිකන් නිස්කාරණේ නාස්ති කරන්න එහෙම හොඳ නෑ. ඔන්න ඔය කියන කාරණාව කියලා දෙන්නනේ මේ කතාව කියන්නේ. ඉතින් ආන් ඒ වගේ සම්බුදු කෙනෙක් පින්වතුනි මේ ලෝකෙ පහල වෙන එක කොයි තරම් වටිනාකමකින් යුක්ත දෙයක්ද කියලා පොඩ්ඩක් කල්පනා කරලා බලන්න ඕනේ. කාලයේ වටිනාකම, මනුස්ස කාලයේ වටිනාකම අපි තේරුම් ගන්න ඕනේ.

එතකොට බුදු පියානන්වහන්සේ නමක් මේ සාසනයක් පනවනවානම්,..මොකටද? විසි අසංඛෙය කල්ප ලක්ෂයක් මට දුක් විඳින්න උනාට....( උන්වහන්සේ කල්පනා කරන කාරණාව පින්වතුනි හරියට ඔබ අර දරුවොත් එක්ක යමක් කියන්නේ, ඒ ටික කියලා ඇත්තට ඔබ දරුවන්, ඔබ සමහරවිට පින්වතුනි ඔබ ඒ දරුවන්ගේ අම්මා නම්, දරුවන්ගෙ තාත්තත් එක්ක එකතු වෙලා කතා කරනවා නේද අපි කොහොම හරි අපි විඳපු දුක් මේ දරුවන්ට නොදෙන්න අපි වග බලා ගන්ඩ ඕනේ කියලා. අපි ගොඩක් මහන්සි වුනා නමුත් අපි අපේ දරුවන්ට එච්චර මහන්සි වෙන්න ඉඩ තියන්න හොඳ නෑ. අපි හම්බ කරන්න ගොඩක් දුක් වින්දා. හැබැයි අපේ දරුවන්ට හම්බ කරන්න එච්චර දුක් විඳින්න තියන්න හොඳ නෑ. අපි ගොඩක් මහන්සි ගත්තා. ඉගෙන ගන්න, රස්සාවල් හොයාගන්න, ගෙවල් හදාගන්න, අපි අපේ දරුවන්ට එහෙම කරන්න හොඳ නෑ. ඒගොල්ලන්ට අපි ජීවත් වුණාට වඩා දුකින් අඩු ජීවිතයක් ලබාදෙන්න අපි උත්සාහ ගන්න ඕනි කියලා, ඕනම අම්මා කෙනෙක් තාත්තා කෙනෙක් එකතු උනාම කතා කරන කාරණාවක්.)

(ඉතින් සාසනයේ පින්වතුනි අම්මාත් තාත්තාත් දෙන්නම දෙන්නම එක්කෙනෙක්නේ. ඒ කිව්වේ අපේ බුදු හාමුදුරුවන් වහන්සේනේ.) ... ඉතින් ඒ නිසා තථාගතයන් වහන්සේ

කල්පනා කරනවා ඇති පින්වතුනි, අපි හැමෝම ගැන පුදුමාකාර අනුකම්පාවෙන් මම විඳපු දුක මගේ දරුවන්ට දෙන්න බෑ කියලා. මතකද ඔබට "තාත්තා", නමින් අපි වීඩියෝ එකක් හැදුවා? සමහරවිට අලුතෙන් මේ දේශනාව අහන පිරිස් වලට ඒ කාලේ සම්බන්ධ වෙලා හිටියේ නැතුව ඇති නමුත් ඔය වීඩියෝ ගොඩක් දුරට ඇති අපේ වෙබ් සයිට් එකේ එහෙම, ගිහිල්ලා බලන්න. සදහම් සලරු කියලා කොටසක් තියෙනවා, ඒවා අපේ ආරාමයේ ස්වාමීන් වහන්සේලා, අනගාරික මහත්වරු එකතු වෙලාවෙලා හදපු වීඩියෝ. ඔබට මේ විවිධ දහම් කරුණු බොහොම පහසුවෙන් තේරුම් ගන්න හදපු වීඩියෝ. ඒ නිසා තාත්තා කියල වීඩියෝ එකක් තියෙනවා බලලා නැත්තං ගිහිල්ලා බැලුවට වරදක් නෑ.

ඉතින් තථාගතයන් වහන්සේලා පින්වතුනි, තමන්ගේ දරුවන්සේ මේ ලෝකයේ, සියලු සත්වයින්ව දකිනකොට උන්වහන්සේලාට කල්පනා වෙනවා ඇති, මම විඳපු දුක මේ අයට දෙන්න බෑ. එහෙනම් කොහොමද මං මේ දුක ඒ කියන්නේ විසිඅසංඛ කල්ප ලක්ෂයක් මම දුක් වින්දා මගේ මේ ඵලය සාක්ෂාත් කරගන්න. මගේ දරුවන්ට ඒ දුක දෙන්න බැහැ. උන්වහන්සේලාට වැටහෙනවා පින්වතුනි ශාසනයක් ඇති කරානම්, සම්බුදු ශාසනයක් ඇති කරානම්, අර විසියාසංඛ්‍යසයේ කල්ප ලක්ෂය ගේන්න පුළුවන් පින්වතුනි බොහෝ දුරට සමහරක් විට එක අත්භවයකට. හිතාගන්න අමාරුයි කොහොමද ඒවා වෙන්නේ කියලා, නමුත් ගේන්න පුළුවන් වෙන්නැති එක අත්භවයකට, අත්බැව් දෙකකට, අත්බැව් සීයකට. එක පින්වතුනි කල්පයකට ගෙනාවත්, විසියාසංඛ්‍යකයේ කල්ප ලක්ෂය, අසංඛ්‍යයේ කල්ප ලක්ෂයක් කියලා කියන්නේ පින්වතුනි ඉලක්කමකින් කියලා ඉවර කරන්න බෑ, කොච්චර ප්‍රමාණයක් ද කියලා. පින්වතුනි එක කල්පයක් කියන එක කොච්චරක්ද කියලා ඇහුවහම එක්තරා බමුණෙක් තථාගතයන් වහන්සේගෙන්, බුදු හාමුදුරුවන් වහන්සේ, තථාගතයන් වහන්සේ දෙන පිළිතුර තමයි යොදුන් දාසයක් දිග, යොදුන් දාසයක් උස, යොදුන් දාසයක් පළල, පෙට්ටියක් අබ ඇට වලින් පුරවලා අවුරුදු සීයකට වරක් ඇවිල්ලා ඒ අබ ඇටයක් අයින් කරනවා, එක්තරා මනුස්සයෙක්. දැන් ඔය පෙට්ටිය අබ ඇටවලින් හිස් වෙන්න යන කාලය කොච්චරක්ද කියලා ඇහුවොත්, උත්තරයක් දෙන්න පුළුවන්ද? උත්තරයක් දෙන්න පුලුවන් උනා කියමුකෝ, මෙච්චර අවුරුදු ගානක් කියලා. කල්පයක කාලය ඊටත් වඩා වැඩියි. පින්වතුනි, ඒ අසංඛයේ කල්පයක් ගැන නෙමෙයි ඒ කියන්නේ. ඒ කල්පයක් ගැන. අසංඛ්‍යනයේ කල්පයක් කියලා කියන්නේ පිංවතුනි, ඒ වගේ කල්ප අතිශය විශාල ගණනක්. අසංකෙයිය ගනනක් යන්න ගණන් කළ නොහැකි, ගංගානම් නදිය උල්පත්තේ ඉඳන් මහා මුහුද දක්වා ගලාගෙන යන මේ නදීයේ වැලි කැට ගානට වඩා මේ සංසාරයේ කල්ප ගණන් අපි ඉපදිලා තියෙන්නේවා .ඒ කියන්නේ එක වැලිකැටයක් එක කල්පයක් කියලා ගත්තොත්, ඊට වඩා කල්ප ගණන් අපි ඉපදිලා තියෙනවා,ඔබයි මමයි, අපි හැමෝම.

මේ මම හදලා කියන උපමා එහෙම නෙමේ පිංවතුනි. මේවා ඔක්කොම තථාගත දේශනාවේ තියෙන උපමා. තවත් එක අවස්ථාවකදී බුදුහාමුදුරුවෝ දේශනා කරනවා මේ ලෝකයේ තියෙන සියලුම මදටිය ඇට, මදටිය වගේ ඇට ජාතියක්, මදටිය ඇට වගේ හරියට කියන්න දන්නේ නෑ, මදටිය වගේ ඇට ජාතියක් ගමුකෝ...අරගෙන පිංවතුනි ඔබ කොහේ හරි තැනකට එකතු කර ගන්නවා. දැං ඒකෙන් එක ඇටයක් අරගෙන ඔබ පැත්තකින් තියලා ඔබ කියනවා “මේ මගේ අම්මා”. එක ඇටයක්

අරගෙන, මෙ ලෝකේ තියෙන ඔක්කෝම මදටිය ඇට ටික එකතු කරගෙන පැත්තකින් තියලා, ඒකට මේ හැම, මුලු ලෝකෙම තියෙන සියලුම වනන්තර පීර පීර පීර පීර ගිහිල්ලා පිංවතුනි, හැම ගස් වල තියෙන ඒවා ,බිම වැටිලා තියෙන ඒවා, බිම වැටෙන ගමන් තියෙන ඒවා, නරක් වෙවී යන ඒවා, ඒ හැම එකක්ම. මහා ගල් පර්වත වලට යට වෙලා තියෙන ඒවා ඒහැම එකක්ම පිංවතුනි එකතු කරගෙන පිංවතුනි අරන් ඇවිල්ලා, ඒ කියන්නේ මේ ලෝකේ කවදාහරි දවසක මදටිය ගහක් පහල උනා නම් ,එදා ඉඳන් අද දක්වා තියෙන හැම ගහකම ගත්ත හැම මදටිය ඇටයක්ම අරගෙන එක තැනක ගොඩ ගහලා , ඊටපස්සේ ඒකෙන් එක ඇටයක් අරගෙන...,

මේවා පිංවතුනි තථාගතයන් වහන්සේලගේ උපමා. ඒ නිසා ඒ උපමා දෙන්නේ පිංවතුනි තමන්ට දැනෙන්න මොනතරම් දෙයක්ද අපි මේ ලබලා තියෙන්නේ කියලා. එතකකොට පිංවතුනි ඔබට තේරෙයි ඔබ මේ ඔබ ඔබේ ගතකරන කාලයට දෙන වටිනාකම හරිද කියලා. හරි නම් හරි. එහෙනම් ප්‍රශ්නයක් නෑ. ඒක හරිද නැද්ද කියලා තීරණය කරලා බලන්න තමයි අපි මේවා හොයලා මේ දේශනා වල, තථාගත දේශනා වල, ත්‍රිපිටකයේ තියෙන කරුණු ඇසුරින් ඔබට යමක් පෙන්නන්න බලන්නේ. බලන්න ඔබ කල්පනා කරලා බලන්න.

එක මදටිය ඇටයක් අරනගෙන පිංවතුනි ඔබ පැත්තකින් තියනවා..."මේ මෙගේ අම්මා". ඒ කියන්නේ අම්මා වෙනුවෙන් එක මදටිය ඇටයක් තිබ්බා. ඊටපස්සේ ගන්නවා තව මදටිය ඇටයක්. දැන් අර පලවෙනි එක පැත්තකින් තිබ්බා. ඊලග එක ගත්තා. තව එකක් අරගෙන ඔබ අර කලින් තිබ්බ එකට එහා පැත්තෙන් තියනවා. තියලා ඔබ හිතාගන්නවා "මේ තමයි මගේ අම්මාගේ අම්මා". ඒ කියන්නේ ආච්චි අම්මා. ඊටපස්සේ ඔබ තව එකක් ගන්නවා. තවත් එකක් අරන් දැන් මේ තුන්වෙනි මදටිය ඇටේ. කොච්චරකින්ද? හාරපන්සීයකින් විතර වගේ නේද? පිංවතුනි මේ ලෝකේ තියෙන ඔක්කොම මදටිය ඇට. ඒ කියන්නේ හිතාගන්නවත් බැරි තරම්. අනන්තයි කියලා කිව්වොත් හරිනේ? අනන්තෙට එකක් අඩුයි හරිනේ. එතකොට තවත් මදටිය ඇටයක් අරන් ඒක පැත්තකින් තියලා, අර එකයි දෙකයි පැත්තෙන්, එහාපැත්තෙන් තියලා කියනවා "මේ මගේ ආච්චි අම්මගේ අම්මා". ඔන්න දැන් අම්මා ,ආච්චි අම්මා, ආච්චි අම්මගේ අම්මා. ඕං ඔය පිළිවෙලට පිංවතුනි, දැන් ඔබට තේරෙනවා එක මදටිය ඇටේකට එක පරම්පරාවක් ඔබ ගනන් කරන්නේ නේ. පලවෙනි ඇටේට අම්මා, ඊලග දෙවනි ඇටේට ආච්චි අම්මා, ඒ කියන්නේ ඊට කලින් පරම්පරාව. ඊලගට තව ඇටයක් තිබ්බා. ආච්චි අම්මගේ අම්මා. ඒ කියන්නේ ඊට කලින් පරම්පරාව. ඔහොම තියාගෙන ගියාම දැන් ඔබෙ පරම්පරාවනෙ මේ ඒ ආපස්සට යන්නේ. ඒ කියන්නේ අම්මගේ පැත්තේ පරම්පරාව. පිංවතුනි බුදුහාමුදුරුවෝ දේශනා කරනවා "ඔබට යම් දවසක ඔය මදටිය ඇට ඔක්කොම ටික ඉවර වෙනකම් ඔබ ගනන් කරොත් මේ අම්මා, අම්මගේ අම්මා ,එයාගේ අම්මා ,එයාගේ අම්මා එයාගේ අම්මා ,ඒ අම්මගෙත් අම්මා ආදී වශයෙන් මේ මදටිය ඇට ඉවර වෙනකම් ඔහොම ගණන් කරගෙන ගියාත්, පිංවතුනි යම් දවසක් එයි නේද ඔය මදටිය ඇට ඉවර වෙන." කොච්චර කාලයක් ගණන් කරාට පස්සෙද?... අන්න හරි. එච්චර කාලයක් ගණන් කරාට පස්සේ ඒ මදටිය ඇට ටික ඉවර වෙයිනේ. බුදුහාමුදුරුවෝ දේශනා කරනවා පිංවතුනි , "ඔය මදටිය ඇට ඉවර උනාට ,මොකක් ගණන් කරලා ඉවර කරන්න බෑද?අර අම්මගේ අම්මලා තව තියෙනවා ගණන් කරන්න." හැබැයි මදටිය ඇට ඉවර වෙලා.ඒ කියන්නේ

පිංවතුනි ඔබේ පරම්පරා ගාන ගණන් කරලා ඉවර කරන්න බැහැ මදටිය ඇට වලින්.මේ ලෝකේ තියෙන ඔක්කෝම මදටිය ඇට එකතු කරගත්තත්.

දැන් පිංවතුන් පොඩ්ඩක් හිතලා බලන්න කොහොම කාලයක්ද මේ සසරේ ආවේ. දැන් ඔය හැම අත්භවයකදිම ඔබ මනුස්සයෙක්නේ. ඔය හැම අත්භවයකදිම පිංවතුනි ඔබ දෙවි කෙනෙක් නේද? සුගතියෙම නේද ඉපදුනේ. ඒකටත් තථාගතයන් වහන්සේ උත්තරයක් දෙනවනේ. ආනන්ද මේ නිය සිලට ගත්ත පස් ටික සමානයි සුගතියට ආපු ලෝක සත්ත්වයන් මැරිලා ගිහිල්ලා, ආපහු සැරයක් සුගතියේ උපදිනවා නම් උපදින තරම. මේ නියසිලට අහු නොවිච්ච මේ මහපොලවේ ඉතිරි වෙච්ච පස් කැට ටික සමානයි, වැලි කැට ටික සමානයි සුගතියකට ඉපදිලා මැරිලා ගිහිල්ලා ආපහු දුගතියකටම වැටෙන ලෝක සත්ත්වයන්ගේ ප්‍රටමාණයට.

එහෙනම් දැන් අර කලින් උපමාවයි මේ උපමාවයි දෙක එකට ගලපලා බලන්න පිංවතුනි ඔබ ඉපදිච්ච වාර ගාන සහ ඒ ඉපදිච්ච වාර ගානෙන් මනුස්සයෙක් උනේ ඒ කියන්නේ සුගති සත්ත්වයෙක් කියලා කියන්නේ අඩුම තරමේ මනුස්සයෙක් නේ. පල්ලහාම මට්ටම මනුස්සයා. ඒ කියන්නේ යාන්නතම් පිංවතුනි සතර අපායේ ගැට්ටේ දොරේ වැදිලා තියෙන්නේ. දොරේ වැදිලා නැවතිලා. තව පොඩ්ඩක් අඩියක් ඉස්සරහට ගියා නම් දොර ඇරිලා වැටෙනවා ඇතුලට. ඒ නිසා දොරේ ගැට්ටේ වැදිලා නැවතිලා තියෙන්නේ පිංවතුනි. සතර අපායේ කියන්නේ සතර අපායේ අල්ලපු ගෙදර සතර අපාය. ඕකනේ මට්ටම පිංවතුනි. එතකොට එහෙනම් හිතලා බලන්න උපමා දෙක ගලපගෙන අච්චර ගානක් පිංවතුනි මේ ලෝකේ ඉපදිලා තියෙනවානම් අනන්ත සංසාරේ, හැබැයි ඒ අතර මනුස්සයෙක් වෙච්ච අත්බැව් ගාන සුගතියේ ඉපදිච්ච අත්බැව් ගාන කොච්චර අඩුයිද කියලා. දැන් ඔය සුගතිය කියලා හිතුවම පිංවතුනි හැමෝම හිතාගන්නේ, සුගතියනං ඉතිං හොඳයි...නේ. පිංවතුනි. එහෙම ටක් ගාලා ඔබ රැවටෙන්න එපා. ඔය සුගතියේ උපදිනවා කියලා කිව්වේ නියසිලට ගත්ත පස් ටිකනේ. පිංවතුනි ඔය නියසිලට ගත්ත පස් ටිකේ කොටසක් වෙන් කරන්න ඕනේ පිංවතුනි අරූපාවචර බ්‍රහ්ම ලෝක වල ඉන්න පිරිසට. බ්‍රහ්ම ලෝක හතරක් තියෙනවා ඒවා අරූපයි. ඒ කියන්නේ? එතනට යන පිරිසට පිංවතුනි ඒ තැනින් ඉවත් වෙනකම්, ඒ තැනින් අයින් වෙනකම් කොච්චර කාලෙකට පස්සෙ ද... කල්ප මහා අති දැවැන්ත කාලෙකට පස්සේ. කල්ප දහස් ගණන් දසදහස් ගණන් වලට පස්සේ තමයි පිංවතුනි ඒ තැන් වලින් ලෝක සත්ත්වයා චුත වෙලා වෙනත් ලෝක වල උපදින්නේ. ඒ කියන්නේ අඩුම තරමේ රූපාවචර බ්‍රහ්ම ලෝකෙකට එන්නත් ඊට වඩා බොහෝ කලක් යනවා පිංවතුනි. ඒවා ඒකයි. මේ තිස් එක් ලෝක ධාතුවෙන් පිංවතුනි දෙකෙලවර බැලුවොත් එහෙම ආයුකාලය හිතාගන්න බැරි තරම් වැඩියි. ආයු කාලය අඩුම තැනක් තමයි පිංවතුනි මේ කාම ලෝකය කියලා කියන්නේ. දැන් ඔය ඔබ දන්නවනේ සමහර පුංචි සත්තු ඉන්නවා පිංවතුනි උන් ජීවත් වෙන්නේ දවසයි. දවසින් මැරෙනවා. ඉතින් මනුස්ස ලෝකෙත් ඉන්නවා දවසින් මැරෙන මිනිස්සු. මේ අතදරුවා පිංවතුනි ඉපදිලා දවසක් ඇතුලත මැරිලාත් ඉවරයි. අහරේ අම්මයි තාත්තයි නම් හොයනවා දරුවට දාන්න. දැං මැරිච්ච දරුවට තමයි නමක් දාන්නේ. එහෙම වෙන්න පුලුවන්. ඉතිං ඒවා එක්කෝ පින ඉවර වෙලා. එහෙම නැත්තම් කය කැඩිලා. කොහොමහරි මොකද මේ කාමලෝකේ පිංවතුනි, මේ මැද තියෙන කාමලෝක කොටසේ තමයි ආයුකාලය බොහෝම අඩු. ඒ

කියන්නේ ඔබට අපිට. ආයුකාලය බොහෝම අඩුයි. නමුත් තිස් එක් ලෝක ධාතුවේ දෙපැත්තට යනකොට ආයුකාලය ගොඩක් දිගයි.

ඉතිං එහෙනම් කෙනෙක්ට හිතෙන්න පුලුවන් සුගතියේ ගොඩක් දිග තැනට ගියානම් හරි කියලා. ඔව් හරි තමයි. නමුත් මගෙන් ඇහුවොත් නම් පිංවතුනි මම ඒකට සුගතිය කියන්නේ නෑ. ඒකට හේතුව අරූපාවචර බ්‍රහ්ම ලෝකෙක ගිහිල්ලා හිරවුනොත් එහෙම පිංවතුනි, හිරවුනොත් කියන්නේ මේ එතනින් එහාට සංසාරේ හැමදාම එතන ඉන්නවා කියන එක නෙමේ. හිරවුනොත් කියන්නේ මහා අති දීර්ඝ කාලයක්. දැන් මනුස්සයෙක් අවුරුදු අසූවකට, නැත්තම් අවුරුදු පනහකට පිංවතුනි හිරේ යනවා. අපි කියන්නේ නැද්ද හිර වුනා කියලා. මොකද අවුරුදු පනහක් කියලා කියන්නේ මනුස්සයෙක්ගේ ජීවිතෙන් හොද කාලයක්නේ. එහෙනම් හිතලා බලන්න සංසාරෙන් හොද කාලයක් තමයි පිංවතුනි අරූපාවචර බ්‍රහ්ම ලෝකෙක ගිහින් හිරවුනොත් එහෙම. අනික් එක හිරවුනා කියලා කියන හේතුව තමයි පිංවතුනි, ඔය තැනකට ගියාට පස්සේ කන් දෙකක් නැති නිසා කවදාවත් බුදු කෙනෙක්ගේ බනක් අහන්න වෙන්නේ නෑ. ඉතින් මට වැටහෙන පරිදි නම් පිංවතුනි බුදු කෙනෙක්ට හිතකට බණ කියන්න බෑ එතනදි. මොකද මතක ඇතිනේ බුදු හාමුදුරුවෝ මුලින්ම බණ කියන්න හෙව්වේ තමන්ගේ ගිහි කල ගුරුවරු දෙදෙනාට. ඉතිං ඒ දෙදෙනම ඒ වෙනකොට හිටියේ අරූපේ. අසිත තාපසයා නම් තැබීමේ උත්සවයට ඇවිල්ලා පුංචි කුමාරයට නමක් තියලා ඉවර වෙලා සතුටෙන් සිනහා වෙලා ඊටපස්සේ කදුලක් හෙලනවා. අහල බැලින්නම් මට යන්න වෙන්නේ අරූපෙට. අරූපෙට ගියාට පස්සෙ... මොකද එතනින් එහාට එයා යන්න තැනක් එයා දන්නෙ නෑ පිංවතුනි. එතනින් එහාට දෙයක් කරගන්න එයා දන්නේ නෑ. කරගන්න නම් මේ ඉපදිච්ච පුංචි කුමාරයා බුදු වෙනකම් ඉන්න ඕනේ.නමුත් මගේ ආයු කාලය එච්චර නෑ. මොකද මං කාම ලෝකේ ඉන්නේ. මේ මනුස්ස ලෝකේ. එහෙනම් මැරුනට පස්සේ ගිහිල්ලා උපදින්නේ අරූපේ. අරූපෙට ගියාට පස්සේ බුදුවරු එක්කෙනෙක් නෙමෙයි පිංවතුනි බුදුවරු කෝටියක් පහල වුනත් පිංවතුනි ඒ එක බුදු කෙනෙක්ටවත් පිංවතුනි දහම දෙන්න බෑ. මොකද දහම දෙන්න පුලුවන් කනට විතරයි. කනෙන් විතරයි පිංවතුනි කෙනෙක් සෝතාපන්න ඵලයේ පිහිටවන්න පුලුවන්.

දැං මම මේ ඔබට කතාකරන්නේ ඔබට හිතලා බලන්න යමක්. ඔබ මේ ගත කරන පැය දෙක එකහමාර ඔබ මේ ගතකරන පැය කීපය තුල කොයි වගේ කාලයක්ද කියලා ඔබ හිතලා බලන්න. ඔබ ඒක ගැන හිතලා බැලුවම පිංවතුනි ඔබට හිතෙයි, මේ කාලය ගැන ඇයි ඔබට මම දේශනාව පටන් ගන්න කලින් මතක් කරන්කෙ කියලා. ෆෝන් පැත්තකින් තියන්න. දේශනාව අහන ගමන් මොබයිල් ෆෝන් එක අතට අරන් පිංවතුනි ඒකේ ෆේස්බුක් එක දාගන්න එපා. දැං මම දන්නවා කොච්චර කිව්වත් කරන පිරිසක් ඉන්නවා. සමහරවිට මේක අහ අහත් කරනවා ඇති.

වැඬේ මේකයි. මගේ යුතුකම ඔබට කියන එක. ඔබේ යුතුකම ඔබ වෙනුවෙන් ඒක කරන එක. ඒක නෙමේද ඇත්ත?... මගේ යුතුකම ඔබට කියන එක. ඔබේ යුතුකම, මම වෙනුවෙන් ද? එහෙනම්... අල්ලපු ගෙදර මනුස්සයා වෙනුවෙන් ද?...එහෙනම්...ඔබට උගන්නපු ගුරුවරු වෙනුවෙන් ද? මේ අපි වෙනුවෙන් ද? නෑ පිංවතුනි. ඔබේ යුතුකම ඔබ වෙනුවෙන් ඒක කරන එක. නැත්තම් සමහරවිට මේ දේශනාව ඔබ දානවා යූටියුබ් එකේ, කම්පියුටර් එකේ. ඒක යනවා එක ටැබ් එහෙක.

අනික් ටැබ් එකේ ඔබ ඔබේ වැඩක්. අනිත් ටැබ් එකේ සමහර විට ගේම් එකක් ගහනවා ඇති. මේකත් යනවා පැත්තකින්. මේක පොඩ්ඩක් දාලා අරක මියුට් කරගෙන ගේම් එක ගහනවද දන්නෙත් නෑ. අපි හිතනවා එහෙම නැතුව ඇති කියලා. නමුත් ඒක වෙන්න බැරිත් නැති නිසයි මම මේ කියන්නේ.

දැං මම මේ කියන්නේ ඔබ ඩ්‍රයිව් කරන ගමන් මේක අහනවා. ඒ වෙලාව විතරයි ඔබට තියෙන්නේ. වෙන වෙලාවක් ඔබ ට නෑ. නැත්තම් ඔබ රාජකාරිය කරන ගමන් කාත් එක්කවත් ඔබට කතා කරන්න නැත්තම් ඔබ කනේ ගහගෙන මේක අහනවා. ඒ ගමන් තමයි ඔබ වැඩේ කරකගන්නේ. පිංවතුනි ඒක ගැන නෙමෙයි මේ කියන්නේ. ඒ මට පේන්නේ ඔබට ලොකු උනන්දුවක් තියෙනවා. ඉස්සර කරේ මොකක්ද? වැඩ කරන ගමන් මොනවද ඇහුවේ බණද? සිංදු ඇහුවනේ. සිංදු ඇහුවා, බයිලා ඇහුවා, රැප් ඇහුවා, එක එක දේවල් කරන්න ඇති පිංවතුනි. ජෝක් කතා ඇහුවා ඇති. එක එක ඒවා කරා. හරි... නමුත් දැං ඔබ වැඩ කරන ගමන් බණ අහනවා පිංවතුනි. මට නම් පේන්නේ ඔබ පුදුම උනන්දුවක් තියෙන පිරිසක් විදියට එහෙම බැලුවාම. එහෙම කරන පිරිස්. කරන්නම දෙයක් නෑ මට බණ අහන්න හම්බෙන්නේ මම ඩ්‍රයිව් කරන වෙලාවේ විතරයි. ඒ වෙලාවේ තමයි මේ බණ ටික අහං යන්නේ. ඒ නිසා ඔබ බණ එක කනේ ගහගෙන ඩ්‍රයිව් කරගෙන යනවා. නැත්තම් කනේ ගහනවට වඩා සමහර වෙලාවට පොඩි ප්‍රශ්න තියෙනවනේ. වාහනයක් එහායින් ආවොත් සද්දේ ඇහෙන්නේ නෑ. ඒ නිසා වඩා හොඳයි රේඩියෝ එකේ දාගෙන අහගෙන යනවා. ශබ්දය අඩුකරගෙන යම් මට්ටමකට. එතකොට වටේ පිටේ සද්ද ඔබට ඇහෙන නිසා. හරි... මට ඒකෙන් තේරෙන්නේ ඔබට තියෙන උනන්දුව හා ඕනකම මේක කරගන්න.

හැබැයි තව කෙනෙක් ඉන්නවා වෙන්න පුලුවන් පිංවතුනි, මම විශ්වාස කරනවා එහෙම නැතුව ඇති කියලා...නමුත් ඔබනේ දන්නේ ඔබ ගැන. මේ එන්නේ පිංවතුනි මොනාහරි ඔබේ පිනට එන්න ඕන ටික. ඉතිං ඒ නිසා කියලා දානවා. ඔබ ගැලපෙනවා නම් ගන්න. සමහර කෙනෙක් ඉන්නවා ඇති පිංවතුනි. මේ පැත්තේ දේශනාව එක ටැබ් එකක්, අනික් පැත්තේ ෆේස්බුක්. නැත්තම් ෆෝන් එකේ ෆේස්බුක්. අරහේ දේශනාව යනවා. දැන් බලන්න, ඔබ ඔය ගතකරන පැය දෙකට දෙන ලංසුව මොකක්ද කියල. ඒ කියන්නේ පිංවතුනි ඔබ කොච්චර අමාරුවෙන්ද ඔය පැය දෙක ගත්තේ? පොඩ්ඩක් කල්පනා කරලා බලන්න. මම ඔබට මෙහෙම පොඩි උපමාවක් දෙන්නම්.

දැන් මිනිස්සු රට යනවා නේද? සමහර මිනිස්සු ඕස්ට්‍රේලියා, කැනඩා.., අපි හිතමු මේ ලෝකයේ යන්න තියෙන අමාරුම රට තියෙනවා කියලා. ඒ කියන්නේ ඒ රටට යන්න වීසා ගන්න හරි අමාරුයි. ඔස්ට්‍රේලියාව කියලා හිතමුකෝ. ඒ රටට වීසා ගන්න හරි අමාරුයි. නමුත් ඔබ කොහොම හරි කරලා පිංවතුනි, එක එක්කෙනා පස්සේ ගිහිල්ලා ෆෝම් 500ක් විතර පුරවලා අතේ තියෙන සතේ වියදම් කරලා, ඉඩමකුත් උකස් කරලා, ඔබ කොහොම හරි සල්ලි ටිකක් හොයාගෙන ඊට පස්සේ ඒ සල්ලි වියදම් කරලා ඔබ යනවා. දැන් කොහොම හරි වීසා එකත් හම්බුනා. දැන් ඔය වීසා එක හම්බුනා ඔබට, අපි හිතමු සතියකට වීසා එක හම්බුනා කියලා ඔබට. සතියකට සති දෙකකට වීසා එක හම්බුනා ඔබට. දැන් ඔය සතියකට හම්බවෙච්ච වීසා එක පිංවතුනි ඔබ ඒ රටට ගියාට පස්සේ, මට ඔබ කියන්න ඔබ ප්ලෑන් එකක් හදාගෙන නෙමේද යන්නේ. සතියක් දැන් ඔබ ඒ රටේ ඉන්න හම්බෙනවා හරිද? ගොඩාක් මහන්සි වෙලා

තමා ඔබ ඒ වීසා එක ගත්තේ. ඔබ ඒ රටට ගියාට පස්සේ පිංවතුනි ඔබ ප්ලෑන් එකක් හදාගෙන නෙමේද යන්නේ? ඇත්තටම ඔබ යන්න කලින්, එක්කෝ එහෙ ඉන්න කෙනෙක්ව සම්බන්ධ කරගෙන අහලා බලනවා, මේ අපි සතියකට එනවා. ඔයා පොඩ්ඩක් අපිව ඔය හොඳ තැන් කීපයකට අරන් යනවා නේද? ඒ රටේ බලන්න තියෙන තැන් එහෙම , ඒ ඒ නරඹන්න තියෙන ලස්සන ලස්සන තැන් එහෙම තියෙනවා නම් අපිව ඒ තැන් වලට අරන් යන්න. එහෙම නැත්තම් ඔබ එහේ ගියපු ගමන් පිංවතුනි හොයලා බලනවා. නැත්තම් ඔබ යන්න කලින් ඉන්ටර්නෙට් එකේ හරි ඔබ හොයලා බලනවා. එහෙම කරනවා මිසක් ඔබ ඒ රටට ගිහිල්ලා, දැන් ඕස්ට්‍රේලියාවට ගියා. ඕස්ට්‍රේලියාවට ගිහිල්ලා අපි හිතමු ඔබ ඉන්නවා කියලා කුලියට ගත්ත කාමරයක, ඒ කාමරේ ඉඳගෙන, ඔබ,.. ඒ කාමරේ එහා පැත්තෙන් තියනවා පිංවතුනි පොඩි පාර්ක් එකක්. මිනිස්සු ඇවිත් සෙල්ලම් කරනවා, ළමයි ඇවිල්ලා සෙල්ලම් කරනවා. මිනිස්සු බල්ලෝ ඇවිද්දවනවා පාර්ක් එකේ. ඉතින් ඔබ ඔය සතිය ගතකරන්නේ අර කාමරේ ඉන්නවා, පාක් එකට යනවා, ආයේ කාමරේට එනවා, ආයේ පාක් එකට යනවා, ආයේ කාමරේට එනවා කනවා, බොනවා, පාක් එකට යනවා. පිංවතුනි එහෙමද ඔබ සතිය ගතකරන්නේ? එහෙම නැත්තම් මහන්සි වෙලා ගත්ත මේ චාන්ස් එකෙන් උපරිම ප්‍රයෝජනය ගන්න නෙමේද ඔබ උත්සහ ගන්නේ? පිටරට ගියපු අයට එහෙම මෙහෙම අත්දැකීම් ඇති.

අපිට මතකයි අපි එහෙම කරපු හැටි. සමහර විට පිංවතුනි, දවස් දෙකේ ලෝනග් වීකෙන්ඩ් එකක් ආවාම දවස් දෙකක නැත්තම් තුනක ට්‍රිවප් එක ප්ලෑන් කරනවා සති තුනක් විතර. ඉතින් සමහර වෙලාවට ඒ වීකෙන්ඩ් එකේ වෙන වැඩක් යෙදිලා යන්න හම්බෙන්නෙත් නෑ. එතකොට අර සති දෙකම අපරාදේ. නමුත් ඕනතරම් වෙලා තියෙනවා දවස් දෙක තුනේ long weekends එක යන්න සති දෙකක් තිස්සේ සමහරවිට නිදි මරාගෙන ප්ලෑන් කරනවා. ඇයි හොටෙල්ස් මොනවද කියලා බලනවා. ඒවගේ attractions මොනවද කියලා බලනවා. ඒවා මෙනවාහරි බලන්න තියෙන දේවල් කන්න තියෙන තැන් යන්න තියෙන තැන් ඔය ඔක්කොම බලනවා පිංවතුනි. බලලා ප්ලෑන් එකක් හදාගෙන, ඔක්කොම ගානට ප්ලෑන් කරනවා. මේ වෙලාවට තමයි මෙතෙන්ට යන්නේ. ඊට පස්සේ එතනින් අයින් වෙලා ගිහින් කෑම කන්න යනවා මෙන්න මේ හෝටලේට. ඒ හෝටලේ ඉවර වෙලා ඊටපස්සේ ආයේ මෙන්න මෙතන්ට යනවා. ඊටපස්සේ ආයේ මේ රෙස්ටුරන්ට් එකට යනවා තේ බොන්න.

එහෙම තමා ප්ලෑන් කලේ. ජීවිතේ ගොඩක් දේවල් ඒ වගේ තමා ප්ලෑන් කලේ. සමහර විට ඒ නිසා වෙන්න ඇති අදටත් ගොඩක් දේවල් ඉගෙන ගෙන ඒ තුලින් අද නිවන් මගට ඒවා පාවිච්චි කරන්නේ. නමුත් මම කියාගෙන ආව කාරනාව ඒක නෙමේනේ පිංවතුනි.

මම කියාගෙන ආව කාරනාව ගොඩක් අමාරුවෙන් ගත්ත දෙයක් නාස්ති නොකර පාවිච්චි කරන එක ගැන.... දැං ඔබ මහන්සි වෙලා සල්ලි හම්බකරාට පස්සේ කොහොමද ඔබ ඒක පාවිච්චි කරන්නෙ? ඔබ මහන්සි වෙලා සල්ලි හම්බකරානම් ,හැමෝම මහන්සි වෙලා තමයි, නමුත් කෙනෙක් ඉන්නවා පිංවතුනි එයා ගොඩාක් කායිකව මහන්සි වෙනවා පිංවතුනි සල්ලි හම්බ කරන්න. එහෙම නැත්තම් අපි හිතමු අවුරුද්දේ අන්තිමට එයාට හම්බෙනවා දීමනාවක් මෙකක් හරි. දැං ඒක එයා දන්නවා

අවුරුද්ද පුරාවටම එයා වෙලාවට වැඩට ගිහිල්ලා, අසනීප ගානේ වුනත් ගෙදර ඉන්නේ නෑ, නිවාඩු දාන්නේ නෑ වැඩට ගිහිල්ලා සමහර විට මගුල් ගෙවල් වලට පවා ලගම ඥාතියොන්ගේ යන්නේ නෑ. මොකද ගියොත් එහෙම අවුරුද්දේ අන්තිමට එයාගේ දීමනාව අඩු වෙනවා.බෝනස් එක අඩු වෙනවා. ඒ නිසා ඒ හැම කැපකිරීමක්ම කරලා අන්තිමට හම්බවෙනවා ඒ ගාන. දැං ඕක පිංවතුනි ඔහේ නිස්කාරනේ නාස්ති කරනවද? නැත්තම් පිංවතුනි ඒකේ හැම සතයක්ම ඔබ බොහොම පරිස්සමින් පාවිච්චි කරනවද?

දැං ඔබට එහෙනම් තේරෙනවනේ පිංවතුනි ඒ කියපු උපමාව හරහා ඔබට තේරෙනවා යම් කාරණාවක්. දැං ඔබට මම කියන්නේ මේ දේශනාව අහන්න. මේ දේශනාව විතරක් නෙමේ ඔබ කොයි දේශනාව ඇහුවත් පිංවතුනි, දේශනාවක් කියලා කියන්නේ පිංවතුනි, ඔබේ ජීවිතයේ ඔය පැය දෙක ගත කරන්න පුලුවන්, ආයෝජනය කරන්න පුලුවන් හොදම බැංකුව. ඔබේ කාලය නමැති මුදල් ආයෝජනය කරන්න පුලුවන් හොදම බැංකුව පිංවතුනි, සම්බුද්ධ ශාසනය. එහෙම නැත්තම් මේ දේශනාවක් අහන වෙලාව.

දේශනාවක් අහන වෙලාවේ පිංවතුනි සප්ත සම්බොජ්ජංග ධර්ම සමව වැඩෙනවා.ආන් ඒ නිසාමයි පිංවතුනි සෝතාපන්න වෙන වෙලාවේ කෙනෙක් පෘතග්ජන බාවයේ ඉදන් හිතක් පෘතග්ජනභාවයේ ඉදන් සෝතාපන්නභාවයට Switch වෙන්නේ. මොකද සප්ත සම්බොජ්ජංග ධර්ම ඔක්කොම පිංවතුනි ඒ වෙලාවට වැඩෙන්ඩ ඕනා. අනික් මාර්ග පල වලටත් එහෙම තමයි. එතකොට පිංවතුනි ඔබට හොදාකාරවම තේරෙනවා බනක් අහන වේලාවක සප්ත සම්බොජ්ජංග ධර්ම එකට වැඩෙනවා කියලා හොද සාක්ශියක් තමයි බනක් අහන වෙලාවක තමයි කෙනෙක් පෘතග්ජන බවයෙන් අත්මිදිලා පලවෙනි වරට ආර්ය භූමියට අඩිය තියන්නේ. ඉතින් ඒක සිද්ද වෙනවා නම් මොකද, කෙනෙක්ට මාර්ගපල අවබෝධ වෙනවානම් ඒ පල ලබන මොහොතේ පිංවතුනි ඊට මොහොතකට කලින් සප්ත සම්බොජ්ජංග ධර්මම වැඩිලා තියෙන්ඩ ඕනා. ඒ මට්ටමට වැඩිලා තියෙන්ඩ ඕනා. අරිහත් පල සාක්ශාත් කරන්න යන ගමනෙත් එහෙමයි. මොකද එතනින් එහාට එක එක මට්ටම් වලට මේක වඩාගෙන යන්නේ. එතකොට ඔක්කම ටික එක මට්ටමකට වැඩුනට පස්සේ අන්න එතන ඵලය සාක්ශාත් වෙනවා. දේශනාවක් අහන වෙලාවක විතරක් නම් කෙනෙක් සෝතාපන්න ඵලය සාක්ශාත් වෙන්නේ, එහෙනම් ඔබට හොද සාක්ශියක් පිංවතුනි ඒක. දේශනාව අහන වෙලාවක ඒ සම්බොජ්ජංග දර්ම සියල්ලම වැඩෙන බවට, මොකද ඒ වෙලාවක පමණයි සෝතාපන්න ඵලය පිහිටන්නේ. ඒ කියන්නෙ පිංවතුනි ඔබට මේ ලබා ගන්න පුලුවන් වටිනාම දේ තමයි ඔබට සමහරවිට නොමිලෙ ලැබෙන්නේ. අද නම් ඔබ ගෙදර ඉදන් අහන් ඉන්න නිසා ඉන්ටනෙට් එකට ටිකක් වියදම් කරන්ඩ ඕනා ඇති. එහෙමනේ සමහරවිට ඩේටා කාඩ් එකක් හරි මොකක් හරි ඔබ යම් ක්‍ර්මවේදෙකින් වියදම් කරන්න ඕනා ඇති. ඒක ඔබ අමතක කරන්ඩ හොද නෑ. මේ දේශනාව ඔබට අන්තර්ජාලය හරහා ගෙන්නත් තව ලොකු පිරිසක් පින්වතුනි වියදම් කරනවා. ඒ වෙනුවෙන් ලොකු වෙහෙසක් දරනවා. අපි හිතමු වෙහෙස දරන්නේ දේශනව කරන්ඩ, දේශනව රෙකොඩ් කරන්ඩ, එඩිට් කරන්ඩ ඒ ටික කරන්ඩ කියලා, නමුත් මේ හැම දෙයක්ම කරන්නේ පින්වතුනි, ගෙදර ඉදන් අරන් ආපු බුදලයකට නෙමෙනේ. මේ දේශනාව රෙකෝඩ් වෙන කැමරා එක ,මේ දේශනව රෙකෝඩ් වෙන කම්පියුටර් එක,මේ දේශනවා එඩිට් කරන්ඩ ඕනා නම් ඒ කම්පියුටර් එක ,ඊට පස්සේ

ඒක ඉන්ටනෙට් එකට දාන්ඩ අවශ්‍ය කරන ඒ හැම දෙයක්ම පිංවතුනි ඔබ වගේම කවුරු හෝ කෙනෙක් දාඩිය මහන්සියෙන් හම්බ කරලා ඒකේ පලවෙනි කොටස සම්බුද්ධ ශාසනය වෙනුවෙන් පූජා කරා. ආන් ඒකෙන් තමයි පිංවතුනි මේ කියන හැම දෙයක්ම මෙතන පහල වෙලා තියෙන්නේ.

මන් නම් පිංවතුනි එනකොට මේ එකක් වත් අරන් ආවේ නෑ. මේ ඔක්කොම පිංවතුනි ඔබ වගේම පිරිසක්, ඒ කියන්නේ ඔබ වෙනුවෙන් පිංවතුනි කෙනෙක් දානයක් දීලා. එහෙනම් හිතලා බලන්ඩ පිංවතුනි ඔබේ පුන්‍ය ශක්තිය, අවශ්‍ය නැද්ද මේ දේශනව ඇහෙන්ඩ. එතකොට ඔබේ පුන්‍ය ශක්තියෙන් කොටසක් වැයවෙනවා නේද ඔබට මේ දේශනවේ වචන ටික කනට ඇහෙන වෙලාවේ...හිතලා බලන්ඩ.

දැන් ඔබ හොඳටම දන්නවා නේද පිංවතුනි මේ ලෝකේ විපාක වලින් කියලා මේ හැම දෙයක්ම සිද්ද වෙන්නේ. දැන් අපි තව ඉස්සරහට යද්දි කතා කරගෙන යමු. පොටක් පැදීගෙන ආව වෙලාවේ පොඩ්ඩක් කතා කරමු අපි. මේ ලෝකේ හැමදෙයක්ම විපාක වලට සිද්ද වෙන්නේ. කර්මයකින් කරන්නේ පිංවතුනි, දුක හදන එක විතරයි. මොකද කර්ම වෙන්න නම් අවිද්‍යාව තියෙන්න ඕනා. අවිද්‍යාව තෘෂ්ණාවයි තියෙන තැන තමයි පිංවතුනි කර්ම කියන එක හැදෙන්නේ. එතකොට ඒ කර්මයකින් පිංවතුනි හදන්නේ දුකක්. කර්මයකින් හදන්නේ දුකක්. එහෙනම් දුක නැත්තේ විපාක වල. එතකොට කනට ශබ්දයක් ඇහෙන එකෙ දුකක් නෑ. කනට ශබ්දයක් ඇහුනා කියලා දුකක් හට ගන්නේ නෑ. මොකද දුකක් හටගන්ඩ එතන හේතු නැනේ. දුක කියලා කියන්නේ හේතුවක ඵලයක් නම් දුක කියන ඵලයට හේතුව තමයි තෘෂ්ණාව. ඒත තමයි දුක්ඛ සමුදය තථාගතයානන් දේශනා කලේ. තන්හාව තමයි දුකට හේතුව. තන්හාව නිරුද්ධ කරාම දුක නිරුද්ධ වෙනවා. තන්හාව හට ගන්නේ පිංවතුනි, ප්‍රිය මදුර ස්වභාවය දැනෙන පරිසරයක.

**යං ලෝකේ පිය රූපං සාත රූපං එත් තේසං උප්පජ්ජමානා උප්පජ්ජති.**

දැක්කානේ. ප්‍රියයි මදුරයි කියලා දැනෙනවා නම් අන්න එතන තමයි තණ්හාව උපදින්නේ. ප්‍රිය මධුර ස්වභාවය දැනෙන්න නම් ඒ දැනෙන්නේ අවිද්‍යාව තියෙන තැන. එහෙනම් අවිද්‍යාව තිබ්බොත් පිංවතුනි හිතකට ප්‍රිය මදුර ස්වභාවය දැනෙන්වා. ප්‍රිය මදුර ස්වභාවය දැනුනොත් ඒ හිතේ තණ්හාව හට ගන්නවා. තන්හාව හට ගත්තොත් ඒකාන්තයෙන්ම මොකක් හටගන්නවාද?....ඒකාන්තයෙන්ම දුක හට ගන්නවා.

දැන් මන් අහන්නේ ශබ්දයක් ඇහෙන්ඩ ඔය ටික ඕනා ද? ඔය කියන process එක සිද්ද වෙනවා නම් ශබ්දයක් ඇහෙනවා ද?. අපි කොහොමද දන්නේ ඔය කියන process එක ශබ්දයක් ඇහෙන්ඩ සම්බන්දයක් නෑ කියලා. මොකක්ද අපිට තියෙන ප්‍රධානම සාක්ශියක්. "ආනන්ද පොඩ්ඩක් මෙහෙට වැඩියා නම්" කව්ද ඔය කියන්නේ?... තථාගතයන් වහන්සේ. කාටද කථා කලේ?... ආනන්ද හාමුදුරුවන් වහන්සේ ට. ආනන්ද හාමුදුරුවන් වහන්සේට ඇහුනා නේද ඒ කියපු දේ... ආනන්ද හාමුදුරුවෝ නං බුදුහාමුදුරුවන්ගේ පරිණිර්වාණයෙන් පස්සෙනේ අරිහත් උනේ. ඒ නිසා අපි ආනන්ද හාමුදුරුවන් වහන්සේව පොඩ්ඩක් පැත්තකින් තියමුකෝ.

එහෙනම් සාරිපුත්ත රහතුන් වහන්සේට බුදු හාමුදුරු කතා කරනවා "සාරිපුත්ත මෙහාට පොඩ්ඩක් වඩින්න" එතකොට සාරිපුත්තයන් වහන්සේට ශබ්ද ඇහෙනවා. සාරි

පුත්තයන් වහන්සේලා අරිහත් වෙලා. පිංවතුනි අරිහත් වෙච්ච් හිතක දුක නෑ නේද? ඒ නිසා නේ එකට අරිහත් හිතක් කියන්නේ. දුක නැති නිසා නේ. සම්පූර්ණයෙන්ම දුක මුලින් වූ මුලිනුපුටා දමපු නිසා සහමුලින්ම දුක දුක නැති කර ගත්තු නිසා ඒ හිත්ට අරිහත් කියලා කියන්නේ. සසරේ සැරි සැරි සරන්නේ නැති හිතක්. දුක නැති හිතක්. පීඩාවක් අංශු මාත්‍රයක්වත් තරම් නෑ පින්වතුනි. එහෙනම් දුක නැති වෙන්න නං මොකක් නැති වෙන්න ඕනෙද? මොකද දුක කියලා කියන්නේ ඵලයක්. දුක නැති වෙන්න නම් මොකක් නැති වෙන්නේ ඕනෙ ද? තණ්හාව නැති වෙන්න ඕනේ දුකට හේතුව නැති වෙන්න ඕනේ. දුකට හේතුව නැති වෙන්න නම් ඒ කියන්නේ තණ්හාව නැති වෙන්න නං මොකක් නැති වෙන්න ඕනෙද ? ප්‍රිය මධුර ස්වභාවය නැති වෙන්න ඕන. ප්‍රිය මධුර ස්වභාවය නැති වෙන්න නම් එහෙම හිතක ප්‍රිය මධුර ස්වභාවයක් දැනෙන් නැති වෙන්න නං ඒ හිත මොන පරිසරයේ ඉපදිච්ච නැති හිතක් වෙන්න ඕනෙද? ඒ කියන්නේ ඒ හිත හටගත්ත පරිසරයේ මොකක් නැති වෙන්න ඕනෙද? අවිද්‍යාව නැති වෙන්න ඕන. එහෙනම් අවිද්‍යාව නැති හිතකක තමයි පින්වතුනි තථාගතයන් වහන්සේ සාරිපුත්තයන් වහන්සේට කතා කරද්දී සාරිපුත්තයන් වහන්සේට අවිද්‍යාව නැති හිතකින් තමයි ඒක ඇහුනේ. ඒ කියන්නේ අවිද්‍යාවෙන් පින්වතුනි අනුශය මට්ටමකින් වත් නැති හිතක් ඒක. එහෙනම් ශබ්දයක් ඇහෙන්න අවිද්‍යාව ඕනෙ වෙන්නෙ නෑ. ප්‍රිය මධුර ස්වභාවය ඕනෙ නැහැ. තණ්හාව ඕනෙ නැහැ. එහෙනම් කර්මය ඕනෙ නැහැ. දුක ඕනෙ නැහැ. ඒ කියන්නේ කර්මය කියන්නේ පිංවතුනි දුක හදන වැඩ පිළිවෙළක්.

**එතකොට එහෙනම් කනකට ශබ්දයක් ඇහෙනවා කියලා කියන්නේ කර්මයක් නෙමේනෙ. කර්මයක් නෙමේ නම් එහෙනම් ඒක විපාකයක්. ක්‍රියා කියලා කොටසක් තියෙනව අපි ඒවා පස්සේ කතා කරමු පිංවතුනි. ඔක්කොම ඒකට පටලවාගන්නේ නැතුව. මොකද ක්‍රියා සිද්ද වෙන්නේ අරිහතුන් වහන්සේලටට. අපි ඒ ගැන කතා නොකර...මොකද අපි දැං මේ...අපිට... ඔබට... මට... සිද්ද වෙන දේ ගැන පින්වතුනි අපි කතා කරන්නේ. එහෙනම් කනට ශබ්දයක් ඇහෙවගනවා කියලා එන්නේ විපාක කොටසක්. එහෙනම් ඔය කනට ශබ්දයක් ඇහෙන්න අවිද්‍යාවක් ඕන් නෑ. එහෙනම් ඒක විපාකයක්. එහෙනෙම් දැන් ඔබ දන්නවා නේද පිංවතුනි, මේ දේශනව ඔබට ඇහෙන්නේ විපාකයකින් කියලා. මොකද කනට ශබ්දයක්නේ මේ ඇහෙන්නේ. මේ දේශනාව නැත්නම්, මේ හඬ, නැත්නම් මෙම ශබ්දය ඔබේ කනේ වැදුනට පස්සේ, ඒ වැදෙනවා කියන එකත් සිද්ද වෙන්නේ පින්වතුනි විපාකෙට. මොකද මේ ශබ්දයත් විපාකයක්. ඔබේ කන, ඒ කනත් විපාකයක්. පූරුවේ කරන ලද කර්මයක විපාකයක්. එතකොට කනයි ශබ්දයයි එකට ගැටෙන්නේ ඒත් විපාකෙට. කනයි ශබ්දයයි එකට ගැටුනට පස්සෙ හිතක් උපදිනවා. අපි ඒකට කියනවා මොන විඤ්ඤානය කියල ද ?.. සෝත විඤ්ඤානය කියල. එතකොට ඒ සෝත විඤ්ඤානය උපදින්නේ එහෙම නැත්නම් උදාවෙන්නේ පිංවතුනි විපාක ශක්තියෙන්. එහෙනම් එතකොට ඒ සෝත විඤ්ඤානය උපදින, එහෙම නැත්නම් විපාක ශක්තියෙන් උපදින සෝත විඤ්ඤානය ඒ කියන්නේ හටගත් කන පිලිබද හිත, කනට සම්බන්ද වෙච්ච හිත, එතන හිත හට ගත්තා, ඊට්පස්සේ ශබ්දයක් අහුනා. දැන් ඒ ශබ්දය පිංවතුනි තනිකර ඔබට තේරෙනවා නේද විපාක සංසිද්දියක් මෙතන යන්නේ කියලා. ඒ කියන්නෙ පින්වතුනි ඔබේ විපාක**

**බැලන්ස් එකෙන් නේද මේක දැන් අඩු වුනෙ.** එහෙනම් මේ සසරේ කවදා හෝ දවසක කරගත්ත කර්මයක විපාකයක් තමයි දැන් මේ පලදීලා තියෙන්නේ. මට කියන්න පිංවතුනි කෙනෙක්ට අතිදුර්ලභ වු තථාගත දේශනාවක් අහන්න හම්බෙන්නේ සසරේ කරගත්ත මහා පව්කාරකමකට නේද? තථාගත දේශනාවක්, බුදු දහමක්, බුද්ධ දේශනාවක් අහන්න හම්බෙන්නේ සසරේ කරගත්ත මහා අති දැවැන්ත පව්කාරකමකට නේද? නෑ. සසරේ කරගත්ත මහා පුණ්‍ය කර්මයක් නිසා. එහෙනම් පිංවතුනි දැන් ඔබට මේ වෙලාවේ කිසියම් ශබ්දයක් ඇහෙනවා නම් පිනක විපාකයක් නෙමේද ගෙවෙන්නේ? ඒ කියන්නේ පිංවතුනි ඔබ කරගත්ත පිංවල විපාක නෙමේද මේ ගෙවෙන්නේ?

පිංවතුනි ඔබ ඔබට ගෙයක් හදාගෙන ඇති. ඔබ ගෙදරක ජීවත් වෙනවා ඇති. ඒ ගෙදර පිංවතුනි ඔබට අද හම්බෙලා තියෙන්නේ, ඔබේ මහන්සියෙන් තමයි වෙන්න ඇති. නමුත් පිංවතුනි ඒක අද ඔය ඔතන පහල වෙලා තියෙන්නේ ඔබේ විපාකෙට. කරගත්ත පිනක විපාකෙට. මට කියන්න පිංවතුනි ඒ පිනද වැඩි, මේ දේශනාව ඔබේ කනට වදින කොට, ඒ වැදිලා ඒක ඔබට ඇහෙන්න ඕක වෙනුවෙන් ඔබ කරගත්ත පිනද වැඩි? ඔබට කොහොමද හිතෙන්නේ?

අද දවල් පිංවතුනි ඔබ කෑම කන්න ඇති. කෑම කෑවා. අද උදේ, උදේ කෑම කෑවා. රෑ ,රෑ කෑම කෑවා. කන්න කෑම තිබ්බ එක පිංවතුනි මොකේ විපාකයක්ද? ඒ කෑමක් හම්බෙන්න ඔබ කරගත්ත පුණ්‍යකර්මයේ පුණ්‍ය ශක්තියද වැඩි? එහෙම නැත්තම් පිංවතුනි මේ වෙලාවේ යන බණ පදේ කනට ඇහෙන්න යන පුණ්‍යකර්මයේ පුණ්‍ය ශක්තියද වැඩි? ඔබ හැමෝම ඔහොම ලස්සනට ඇඳගෙන පැලඳගෙන ඉන්නවා ඇති. ඇඳුමක් පැලඳුමක් හම්බෙන්නේ පිංවතුනි පිනක විපාකෙට. ඒ පිනේ විපාකෙද වැඩි නැත්තම් මේ දේශනාව අහන්න කරගත්ත පිනේ විපාකෙද වැඩි?

එහෙමනම් හිතලා බලන්න. පින්වතුනි... හොඳට තේරුම් ගන්න මම මේ කියන කාරණාව. මොකද ඉතාමත් වැදගත් දෙයක් මේ ඔබට කියන්නේ. ඔබ මේ ආයෝජනය කරන්නේ ඔබට තියෙන ලොකුම සම්පත. ඒ වගේම ඔබ මේ ආයෝජනය කරන්නේ පින්වතුනේ, ආයෝජනය කරාම උපරිම ප්‍රතිලාභ ලැබෙන තැන. හැබැයි ඒ වගේම මේ දේශනාව ඇහෙන වෙලාවේ පින්වතුනේ ඔබේ පින් ගත වෙනවා, වැය වෙනවා, දවල් කෑම හම්බ උනාට වඩා වැඩි වේගයකින්. මොකද මේවා පින්වතුනේ ගොඩාක් පින් වැය කරන්න ඕන දේවල් මේ. ඔබ හිතලා බලන්න ඔබට Account එකක් තියෙනවා.පින් Account එකක් තියෙනවා. මේ සසරේ ඔබ කරගත්ත පින් ඔක්කෝම ඕකේ එකතු වෙවී, එකතු වෙවී ඒ කියන්නේ පින් විපාක ඒකේ එකතුවෙනවා. ඊට පස්සේ අවස්ථාවක් හැදිච්ච ගමන් පින්වතුනේ ඒ විපාක මල්ලෙන් තමයි එකක් ඇදිලා එන්නේ. ඒ ඇදිලා එනකොට ඔබට මෙන්න දේශනාවක් ඇහෙනවා කනට. නැත්නම් බලද්දී ඇඟට ඇඳුමක් වැටිලා. නැත්නම් බලද්දී ඔබට ඉස්සරහා බත් පිඟානක් මැවිලා ඒ ඔක්කෝම අර පිනේ විපාකෙට ඇදිලා එන්නේ. බත් පිඟානෙට ගියානම් පින්වතුනේ පින් විපාක වලින් යම් ගානක්, පින්වතුනේ ඒ වගේ සිය දහස් ගුණයක් යනවා, වැයවෙනවා, පින්වතුනේ මේ බණ පදයක් ඔබට ඇහෙන්න.

අපේ ගුරු හාමුදුරුවෝ, උන් වහන්සේ අපට නිතර මතක් කරන්නේ "අපේ හාමුදුරුවනේ ඔබ වහන්සේලා මෙහේ ඇවිල්ලා පැවිදිවෙච්ච ගමන් ඔබ වහන්සේලා

කරගත්ත ඔක්කෝම පින් ටික ඉවර උනා කියලා.'' මොකද ඒකට හේතුව පින්වතුනේ අපි පැවිදි උනේ සම්බුද්ධ සාසනයක. නිගන්ඨ සාසනයක නෙමේ. අනාලම්බදීක සාසනයක නෙමේ. අපි පැවිදි උනේ සම්බුද්ධ සාසනයක. සම්බුද්ධ සාසනයක පැවිදි වෙන්න පින්වතුනේ මහා අති දැවැන්ත පින් ප්‍රමාණයක් තියෙන්න ඕනේ. ඉතින් පැවිදි වෙච්ච ගමන් පින්වතුනේ ඒ පින් ටික ඔක්කෝම ගියා. සමහරවිට මනුස්සයෙක් ඉන්න පුළුවන් එයා පැවිදි වෙච්ච ගමන් වෙන පිනක් කරගෙන තිබුනේ නැත්නම් දඩොස් ගාලා බිම ඇදවැටෙනවා. බැලින්නම් පින්වතුනේ එයාට ජීවත්වෙලා ඉන්න තියෙන පිනුත් ඉවරවෙලා දැන්. මොකද ඒ තරම් වේගයෙන් සිවුරු පටිය බෙල්ලේ ගැට ගහද්දී එයාගේ පින් ටික ඉවර වෙලා. එහෙම වෙන්න බැරි නෑ. එහෙම වෙන්න බැරි නෑ පින්වතුනේ.

මතකද ශක්‍ර දේවේන්ද්‍රයාට දැනෙන්න පටන්ගත්තාට පස්සේ, ශක්‍ර දේවේන්ද්‍ර පදවිය දැන් අහිමි වෙන්නයි යන්නේ, එතුමා දැන් චුත වෙන්නයි යන්නේ කියලා, ශක්‍ර දේවේන්ද්‍ර තුමා එනවා පින්වතුනේ තථාගතයන් වහන්සේ මුණ ගැහෙන්න. ඔබට මතක ඇති. තථාගතයන් වහන්සේ මුණ ගැහෙන්නේ ඇවිල්ලා ශක්‍ර දේවේන්ද්‍ර තථාගතයන් වහන්සේගෙන් බණ අහනවා. ඒ බණ අහනවෙලාවේ පින්වතුනේ ශක්‍ර දේවේන්ද්‍රයා සෝතාපන්න ඵලයේ පිහිටනවා.

ඔබට මතක ඇති පින්වතුනේ ඉහින් කනින් දාඩිය දාන්න පටන්ගත්ත වෙලාවේ, අර බෙල්ල වටේ තියෙන මල්, ඒ කියන්නේ දිව්‍යමය මල් ඒවා පරවෙන්න පටන්ගත්තාට පස්සේ මේ ඇඟ තියෙන පාට දුර්වර්ණ වෙන්න පටන් ගත්තාට පස්සේ තමයි ඒ දෙවියන්ට දැනෙන්න පටන් ගන්නේ, දැන්නම් කාලේ හරි කියලා. ඒ කියන්නේ දැන් මේ චුත වෙන්නයි යන්නේ. දැන් මේකේ ආයු කාලය ඉවරයි. දැන් ඊලඟට මොකක් ඇදෙයිද දන්නෑ. පින්වතුනේ ඊලඟට සමහර විට කෙලින්ම ගිහින් වැටෙන්න පුළුවන් පභාස නම් නරකයට. එක එක තැන්වල වැටෙන්න පුලුවන්. තිරිසනෙක් වෙන්න පුළුවන්. එහෙම වෙන්න බැරි නෑ. මේ අද සක්විති රජ අනිත් දවසේ බැලින්නම් හංගොල්ලෙක්. අද ශක්‍ර දේවේන්ද්‍රයා අනිත් දවසේ බැලින්නම් මී හරකෙක්. එහෙම වෙන්න පුළුවන් පින්වතුනේ. නැතිනම් මලපෙරේතයෙක්. එහෙම වෙන්න පුළුවන්. මොකද අපි දන්නේ නෑ, මොන වෙලාවේ මොන කර්මේද ඇදිලා එන්නේ කියලා. සසරේ කරගත්තු දේවල් එක එක වෙලාවට ඇදිලා එනවා. ඉතින් ඔබට යන්තන් මනුස්ස කර්මයක් ඇදිලා ඇවිල්ලා. ඒ නිසා තමයි අපි හැමෝම මනුස්සයෝ වෙලා ඉන්නේ.

දැන් ඔබට මම මේ කියන්න ආව කාරණාව, ශක්‍ර දේවේන්ද්‍ර තුමා පින්වතුනේ ඒ වෙලාවේ එතුමාගේ පඩුපුල් ආසනයෙන් බැහැලා ඇවිල්ලා තථාගතයන් වහන්සේ මුණ ගැහෙන්න ආවේ ඇත්තටම බය වෙලා. මොකද දැන් මේ සක්විති පදවිය නැතිනම් ශක්‍ර දේවේන්ද්‍ර පදවිය නැතිවෙන්නයි යන්නේ. ශක්‍ර පදවිය නැතිවෙන්නයි යන්නේ. මොකද එයාට දැනුනා මල් පරවී ගෙන යනවා. ඇඟ වර්ණය අවපැහැ වෙනවා. තමන්ට තියෙන රාජධානි පොඩ්ඩ පොඩ්ඩ අතුරු දහන්වීගෙන යන්න පටන් ගන්නවා. ඒ වගේ ලකුණු පහළ වෙන්න ඇති. ඊට පස්සේ ඇවිල්ලා පින්වතුනේ බුදු හාමුදුරුවන්ගෙන් බණ අහන වෙලාවේ සෝතාපන්න ඵලයේ පිහිටියා. සෝතාපන්න ඵලයේ පිහිටලා පින්වතුනේ, ඒ සෝතාපන්න වෙන්න බණ අහන වෙලාවේ පින්වතුනේ ශක්‍ර දේවේන්ද්‍රයා දන්නේත් නෑ කලින් තිබ්බ කර්ම ශක්තිය වැය වෙලා, ඒ කියන්නේ ශක්‍ර දේවේන්ද්‍ර පදවියෙන්

චුතවෙලා ආපහු සැරයක් ශක්‍ර දේවේන්ද්‍ර විදිහටම පහල වෙනවා ඒ මොහොතේම. එතන බණ අහන වෙලාවේ. එතුමා දන්නෙත් නෑ එහෙම දෙයක් සිද්ධ උනා ද කියලා. ඒක බුදු හාමුදුරුවෝ දන්නවා.

දැන් මම මේ ඔබට පෙන්නන්න මතක් කරන කාරණාව පින්වතුනේ, ඕක සිද්ධ උනේ මොකක් කරන වෙලාවේ ද? ඕක සිද්ධ වුනේ පින්වතුනේ රට වැසියන්ට ගෙවල් දොරවල් හදලා දෙන වේලාවේ නෙමේ නේද. ඕක සිද්ධ වුනේ පින්වතුනේ චාතුන්මහා රාජිතයේ ඒ කියන්නේ රාජධානි 4ටම ඉන්න සියලු දෙවිදේවතාවහන්සේලා නොයෙක් ආකාරයෙන් තමන්ට තියෙන සැප සම්පත් බෙදා හදා තමන්ට තියෙන ධනය සම්පත් බෙදා හදා දෙන වෙලාවේ නෙමෙයි නේද? ඕක සිද්ධ වුනේ පින්වතුනේ බණ අහන වෙලාවේ. ඒ කියන්නේ ඒ බණ අහනවා කියලා කියන්නේ මොන තරම් පුණ්‍ය ශක්තියක් ජනිත වෙන වැඩක් වෙන්න ඇතිද? කොච්චර ශක්තියක්ද කියනවානම් පින්වතුනේ, ශක්‍ර දේවේන්ද්‍ර ස්වභාවය චුත වෙලා ගිහිල්ලා ආපහු සැරයක් මතක තියාගන්න ශක්‍ර දේවේන්ද්‍ර පදවිය ලබනවා කියන්නේ බොහෝම අති දැවැන්ත පුණ්‍ය ශක්තියක් වැයවෙලා ගිහිල්ලා. මොකද මේ කාම ලෝකයේ මහ ඉහල තැන් පින්වතුනේ ශක්‍ර දේවේනුද්‍ර පදවිය. මුළු ලෝකයටම රජ උනාට වඩා පින්වතුනේ මහ දැවැන්ත පිනක් තියෙන්න ඕනේ ශක්‍ර දේවේන්ද්‍රයා වෙන්න. නමුත් ඒවා නිවනත් එක්ක බැලුවාහම නම් සොලොස් කලාවෙන් එකක්වත් වටින්නේ නෑ. කෙනෙක්ගේ සෝතාපන්න ඵලයයි ශක්‍ර දේවේන්ද්‍ර පදවියයි දෙකෙන් කෝකද වඩා වටින්නේ කියලා ඇහැව්වොත් අපිට හිනායනවා ඒ අහන ප්‍රශ්නයටත්. හරි ඉතින් ඒ නිසා නිවනත් එක්ක ගලපන්න පුළුවන් දෙයක් නෙමේ. ලගින් තියන්නවත් බෑ. සෝතාපන්න ඵලයට ලගින් තියන්නවත් බෑ ශක්‍ර දේවේන්ද්‍ර පදවිය. නමුත් මේ කාරණාවෙන් මේ කතන්දරයෙන් ඔබට මතක් කරලා දෙන්න හදන්නේ ශක්‍ර දේවේන්ද්‍ර තුමාට ඒ ශක්‍ර දේවේන්ද්‍ර පදවිය නැතිවෙලා ආපහු සැරයක් ඒක ඒ වෙලාවේ ලබන්න ලොකු පිනක් විපාක දුන්නා වෙන්න ඕනේ, මොකද ශක්‍ර දේවේන්ද්‍ර පදවිය ලබන වෙලාවෙත් ලොකු පිනක් වැය උනා. එහෙමනම් ඒ පින් ටික පින්වතුනේ නැවත වාරයක් හම්බ උනා නේද? මොකද ඒ පින් ටික ඔක්කොම ඉවර වෙලා තිබුනේ. ඒකනේ මේ චුත වෙන්න පටන් අරගෙන තියෙන්නේ. මොකද ඒ වෙනකන් කරගත්ත පින් සමහර විට පින්වතුනේ සම්බුද්ධ සාසනයේ බණ අහන්න කලිනුත් සාසනය වෙනුවෙන් දේවල් කරා වෙන්න ඇති. සමහර දේවල් කරා වෙන්න ඇති. ශක්‍ර දේවේන්ද්‍රයාගේ මුලු ජීවිත කතාවම මම දන්නේ නෑ. එක එක ජාතියේ පින්කම් කරා ඇති. මොකද යන්න කලින් කරලා හුරුදේවල් තමයි පින්වතුනේ ගියාට පස්සේත් කරන්නේ. එතකොට ඒ පුරුද්දනේ. ඉතින් ඒ නිසා, නමුත් එහෙම කරලත් පින් ටික ඉවරවේගන එනවා ඒ නිසායි මේ චුත වෙන්න කාලය ඇවිල්ලා ඇති බව මෙයාට දැනෙන්නේ. නමුත් මොකද කලේ. ඇවිල්ලා බුදු හාමුදුරුවෝ මුණගැසුනා. අනේ ස්වාමිනී, මගේ ශක්‍ර දේවේන්ද්‍ර පදවිය නැති වෙන්නයි යන්නේ. මොකක්ද මම කරන්නේ. දැන් හොඳටම බයවෙලා. මොකද ශක්‍ර දේවේන්ද්‍ර තුමාට ඒ වෙලාවට තේරෙන්නේ නැනේ ඕනකමයි ප්‍රශ්නේ කියලා. මොකද තවම සෝතාපන්න වෙලා නැනේ. ඒ වෙලාවේ එතුමාට තේරෙන්නේ බුදු හාමුදුරුවෝ මුණ ගැහෙන්න ආපු ශක්‍ර දේවේන්ද්‍රතුමාට ඒ වෙලාවේ තේරෙන්නේ, පින්වතුනේ මට ශක්‍ර දේවේන්ද්‍රයා වෙන්න ඕනේ. නමුත් ඒක මට දැන් නැති වෙන්න නෙ යන්නේ. අන්න ඒකයි දුක කියලා. ඕන දේ නැතිවෙන්න යන එක තමයි මේ දුක කියලා තේරෙන්නේ.

ඒ වෙලාවේ බණ පදයක් අහනවා තථාගතයන් වහන්සේගෙන්. ඒ බණ අහන වෙලාවේ පින්වතුනේ චතුරාර්ය සත්‍ය අවබෝධ වෙනවා. මූලික පලවෙනි අවබෝධ මට්ටම ලබනවා. සෝතාපන්න ඵලයේ පිහිටනවා. ඒ බණ අහන වෙලාවේ. දැන් හිතලා බලන්න පින්වතුනේ, කෙනෙක්ට සෝතාපන්න ඵලයේ පිහිටන්න කොච්චර පිනක් ඕන ඇත්ද? දැන් ගොඩාක් පැති කඩ මේකෙන් ඇරි ඇරි එනවා. ඔබේ පිනට වෙන්න ඇති.

ඔබ හිතලා බලන්න බණක් අහනවා කියන එකේ වැදගත්කම මම පෙන්වලා දෙන්නේ. පින්වතුනේ පුදුම, පුදුම පුණ්‍ය කර්මයක් ඒක. බණ අහන එක එහෙම නම් බණ කියන එක කොහොම ඇත්ද? දවසක ඔබත් කරන්න ඕනේ. එතකොට දැන් බලන්න ශක්‍ර දේවේන්ද්‍රයාගේ පින දැන් ඉවරවෙලා දැන් චුත වෙන්නයි ලෑස්තිවෙන්නේ. බය උනා. ඇවිල්ලා බුදු හාමුදුරුවෝ ගාවට ඇවිල්ලා දැන් බණ අහනවා. ඒ බණ අහනවෙලාවේ බුදු හාමුදුරුවෝ බණ කියනවා. බුදු හාමුදුරුවෝ බණ කියන කොට පින්වතුනේ, ශක්‍ර දේවේන්ද්‍ර පදවිය වගේ 16 ගුණයකට එහාට ගියපු වටිනාකමක් තියෙන දෙයක් ලබන්නත් ඕනේ. ඒ ටික ලබලා ඉවර උනාට පස්සේ යමක් ඉතුරු උනොත් ඒකෙන් ශක්‍ර දේවේන්ද්‍ර පදවිය ලබන්නත් ඕනේ. ඒ දෙකම සිද්ධ උනේ කොයිවෙලාවේද අර බණ අහන වෙලාවේ. එහෙමනම් ශක්‍ර දේවේන්ද්‍රතුමාත් පින්වතුනේ බුදු හාමුදුරුවන්ගෙන් බණ අහන වෙලාවේ චාතුන්මහාරාජිතයේ facebook wall එකට ගිහිල්ලා ඒකේ update දදා ඉන්න ඇති නේද? නැතිනම් ඒකේ ඉන්න අනිත් දෘඩරාෂ්ඨ දෙවියන්ගේ wall එකේ add එකට නැත්නම් post එකට like එකක් comment එකක් දදා ඉන්න ඇතිනේද? එහෙම කලේ නෑ පින්වතුනේ. බණ අහන වෙලාවේ ශක්‍ර දේවේන්ද්‍රයා තමන්ගේ තියෙන ඔක්කෝම ටික පැත්තකින් තියලා , දිව්යන ලෝක 4 තියෙන ප්‍රශ්නත්, තාවාතින්සයේ ඒ කියන්නේ දිව්යවලෝක තව 33ක් තියෙනවා, ඒ ටිකේ තියෙන ප්‍රශ්නත් පැත්තකින් තියලා. මනුස්ස ලෝකේ තියෙන ප්‍රශ්න ටිකත් ඔක්කෝම පැත්තකින් තියලා පින්වතුනේ ශක්‍ර දේවේන්ද්‍රතුමාට තියෙන ප්‍රශ්නේ මොකක්ද කියලා බුදු හාමුදුරුවන්ගේ දේශනාව තුලින් එයා තේරුම්ගන්න උත්සාහ ගත්තා. මට තියෙන ප්‍රශ්නේ මොකක්ද කියලා? ඒ කියන්නේ මම නැමැති ප්‍රශ්නේ මොකක්ද? මට තියෙන ප්‍රශ්නෙට වඩා මම නැමැති ප්‍රශ්නය මොකක්ද කියලා තේරුම්ගත්තා පින්වතුනේ. අන්න ඒ වෙලාවේ ඒ බණ පදය අහන වෙලාවේ පින්වතුනේ සෝතාපන්න ඵලයත් ශක්‍ර දේවේන්ද්‍ර පදවියත් නැවත හම්බ උනා. එහෙමනම් බණ අහනවා කියන්නේ කොයි වගේ පිනක් වෙන්න ඇතිද? කොහොම කරොත්ද? බාගෙට.නෑ.. හරියට කරොත්. ඒකයි පින්වතුනේ සප්ත සම්බොජ්ජංග ධම්ම එකට වැඩෙනවා කියන්නේ ඒකයි.

බුද්ධ සාසානයක දේවල් පින්වතුනේ ඔබ කවර කවදාකවත් සුලුවකට තකන්න එපා. මේ අහන්නේ බුදු බණනේ පින්වතුනේ. මේ අහන්නේ නිවන් යන බණ. මේ බණ ටික ඇහෙන්න ඔබ කරගත්ත පින මෙච්චරයි කියලා කියන්න බෑ. අපි ඒක මතක් කරන්නේ කරුණු දෙකක් උදෙසා. එකක් තමයි ඔබ කොයිතරම් වාසනාවන්ත පිරිසක්ද කියලා මතක් කරලා දෙන්න. හැබැයි තව පැත්තක් තියෙනවා ඔබට මතක් කරලා දෙන්න. නැත්නම් ඔබට අමතක වෙන්න පුලුවන්. ඒ තමයි ඒ පින තියාගෙන මේ බණත් අහන්න බෑ.

පින්වතුනේ කඩේට යනවා රු.1000ක් එක්ක. රු.1000ක් විතරයි අරන් යන්නේ. රු.1000යි බඩුයි දෙකම අරන් ගෙදර එන්න බෑනේ. දැන්නම් රු.1000ක් අරන් ගියාත් මොකුත් අරන් නැතිව තමයි ගෙදර එන්න වෙන්නේ. නමුත් කියන කාරණාව තේරෙනවානේ. ඔබ කඩේ අරන්ගිය සල්ලියි කඩේ තියෙන බඩුයි දෙකම අරගෙන ගෙදර එන්න බෑනේ. සල්ලි දීලා බඩු අරන් එන්න පුලුවන්. සල්ලි දෙන්නේ නැතිව බඩු අරන් එන්න දෙන්නේ නෑනේ. එහෙමනම් ඒ වගේ තමයි පිනත්.

මේ බණ ටික අහද්දී ඔබේ පින වැයවෙනවා. අන්න ඒකත් ඔබට මතක් කරලා දෙන්නයි අපි කියන්නේ ඔබ කොයිතරම් පින්වන්තයි ද කියලා, මේ වගේ බණ පදයක් අහන්න ලැබෙන්න. ඒ කියන්නේ මේ බණ ටික අහද්දී ඔබේ පින වැයවෙනවා.

ඒ පින වැයවෙන වෙලාවේ පින්වතුනේ ඔබ facebook එකේ හිටියොත් එහෙම උනා කියලා මේ බණ ටික කනට ඇහෙනවා නම් පින වැයවීමේ අඩුවක් සිද්ධ වෙන්නේ නැති බව සියලුදෙනාම හොඳ අවධානයෙන් හිතට ගන්න. ඔබ ඒ වෙලාවේ පින්වතුනේ වෙන game එකක් ගහ ගහ හිටියොත්, නැතිනම් කාත් එක්ක හරි පොඩි chat එකක් දාගෙන හිටියොත්, එහෙම නැත්නම් ඒක යන වෙලාවේ අයිස්ක්‍රීම් ටිකක් එහෙම බෙදාගෙන දවල් කෑමට එහෙම පස්සෙනේ පොඩ්ඩක් අයිස්ක්‍රීම් ටිකක් කන්න ඕනේ කියලා ඒක කකා හිටියොත් පින්වතුනේ දෙකෙන්ම එහෙම කරා කියලා දේශණාව අහන්න යන පින වැයවෙන එකේ අඩුවීමක් සිද්ධ වෙන්නේ නෑ. ආයිත් මම කියන්නේ මම මෙහෙම කිව්වට මේ කියන වෙලාවෙත් සමහරවිට එක්කෙනෙක් දෙන්නෙක් ඇති. ඉතින් එහෙම නොකරන තරමට හොඳයි.

මොකද ඔබ මේ ආයෝජනය කරන්නේ ලේසි පහසු දෙයක් නෙමෙයි. ලේසි පහසු තැනක නෙමෙයි. ලොකු තැනක නිසා ගොඩාක් යනවා. ලේසි පහසු දෙයක් නෙමේ නිසා හම්බකරගන්න ආයේ අමාරුවෙයි. ආය ගොඩාක් අමාරුවෙයි පින්වතුනේ.

පින්වතුනේ මතක තියාගන්න දුගතියට දුගතිය කියන්නේ ඇඟට දුක දෙන නිසා නෙමෙයි. මොකද ඔබේ ඇගටත් දුක හම්බවෙනවා නේද? දුගතියට දුගතිය කියන්නේ ඇඟට දුක දෙන නිසා නෙමේ පින්වතුන්. මනුස්ස ලෝකේ ආපු ඔබටත් ඇගට දුක නැද්ද? ඔය කයට දුක නැද්ද? හිසේ කැක්කුම්, කොන්දේ කැක්කුම්, අරහේ අමාරු, මෙහේ අමාරු, බඩේ රුදාවල් කීයක් කියලද පින්වතුනේ. ඉවරයක් නෑනේ. එහෙනම් කයට දුක එන නිසා නෙමේ පින්වතුනේ ඕකට දුගතිය කිව්වේ. ඕකට දුගතිය කියලා කිව්වේ කියන බණ තේරෙන් නැති නිසා. දුගති ලෝකයට දුගතිය කියලා කියන්නේ කියන බුදු බණ තේරෙන්නේ නැති නිසායි.

අන්න ඒකයි පිනවතුනේ ඔබේ බල්ලාට මේ බණ කිව්වාට වැඩක් නැත්තේ. බල්ලා ඉන්නේ දුගතියේද? කොහොමද දන්නේ. බණ ටිකක් කියලා බලන්න තේරෙයි ද කියලා. තේරෙන්නේ නැත්නම් දුගතිය. ඔය අතර මනුස්සයෝ කිහිපදෙනෙකුත් ඉන්න පුළුවන් කියන ටික තේරෙන්නේ නැති. අන්න ඒකයි මම කියන්නේ අර අරූපාවචර බ්‍රහ්ම ලෝකේ ඉන්න පිරිසට සුගතියේ ඉන්නේ කියලා කියන්නේ ඇයි කියලා මට නම් හරියට පැහැදිලි නෑ. උපදින තැන අනුව සුගතිය වෙන්න ඇති. නමුත් පින්වතුනේ ඒ ගොල්ලන්ගේ ගතිය නිවන් ගතියට පෙරලා ගන්න බෑනේ. මොකද නිවන් ගතියට ආර්ය ගතියට පෙරලා ගන්න නම් පින්වතුනේ ඉස්සරලා කනෙන් බණ ඇහෙන්න

එපැයි. කනෙන් මේ ආර්ය ගතිය කියන්නේ මොකක්ද කියලා අවබෝධ වෙන්න එපැයි. ඒකට ආර්ය දේශනාවක් අහන්න එපැයි, ආර්යන් වහන්සේ නමකගෙන්. ඒ ටික එකක්වත් සිද්ධ වෙන්න බැනේ එතන. නමුත් සුගතිය කියනවා, මොකද කයට දුක නැති නිසා. කයක් නැලුනේ එහේ. ඉතින් කයට දුක නෑ. ඒ නිසා සුගතිය.

ඔබ රැවටෙන්න එපා පින්වතුනේ ඔබ ඉපදිලා ඉන්නේ සුගතියක, ඒ නිසා කිසි ප්‍රශ්ණයක් නෑ කියලා. ජීවත්වෙන කාලය තුල ඔබේ ගතිය ආර්ය ගතිය කරගත්තේ නැත්නම්, ඒ කියන්නේ පින්වතුනේ ඉපදිච්ච ඔබ මැරෙන්න ලෑස්ති උනේ නැත්නම් අපරාදේ ඔබ ඉපදුනේ. ඉපදිච්ච ඔබ ආර්ය ගතියට පත් වුනේ නැත්නම් අපරාදේ ඔබ සුගතියක ඉපදුනේ. මැරෙන්න ලෑස්ති නෑ කියලා කියන්නේ, ඔබ ආර්ය ගතියට පත්වෙනකම් කවදාවත් මැරෙන්න දෙන්නෙ නෑනේ මේ සසරේ. ඇයි මැරිච්ච ගමන් මොකද වෙන්නේ. ආපහු සැරයක් ඉපදෙනවා. ඔබට මැරෙන්නවත් දෙන්නේ නෑනේද මේ සංසාරේ. මිනිස්සු බයයි මැරෙන්න. බලන්න කොච්චර වැරදිලාද කියලා පින්වතුනේ. මිනිස්සු බයයි මැරෙන්න, ඇයි? හරියට ආය උපදින්නේ නැතිවෙයි කියලා වගේ.

පින්වතුනේ මොකටද පින්වතුනේ මැරෙන්න බය වෙලා. යමක් නැතිවෙන්න බය වෙන්න ඕනේ පින්වතුනේ ආය හම්බවෙන්නේ නැත්නම්නේ. දැන් ඔබ හිතලා බලන්නකෝ ඔබ ගාව තියෙන දේවල් නැතිවෙයි කියලා ඔබට බයක් ඇතිවෙන්නේ ආයේ ඒ වගේ දෙයක් හම්බවුනේ නැති උනොත් නෙමේද? දැන් අම්මා කෙනක් බයයි පුතා මැරෙයි කියලා. ඇයි? ඉතින් ඒ වගේ පුතෙක් ආයේ හම්බවෙන් නැති වෙයි කියලා බයයි. ඉතින් හරි ඒක සාධාරණයි කියමුකෝ. දැන් ඔබ බත් ටික කන ගමන් පරිප්පු ඇටයක් වැටුනා බත් එකෙන්. දැන් ඔබ බය වෙනවාද එක පාරට. අනේ දෙවියනේ මගේ පරිප්පු ඇටය වැටුනා කොහේද දන්නේ නෑ. ඇයි ඒ බය වෙන්නේ නැත්තේ. සමහරවිට හැරිලා බලන්නේත් නෑ. දැක්කා පිඟානෙන් වැටුනා. ගණන් ගන්නේවත් නෑ. පස්සේ අතුගාලා දානවා.නැත්නම් ටොමීට. ඔබ ගනන් ගන්නේ නෑනේ ඒක, ඇයි? ප්‍රශ්නයක් නෑනේ වැටුනාට. ඇයි බයවෙන් නැත්තේ. ඒ වගේ ඒවා කොච්චර තියෙනවාද. එහෙමනම් බයවෙන්නේ නෑනේ ද පින්වතුනේ නැතිවුනාට ආපහු සැරයක් ලේසියෙන් ලබාගන්න පුලුවන් දේවල් නැති උනා කියලා බයක් නෑනේ. නැති උනා කියලා ශෝකෙකුත් නෑනේ, බොහොම පහසුවෙන් ආය ලබාගන්න පුලුවන් දේවල් නම්. මම ඔබට කියන්නේ ඇයි මේ මිනිස්සු මැරෙන්න බය. ඔබත් මැරෙන්න බයයිද? බය වෙන්න එපා. ආය ඉපදෙනවා. බය වෙන්න එපා මාත්‍රයක්වත්. ආය ඉපදෙනවා.

අනිත් එක ඔබම දන්නවා නේද පින්වතුනේ ඔබම කියනවා නේද මේ අපේ මේ පවුලේ අය අපි සසරේ එකට කොච්චර කල් එකට ඉන්න ඇද්ද? කියනවාද, නැද්ද? සංසාරේ අපි යනෙනතුරා යන ගමනක් අපි එකට යමු... පින්වතුනේ ඔය කියන්නේ මිනිස්සු. මේ සින්දු කියන මිනිස්සු පවා. ඒ කියන්නේ කලාකරුවෝ පවා ඔය කියන කොටස දන්නවානේ. බණ අහන්න ඕනේ නෑනේ ඒ ටික තේරෙන්න. තව ඉස්සරහාටත් යනවා. සංසාරේ අපි යනෙන තුරා සැරයැටියෙන් අපි එකට යමු. ඒ කියන්නේ ඉස්සරහා ගමනත් එයාලා plan කරලා ඉවරයි. ආපු ගමන ගැනත් දන්නවා. යන ගමන ගැනත් දන්නවා. දැන් ඔබත් දන්නැද්ද? ඔබ හිතන්නේ ඔබේ ඔය අම්මා ඔබට පලවෙනි වතාවට

හම්බඋනා ඇති කියලාද? පින්වතුනේ පයට පෑගෙන කූඹියා ගැනත් ඔබ ඔහොම කියනවා නේද....අනේ දෙවියනේ මේ මගේ පයට පෑගිච්ච කූඹියත් මට කොච්චර කාලයක් මට මගේ අම්මා වෙලා ඇත්ද මේ සංසාරේ. කොච්චර වතාවක් මට අයියා වෙලා ඇත්ද, නංගී වෙලා ඇත්ද, දරුවා වෙලා ඇත්ද ඔහොම ඔබ හිතනවා. ඉතින් එහෙම නම් පින්වතුනේ ඔබේ අම්මා මැරෙනවාට බය ඇයි? ආයේ එනවානේ ඔය අම්මාම. අම්මා වෙලාම ආවේ නැති උනත් පින්වතුනේ ආයේ හම්බවෙනවානේ. එහෙමනම් ඇයි මැරෙන්න බය.

පින්වතුනේ මතක තියාගන්න ආර්යන් වහන්සේලා මැරෙන්න බය නෑ. ඔබ ආර්යද නැද්ද කියලා බලාගන්න හොඳ ක්‍රමයක් ඒක. ඔබ ආර්යද, නැද්ද කියලා බලාගන්න එක එක ක්‍රම තියෙනවා පින්වතුනේ. මොකද ආර්යන් වහන්සේලා පිළිකුල් කරන දේවල් අනාර්යෝ පිළිකුල් නොකරයි. ආර්යන් වහන්සේලා පිළිකුල් නොකරන දේවල් අනාර්යයෝ පිළිකුල් කරයි. ඔහොමනේ තියෙන්නේ. එකක අනිත් පැත්ත තමයි අනික් එකේ. දෙපැත්තටම.

එහෙමනම් ඔබ බලන්න මේ ලෝකේ වැඩි හරියක් ඉන්නේ අනාර්යෝ. හැමෝම මැරෙන්න බයයි. ඔබත් මැරෙන්න බයයිද? ඔබත් මැරෙන්න බයයි නම්, ඒ කියන්නේ මැරෙන්න බයයි කියලා කිව්වේ මේ දැන් අපේ ජීවිතයේ මරණයක් එන්නේ, මේ ජාති පච්චයා මරණ කියන ඒ ශුක්ෂම පැත්ත ගැන නෙමේ මම මේ කතා කරන්නේ. කය කැඩිලා ගියාට පස්සේ මැරෙන්නේ, හාට් ඇටැක් එකක් හැදිලා මැරෙන්නේ, අන්න ඒ මරණය. ඇයි මිනිස්සු මැරෙන්න බය. මිනිස්සු මැරෙන්න බයයි. තේරුමක් නෑ මිනිස්සු මැරෙන්න බයවෙලා. මොකද ආයේ ඉපදෙනවානේ. ඒ විතරක් නෙමේ ඔය තමන් ළඟ ඉන්න අම්මලා අක්කලා, අයියලා, නංගිලා, මල්ලිලා, නෝනා, මහත්තයලා ඔය හැමකෙනාම පින්වතුනේ ආය හම්බවෙනවා. බය වෙන්න දෙයක් නෑ. ඒ ගොල්ලෝ පොඩ්ඩක් මැරෙනකන් විතරයි බලන් ඉන්න තියෙන්නේ. සමහරවිට ඒක නිසා වෙන්න ඇති මැරිලා ඔය එක එක අත්බැව්වල ඉපදුනාට පස්සේ එච්චර කාලයක් එකට හිටපු අයට කරදර කරන්නේ ගිහිල්ලා. පුලුවන් තරම් ඒ මනුස්සයාගේ විනාෂයට කටයුතු කරන්නේ. ඇයි? ඊට පස්සේත් ඉක්මනට ආය එනවානේ තමන් ගාවට ඒ ලෝකේට. අතහැර ගන්න බැරිවයි ඉන්නේ. ඒ නිසා පින්වතුනේ ආර්යන් වහන්සේලා මැරෙන්න බය නෑ. ආර්යන් වහන්සේලා මොකටද බය. ඔබ කටපාඩමින් උත්තරය දෙයි. මේ ප්‍ර ශ්නය ඔබට මම ඉදිරිපත් කරන්නේ ඔබ ආර්යද නැද්ද කියලා ඔබ ඔබෙන් අහගන්න. ඔබ බය මැරෙන්න ද, ඔබ බය ඉපදෙන්න ද.

දැන් ඔබට පින්වතුනේ එකපාරට ක්ලාන්තය දානවා. ඔබට තියෙන රෝගී තත්ත්වයක් තියෙනවා, ඒකත් එක්ක දොස්තර මහත්තයා කලින් කියලා තියෙන්නේ ක්ලාන්තයක් දැම්මොත් ආයේ නම් නැගිටින්නේ නෑ. දැන් බලන්න එක පාරට හිතට බයක් එනවාද කියලා. බේරිහන් දෙයිද දැන්. එහෙමනම් මැරෙන්න බයයි පින්වතුනේ. ආර්යන් වහන්සේලා මැරෙන්න බය නෑනේ. සේක පුද්ගලයෝ ඒ කියන්නේ අරිහත්වයට යන ගමන තුල පින්වතුනේ පොඩි චකිතයක් හිතට එයි. සාමාන්‍යතයෙන් හිතන්න අමාරුයි සෝතාපන්න ඵලයෙන් එහාට කෙනෙක් නිකන් මරලතෝනි දි දි හූ කිය කිය කෑගහයි කියලා අනේ මං මැරෙනවා, අනේ මාව බේරාගනිල්ලා කවුරු හෝ කියලා. මට එහෙම හිතන්න අමාරුයි කවුරුත් එහෙම කරයි කියලා. මොකද ඒගොල්ලෝ මරණය කියන

එක ප්‍රශ්ණයක් විදිහට දකින්නේ නෑ. ඒ ගොල්ලෝ දකින්නේ ඉපදීම ප්‍රශ්ණයක් විදිහට. ජාතියයි පින්වතුනේ ප්‍රශ්ණය විදිහට දකින්න ඕනේ. මොකද ජාතියයි දුක. ජාති වුනාම තමයි ජරා මරණය කියන එක පින්වතුනේ උරුම වෙන්නේ. ජාති වෙච්ච තැනයි ජරා මරණය කියන එක උරුම. එහෙමනම් බය වෙන්න ඕනේ මොහොකට ද? ජරා මරණයට නෙමෙයිනේ බය වෙන්න ඕනේ ජාතියටනේ.

ඒකනේ අපි ඔබට ඉස්සර කියන්නේ අද මිනිස්සු පාටි එකක් දාන්න ඕනේ වෙලාවේ අඬනවා. අඬන්න ඕන වෙලාවේ පාටි එකක් දානවා. නැද්ද? දරුවෙක් ඉපදුනුවෙලාවේ ඒ වටේ ඉන්න අය මොකද කරන්නේ. හැමෝම එකතුවෙලා අඬනවානේද? පොඞ්ඩක් ඒ දරුවා දිහා බලන්න පින්වතුනේ. ඒ දරුවා අඬන්නේ ඇයි? අනේ! අපොයි මම ආයෙත් ඉපදුනානේ. ඕක නිසා වෙන්න ඇති දරුවා අඬන්නේ.ඇයි? ප්‍රභාෂ්වර හිතක්නේ තියෙන්නේ. ඒක මම විහිළුවට කිව්වේ කියලා තේරුණානේ. ප්‍රභාෂ්වර හිත් තියෙන්නේ අරිහතුන් වහන්සේලාට. පොඩි දරුවන්ට ප්‍රභාෂ්වර හිත් නෑ. ප්‍රභාෂ්වර හිතක් කියන්නේ භවයේ සැරිසරන්නේ නැති හිතක්. භවයේ සැරිසරන්නේ නැති හිතක් නිසා ද ආයේ ඉපදුනේ. සමහරවිට ඒ දරුවා අඬනවා ඇත්තේ අනේ! අපොයි මම ආයේ ඉපදුනානේ. මොකද ඉපදුනාට පස්සෙනෙ ඒක දන්නේ ආයේ ඉපදුනා කියලා. ඉතින් අඬනවා. දැකලා තියෙනවා, අහලා තියෙනවා නේද කොච්චර අඬනවාද කියලා. තොරතෝන්වියක් නැතිව අඬන්නේ. අන්න අඬනවා, ඒ ඇඬිල්ල හරි. ඔය අඬන වෙලාවේ වටේ ඉන්න පිරිස මොකද කරන්නේ. පාටි දානවා. Invite කරනවා යාළුවන්ට. Wish කරනවා. බැලුම්බෝල අරන් එනවා නේද? කොච්චර දේවල් කරනවාද? නමකුත් හොයනවා. ඒ මදිවට ඉස්කෝලත් හොයනවා. කසාද බඳින්න මනුස්සයෙකුත් හොයනවා සතියක් දෙකක් විතර ගිය ගමන්. ඕක නේද පින්වතුනේ ඇත්ත කතාව.

ඔබ හිතනවාද පින්වතුනේ ආර්යයෝ ඔහොම කරයි කියලා. මොකද ආර්ය ස්වභාවය ඔබ තේරුම් ගන්න පින්වතුනේ. ආර්ය ස්වභාවය මේ ලෝකේ ස්වභාවයට වඩා සැහෙන්න වෙනස්. සැහෙන්න වෙනස් පින්වතුනේ. ඇහැට පේන්නේ නෑ තමයි ඒ වෙනස. මොකද ඒක ඇහැට පේන වෙනසක් නෙමේ. මොකද ඒක පිට බාහිර වෙනස්වීම තුල දකින්න පුළුවන් දෙයක් නෙමේ පින්වතුනේ. ඇඟට සිවුරක් වැටුනා කියලා කියන්නේ ආර්ය නෙමේ. ඒ කියන්නේ ඇඟට සිවුරක් වැටුණු පමණින් ආර්ය කියලා කියන්න බෑ. එහෙමනම් ඇඟට සිවුරක් වැටිලා නෑ කියන එකෙනුත් ආර්ය කියලා කියන්න බෑ. එහෙමනම් තට්ටේ ගාපු සැනින් ආර්යයෙක් කියලා කියන්න බෑ. එහෙමනම් තට්ටේ ගාන්නේ නැතිව හොඳට කොණ්ඩය පිටිපස්සට පීරලා ජෙල් ටිකකුත් ගාලා ඉන්නවා. ආර්යද නැද්ද? කියන්න බලන්න. කොහොමද කියන්නේ. එහෙම කියන්න බෑ. මොකද ආර්යත්වය කියන්නේ මේ ආර්ය භූමියට අඩිය තියෙනවා කියලා කියන්නේ පින්වතුනේ අවබෝධයක් එක්ක සිදුවන දෙයක්. ආර්ය භූමියට පත්වුනා කියන එක ඔබට ඔබ තුලින් බලාගන්න පුලුවන් එක ක්‍රමයක් තමයි ඔබ තාම මැරෙන්න බයද කියන එක. ඒ කියන්නේ මෙහෙම කියන්නම්කෝ ඉපදෙනවාට වඩා ඔබ මැරෙන්න බයද? ඔබ මේ දෙකෙන් වඩා බය මොකකටද? ඉපදෙනවාට ද මැරෙනවාට ද?. ඒ තුලින් පින්වතුනේ ඔබට යම් අදහසක් ගන්න පුලුවන් ඔබේ අවබෝධ මට්ටම ඔබේ ආර්යාත්වය මොකක්ද කියලා. මොකද ආර්යයො මැරෙනවාට වඩා අපි සේකයෝ කියලා ගමුකෝ. මොකද අරිහතුන් වහන්සේලා මැරෙන්න බය නෑ.

සේකයෝ අපි හිතමු මැරෙන්න පොඩි චකිතයක් වුවි හිතේ බයක් සැකයක් තියෙනවා කියලා. මොකද තාම මේ ඵලය පූර්ණය කරගෙන නැනේ. ඵල පූර්ණය සිද්ධවෙලා නෑ. ඒක නිසා තාම අර "මම" කියන ස්වභාවය උන් වහන්සේලාගේ හිත්වල තියෙනවා අරිහත් ඵලය පූර්ණය කරගන්නකම්. එතකොට මැරෙනකොට මැරෙන්නේ කවුද? මැරෙනකොට මැරෙන්නේ මේ "මම" කියලා දැනෙන හැම. නමුත් සේකත්වයට පත් උනාට පස්සේ ඒ පිරිසගෙන් ඇහැව්වොත් පින්වතුනේ ඔබ මේ දෙකෙන් වඩා බය මොහකටද? අන්න ප්‍රහශ්නය. උත්තරය මොකක්ද?

ඉපදෙන්න, නැත්නම් ජාතියට ද මැරෙන්න

ඔය දෙකෙන් වඩා බය මොකකටද?

ඔබ නිකමට හිතලා බලන්න පින්වතුනේ. සාමාන්‍යන් මනුස්සයෙකුගෙන් ඇහැව්වොත් ඔයා බය ඉපදෙනවාට ද? මැරෙනවාට ද? ඔබ දෙන උත්තරය මොකක්ද කියලා ආය දෙපාරක් අපට හිතේ සැකයක් නැතිව කියන්න පුලුවන් නේද? මනුස්සයෝ බය මොකකටද? මිනිස්සු බය මැරෙන්න පින්වතුනේ. බලන්න මිනිස්සු බයද කියලා ඉපදෙන්න.

පින්වතුනේ ඇත්තටම මිනිස්සු ඉපදෙන්න බය නම් මිනිස්සු දරුවෝ හදයි ද? ඒ කියන්නේ තමන් ඉපදීම නෙමේ. තව කෙනෙකුටවත් ඔය කියනදේ කරයි ද? දැන් මම මේ කියන්නේ දරුවෝ හදන්න එපාවත් හාවත් එහෙම එකක් නෙමේ. පොඩ්ඩක් හිතලා බලන්න මම මේ කියන කාරණාව. බුද්ධිමත්ව මේ කරුණු ගන්න කරුණාවෙන්. ඉපදීම කියන එක මනුස්සයෙක් දකිනවා නම් පින්වතුනේ දුකක් විදිහට ඇයි "අත්තානං උපමං කත්වා" කරන්නේ නැත්තේ. ඒ කියන්නේ තමන්ව එතෙන්ට දාගෙන බලන්න. ඉපදෙනවා කියන එක දුකක් නම්,

අපි ගමුකෝ මෙහෙම. නැවත උත්පත්තියක් ගැන විශ්වාස කරන්නේ නැති මනුස්සයෙක් ගන්නකෝ පොඩ්ඩකට. එහෙම මිනිස්සු ඕන තරම් ඉන්නවා. නැවත උත්පත්තියක්... එහෙම එකක් නෑ. ඒ කියන්නේ මළොත් මළා එච්චරයි. දැන් ඒ මනුස්සයාගෙන් ඇහැව්වොත්. බුදු දහමක්... කොහොමත් අහලා නෑ. එහෙනම් මොකද මැරෙන්න ආයෙ ඉපදෙන්නෙ නෑ කියන එක, එතන එයාගේ හිත තියෙන්නේ නැනේ. හරි, එතකොට එයාගෙන් ඇහැව්වොත්, මැරෙන්න එකද බය? ඉපදෙන එකද බය? මැරෙන එකටද බය වෙන්න ඕනේ? ඉපදෙන එකට ද බයවෙන්න ඕනේ? පින්වතුනි ඒ මනුස්සයාත් කියනවා නේද, මැරෙන එකටයි බය වෙන්න ඕනේ කියලා. ඉතිං හත්දෙයියනේ පින්වතුනි මේ නැවත ඉපදෙනවා කියලා විශ්වාස කරන්නේ නැති මනුස්සයෙක්, පින්වතුනි මොකටද මැරෙන්නෙ බය? ඉතින් මැරුනහම ප්‍රශ්න ඔක්කොම ඉවරයිනේ. ඉපදිච්ච නිසා නෙවෙයිද පින්වතුනි මෙච්චර කල් විඳපු හැම දුක් ගැහැටක්ම විදින්න සිද්ධ වුණේ. කොටින්ම පින්වතුනි මැරෙන්න සිද්ධ වෙලා තියෙන්නේ ඉපදිච්ච නිසා නෙමෙයිද? අපි එයාගෙන් අහනවා... වැරදිලාවත් ආයේ ඉපදෙන්න උනොත් එහෙම? අනේ කොච්චර ශෝක්ද. ඉතින් මැරෙන්න සිද්ධ වෙනවා නේ, ඔව්, මැරෙන්න නම් බයයි. බලන්න, කොච්චර වැරදිලා ද කියලා පින්වතුනි. ඒකයි,

ඒ නිසා ඔබ තේරුම් ගන්න ඕන පින්වතුනි මේ ආර්යත්වය කියලා කියන්නේ ඔබ තුළින් දැක ගන්න ඒක. ඔබ කොයිතරම් දුරට ආර්යද කියලා, ඔබ තුළින් දැක ගන්න. මොකද ඕක පොතක පතක කියෙව්වා කියලා, ඒක හරියටම අවබෝධ කරගන්න අමාරුයි පින්වතුනි. ඒ කියන්නේ ආර්යයෝ ප්‍රිය කරන දේවල්, අනාර්යයෝ ප්‍රිය නොකරයි, පින්වතුනි ඕකත්, ඔය ඔය කියන ස්වභාවය තේරෙන්නෙ කාටද? ආර්යයෝ නැත්නම්, අනාර්යයෝ ප්‍රිය කරන දේවල්, ආර්යයෝ ප්‍රිය කරන්නෙ නෑ කියන ස්වභාවය, ඒ වචන ටික තේරෙනවා තමයි ඕන කෙනෙක්ට. සිංහල තේරෙන ඕන කෙනෙක්ට ඒ වචන ටික තේරෙන්වා. නමුත් ඔය කියන ස්වභාවය, මොනාටද අනාර්යයෝ ප්‍රිය කරන්නේ. ඉතින් මං ඒවට ප්‍රිය කරන්නේ නැතේ. පින්වතුනි ඔන්න ඔය කියන එක තේරෙන්නේ, ආර්ය බවට පත් වෙච්ච කෙනෙක්ට නේද... ඇත්තටම ඕක අවබෝධ වෙන්නේ?

දැන් මුහුදෙ ඉන්න මාලුවෙකුට කියන්න පුළුවන් ගොඩබිමේ තියෙනවා කියලා පොල් ගස්? කියන්න පුළුවන්. එයාට ඒක කටපාඩම් කරගන්නත් පුළුවන්. පොල් ගස් කියලා කියන්නේ මෙන්න මේ වගේ එකක් කියලා ඒක හිතා ගන්නත් පුළුවන්, චිත්‍රයක් මවා ගන්නත් පුළුවන්, නමුත් ඇත්තටම ඒක තේරෙන්නෙ කොයි වෙලාවෙ ද? ඇත්තටම තේරෙන්නේ පින්වතුනි ගොඩබිමට ආපු දවසක නේද? ඒ කියන්නේ කවදාවත් මාලුවෙකුට ඕක තේරෙන්නෙ නැනෙ. එහෙනම් එක්කෝ මාළුවාට කකුල් දෙකක් එන්න ඕනේ. ඒහෙම කරල එළියට ඇවිල්ල පීනන්න පුළුවන් වෙන්න ඕනේ. ඒ කියන්නේ පින්වතුනි අර භූමියට අඩිය තියන්න ඕනි. ඉතින් අපේ උපමාවේ හැටියට උපමේය ගලපල බැලුවොත් අනාර්ය භූමියේ ඉඳන් ආර්ය භූමියට අඩියක් තියන්න ඕනේ. ආන් එදාට නේද පින්වතුනි තේරෙන්නෙ, මේ මරණය කියන එකට නෙමෙයි අපි බය වෙන්න ඕනි, ජාතියටයි බය වෙන්න ඕනේ, නැත්නම් ඉපදීමටයි බයවෙන්න ඕනේ කියලා.

දැන් ඔබ පොඩ්ඩක් කල්පනා කරලා බලන්න මේ කියන කරුණු පින්වතුනි. අද ඔබ ජීවිතේ එක එක වයස් කාණ්ඩවල ඇති. තරුණ පිරිසක් ඇති. ඊටත් වඩා තරුණ පිරිසක් ඇති. මැදි වයසට පත් වෙච්ච පිරිසක් ඇති. මහළු වයසට පත් වෙච්ච පිරිසක් ඇති. නමුත් ඔබ හැමෝටම ජීවිතයේ මේ වෙනකොටත් පින්වතුනි, දඬුවම් ලැබිලා නැද්ද? ඒ කියන්නේ අම්මා ගහපු එක නෙමෙයි, ටීචර් ගහපු එක නෙමෙයි. ඉපදිච්ච නිසා දඬුවම් ලැබිලා නැද්ද? කොටින්ම ඔබට තේරෙන්නේ නැද්ද පින්වතුනි මේ ඉපදීම කියලා කියන්නේ කොටින්ම ඔබව වධකාගාරයකට අරන් යාමක් කියලා. මොකද වධකාගාරයට අරන් ගියාට පස්සේ පින්වතුනි කොයි වෙලාවෙද දන්නෑ වදකයෝ ඇවිල්ලා වද දෙන්නේ. ඉපදෙනවා කියල කියන්නෙත් පින්වතුනි වධකාගාරයක් ඇතුලේ ඔබව දාන එක නෙමෙයිද?

පොඩ්ඩක් හිතන්න මං මේ කියන දේවල් ගැන. මේ ඔබට වෙච්ච දේ මං මේ කතා කරන්නේ පින්වතුනි. ඔබට වෙලා තියෙන දේ. මේ එහා පැත්තේ ඉන්න මනුස්සයට වෙලා තියෙන දේ ගැන නෙමෙයි මේ හිතන්නේ, මේ කතා කරන්නේ. ඒ නිසා ඔබ හිතන්න නරකයි "අර හාමුදුරුවෝ කියන එක අහගන්න, ඔය කියන එක" එතනට යන්න එපා පින්වතුනි. මොකද එයාට ඕනෙ නැති නිසා නේ දැන්ම අහගන්නෙ නැත්තෙ. ඔබ අහගන්නකෝ මේ කියන දේ.

ඔබ හිතලා බලන්න ඔබේ ජීවිතයට දාලා. මේ ඉපදෙනවා කියල කියන්නෙ, වධකාගාරයකට ඔබව දානවා නෙමෙයිද පින්වතුනි? වද නෙවෙයිද ඔය දෙන්නෙ? බලන්න ඔය කයක් හම්බවෙලා ඔබ විදින දුක, කොච්චරක්ද කියලා, කෙළවරක් නැතිව. ඔබේ ඇඟේ කොතනද දැන් මේ වෙනකොට අසනීපයක් වෙලා නැත්තේ? සාමාන්‍යෙන් ඔබ මැදි වයස වගේ පහු වෙලානම්, ඉන්නේ මේ වෙනකොට. සාමාන්‍යෙන් අවුරුදු පනහ හැට වගේ වයස එද්දී, ඔබේ ඇඟේ කොයි කොටසද ඔබට කියන්න පුළුවන් මේක නම් අනේ ඇස්වහක් කටවහක් නෑ යාන්තම් පාඩුවේ ඉන්නවා කියලා ඔබට කොයි කෑල්ල ගැන ද පින්වතුනි ඔබට කියන්න පුළුවන් ඔබේ ඇඟේ තියෙන..? කට ඇරලා බලන්න පින්වතුනි දතක් ගැනවත් එහෙම කියන්න පුළුවන්ද කියලා. පිටිපස්ස අතගාලා බලන්න පින්වතුනි කොණ්ඩ, කොණ්ඩ ගැනවත් ඔබට එහෙම කියන්න පුළුවන්ද කියලා. ඔලුව අල්ලලා බලන්න පින්වතුනි හිස් කබල ගැනවත් එහෙම කියන්න පුළුවන්ද කියලා. කකුලක් අල්ලලා බලන්න පින්වතුනි, හැමතැනම ඕකේ තුවාල නැද්ද කියලා. පොඩ්ඩක් කල්පනා කරල බලන්න පින්වතුනි ඔබ අදටත් බෙහෙත් පෙති කීයක් ගන්නවද දවසකට? ඔය ඔක්කොටම හේතුව මරණයද? ඔබ මැරිච්ච නිසා, ඒ කියන්නේ ගිය අත්භවයේ මැරිච්ච නිසාද පින්වතුනි අද මේ අත්භවයේ දුක් විඳින්නේ? හිතල බලන්න. ඔබ මේ අත්භවයේ දුක් විඳින්නේ, ගිය අත්භවයේ මැරිච්ච නිසාද?

ඔබේ දරුවාට අවැඩක්, ඔබේ දරුවාට මොකක් හරි හිංගියක්, හිංසාවක් වුනොත් ඔබට දුකයි. මහත්තයට මොකක් හරි කරදරයක් වුණොත්, ඒත් දුකයි. අම්මට ප්‍රශ්නයක් වුනොත් ඒත් දුකයි. දුවට ප්‍රශ්නයක් වුනොත් ඒත් දුකයි. රස්සාව නැති වුනොත් ඒත් දුකයි. කොරෝනා ආවොත් ඒත් දුකයි. කන ගමන් දිව හැපුනොත් ඒත් දුකයි. හිතල බලන්න, ඉතින් මේ ඔක්කොම අස්සෙ පින්වතුනි, ඔය ඔක්කොටම හේතුව ඔබ ගිය අත්භවයේ මැරිච්ච එකද? එහෙම නැත්නම් පින්වතුනි මේ අත්භවයේ ඉපදිච්ච එකද? හොඳට කල්පනා කරලා බලන්න.

දැන් ඔබට මේ වීඩියෝ එක බලාගෙන යද්දි පින්වතුනි සමහරවිට අවස්ථා කීපයකදී පෙනෙයි වීඩියෝ කෑලි දෙකක් එකට බද්ධ කරල වගේ. ඒක ඇත්තට මෙහෙම වෙනවා, සංස්කරණය කරද්දි එහෙම කරන්න සිද්ධ වෙනවා, මොකද මේ, මේ රෙකෝඩින් එක කරන්නේ මහා වර්ෂාවක් මැද්දේ. එතකොට ඒ වර්ෂා ශබ්දයට ඔබට දේශනාව කොච්චර හොඳට රෙකෝඩ් කරත් ඇහෙන්නැති වෙයි වටපිටේ තියෙන ශබ්ද බාධක නිසා කියලා අපි හිතල, දේශනාව එතනින් තාවකාලිකව නවත්වනවා. ඊට පස්සේ වැහැලා ඉවර උනාට පස්සේ ආයෙ දැන් එතනින් දේශනාව ඉස්සරහට කරගෙන යන්න ඕනි.

දැන් ඔබටම මතක ඇතිනේ අපි දේශනා කරනකොට පොඩ්ඩක් ඇවිල්ලා බන අහගෙන ඉද්දි සමහර වෙලාවට වෙන track එහෙකට වැටුනොත් එහෙම ඔබෙන් අහන්න වෙනවා කොතනින්ද නැවැත්තුවේ කියලා. දැන් එහෙම අහන්න අද කවුරුත් නෑ. එතකොට හැබැයි ඔබට දේශනාවේ වෙනසක් දැනෙන්නෙ නැති වෙන්න මේක කරන්නත් ඕනේ. ඒ වගේම ඔබට දේශනාව හොඳට ඇහෙන්නත් ඕනේ. ඒකයි පින්වතුනි අපි කිව්වේ, මේ මේක ඒ තරම් ලේසි වැඩක් නෙමෙයි. නමුත් අපි විශ්වාස කරනවා ඔබ මේකෙන් උපරිම ප්‍රයෝජනය ගන්නවා ඇති කියලා. ඒ නිසා මේ දැන් සුළු

මොහොතකට කලිනුත් ටිකකට දේශනාව නවත්වන්න සිද්ධ වුණා, නැත්නම් මේ ඔබට සුපුරුදු පුස්තකාල පරිශ්‍රයේ ඉඳගෙන මේ දේශනාව පටිගත වෙන්නේ. ඔබ බොහොම දන්න කියන තැන. ඔබේ ආරාමයේ. ඔබ හැමෝම ඇවිල්ලා, ඔබ හැමෝම වගේ ඇවිල්ලා බණ භාවනා කරපු තැන. ඉතින් ඔබට නුහුරු තැනක් නෙමෙයි මේ. ඔබට හොඳට දහම වඩා ගත්ත තැනක්. ඔබ හොඳට පින් රැස් කරගත්ත තැනක්. එනිසා ඔබේ දහම් අවබෝධයට ගෝචර දහම අවබෝධ වෙන, දහම ගෝචර වෙන කදිම ධර්මස්ථානය තමයි පින්වතුනි මේ. ඉතින් ඒක නිසා අපි ඒ ගොඩක් දේවල් බලලා තමයි ඒ තැන් තෝරාගන්නේ.

ඉතින් ඒ නිසා ඒවගේම මේක පිටිපස්සේ ලොකු කතන්දරයක් යනවා. ඒ නිසා ඔබ හැමෝම උත්සාහ ගන්න ඕනි පින්වතුනි, ඒකයි පටන් ගන්නකොට වටිනාකම තේරුම් කරලා දුන්නේ. මේ හැම දෙයක්ම පින්වතුනි හැදිලා තියෙන්නේ ඔබේ වැඩේ කරගන්න. අන්තිමට ඉතුරුවෙලා තියෙන්නේ ඔබ වැඩේ කරගන්නවද, නැද්ද කියන එක විතරයි.

ඒක හරියට නිකං දරුවෙක් ඉපදෙනවා පින්වතුනි මහා ධනවත් පවුලකට. මුදලින් හදලින් කිසිම අඩුවක් පාඩුවක් නෑ. හොඳ අම්ම තාත්ත දෙන්නෙක්. ඉගෙන ගන්න ඒවාට අවශ්‍ය ගුරුහරුකම් ලබා දෙන්න ඇති පදම් පිරිස ඉන්නවා. කෑමෙන්, බීමෙන් අඩුවක් නෑ. ඉඳුම්හිටුම් වලින් අඩුවක් නෑ. කිසිම දේකින් අඩුවක් නෑ. ඔබ හිතලා බලන්න පින්වතුනි අන්තිමට මේ මනුස්සයාගේ ජීවිතයේ එයා මැරෙනකොට හිඟන්නෙක් වෙලා මැරුණොත් එහෙම. මතකනේ මහදැන සිටුතුමා. අන්තිමට මැරෙනකොට පින්වතුනි හිඟන්නෙක් වෙලා මැරුණා. අන්තිමට මැරුනොත් කාලකන්නියෙක් වෙලා මැරුණොත්. අන්තිමට මැරුනොත් තමන්ට කියලා කිසිම දෙයක් කරගත්තේ නැති, ලෝක සත්වයාටත් යහපතක් කරපු නැති, ඔහේ බත් ගිල ගිල ඉඳලා, නිකං අර, නිකං හම්බවෙච්ච හුස්ම ටික නිසා ඒ ටික හුස්ම ගත්ත, ඔහේ පාවිච්චි කරල දාපු කෙනෙක් වෙලා මැරුනොත්, නිකං මේ මහ පොළොව උඩ අඩියක් ගහලා ඉන්න බිම්කඩක් හම්බවෙච්ච නිසා ඔහේ පාවිච්චි කරලා... නිකං හම්බවෙච්ච පත්තරේ කියවනවා වගේ, අන්න එහෙම ජීවිතයක් ගත කළොත් පින්වතුනි මොනතරම් හිස් ජීවිතයක් වෙනවද ඒක.

ඒකයි මතක් කරලා දුන්නේ සුගතියක් කියලා කියන්නේ පින්වතුනි ඔබට මේ මනුෂ්‍ය ලෝකයේ පය ගහපු පලියට ඔබ ඕක සුගතියක් කියලා විශ්වාස කරන්න එපා. පින්වතුනි සුගතියක් කරගන්න මේක. අන්න ඒ එතන ඔබ හැම වෙලාවෙම හිත තියාගන්න. ඔබ මේ ලැබිච්ච අවස්ථාව, සුගතියක් කරගන්න. මේක automaticaly සුගතියක් උනා කියල හිතන්න යන්න එපා. එහෙම හිතන එකෙන් ඔබට අවාසියක් වෙන්නෙ. ඒකයි එහෙම හිතන්න එපා කියලා කියන්නේ.

කෙනෙක් තර්ක කරයි, එහෙම කොහොමද කියන්නේ, මේක සුගතියක්නේ. මනුෂ්‍ය ලෝකය කියලා කියන්නේ සුගතියක්නේ. ඔබ වහන්සේට ඕන ඕන දේවල් එහෙම කියන්න පුළුවන්ද...? පින්වතුනි මං මේ තර්කයක් ඉදිරිපත් කරනව නෙමෙයි. අං පටලවා ගන්න කරුණක් ඉදිරිපත් කරනවත් නෙමෙයි, පින්වතුනි. මේ කියන්නේ ඔබට ඔබේ ජීවිතයේ වටිනාකම තේරුම් යන්න කාරණාවක්. ඔබට ඔබේ ජීවිතයේ වටිනාකම තේරුම් යන්නේ පින්වතුනි, ඔබ ගිය අත්භවයේ අසූචි කන පෙරේතයෙක් වෙලා... මං

ඔප්පු කරල පෙන්නන එක තුළින් නම්, හරි එහෙම හරි ඔප්පු කරල කෙසේ වෙතත් එහෙම කියන එක තුළින් නම් පින්වතුනි, ඔප්පු කරා, නැතා, එහෙනම් එහෙම කියන එක නෙමෙයිද වටින්නේ? එතකොට නෙමෙයිද ඔබට ඒ වචන ටික ඇහුනාට පස්සෙ නම් හිතෙන්නේ අනේ හත්දෙයියනේ මං කොහොම හරි මගේ මග වඩා ගන්න ඕනේ, නැත්නම් මට නම් බෑ ආයෙ මළ පෙරේතයෙක් වෙන්න. ඉතින් ඔබ ගිය අත්භවයේ මල පෙරේතයෙක් වුණා කියලා කියන එක නේද පින්වතුනි ඔබට කරන ලොකුම යහපත. ආං ඒ නිසා තමයි පින්වතුනි, ඔබ සතර අපායෙ ගත කරපු ජීවිතය ගැන අපි කියන්නේ. ඔබ ගිය අත්භවයේ කොහෙද මැරිලා, ඔබ ගිය අත්බවයේ කොහෙද ඉපදිලා හිටියේ කියලා පින්වතුනි මට පේන්නේ නෑ. නමුත් අපි කියනවා නේද? ඔබත් ගිය අත්භවයේ මෙහෙම හිටියා ඇති නේද? ඔබත් අනිවාර්යයෙන් සතර අපායේ නේද වැඩි කාලයක් ජීවිතය ගත කළේ. ඒවා කියන්නේ පින්වතුනි එහෙම කියන කොට නම් ඔබට මේ මනුෂ්‍යත ජීවිතයෙන් ප්‍රයෝජනයක් ගන්න හිතෙන්නේ. ඉතින් එහෙනම් එහෙම කියන සේක්වා කියලා පිංවතුනි පෙරලි පෙරලි වඳින්න නේද ඕනේ? මොකෙන් හරි කමක් නෑ, කොහොමහරි කමක් නෑ පින්වතුනි, ඔබට ඔබේ වැඩේ කරගන්න අවශ්‍ය කරන පරිසරය හැදෙනවා නම්, ඒ මදෑ. ඒක නේද බලාපොරොත්තු වෙන්න ඕනේ. ඉතින් ඒකයි.

ඒ නිසා ඔය කිසිම දෙයක් පින්වතුනි තර්ක වාද වලට දාගෙන, ඔහේ නිකං අර තමන්ට නිකං හම්බවෙච්ච හුස්ම පොද කොහොමහරි ගෙවා ගන්න ඕනේ කියලා හිතා ගත්ත පිරිස් ඇති පින්වතුනි,...ඔබ ඒ අයත් එක්ක ගැටෙන්න යන්න එපා. ඒ අයත් එක්ක තර්ක වාද ඉදිරිපත් කරගන්න යන්න එපා. මේ දහමත් එක්ක හැප්පෙන්න යන්න එපා පින්වතුනි, දහම තියෙන්නෙ හැප්පෙන්න නෙමෙයි. දහම තියෙන්නෙ තමන්ව නිවාගන්න. තර්ක කරන්න නෙමෙයි දහම තියෙන්නෙ. දහම තියෙන්නේ ඔබව නිවාගන්න. ඔබ නිවාගන්න. අන්න ඒ නිසා එහෙම කටයුතු කරන්න ඕනි, එහෙම කල්පනා කරගන්න.

එතකොට මං තව පුංචි කාරණාවක් ඔබට ඉදිරිපත් කරන්නම්, ඔබට හිතලා බලන්න පින්වතුනි දැන් අපි කතා කරා සමහර මිනිස්සු විශ්වාස කරනවා කියලා මේ නැවත උප්පත්තියක් නැහැ කියලා. එතකොට ආන් ඒ මිනිස්සුන්ගෙත් ඇහැව්වාත් ඒගොල්ලො ගෙන් ඇහැව්වොත් ඉපදෙන්නද බය, මැරෙන්නද බය? කියලා, ඒ මිනිස්සුත් කියන්නේ මැරෙන්න බයයි කියලා. ඉතින් කොච්චර තේරුමක් නැති කතාවක් ද කියලා හිතල බලන්න. දැන් හැබැයි අනිත් පැත්තෙන් බලන්න පින්වතුනි ඒ මිනිස්සුන්ගෙන් ඇහුවොත් මැරෙන්න කැමතිද? නෑ මැරෙන්න කැමති නෑ. ඇයි ඒ? අපි කැමති සතුටින් ඉන්න. ඒ කියන්නේ ඒ මිනිස්සු මැරෙන්න බයයිනේ. සාමාන්‍යන් දහමක් අවබෝධ නොකර ගත්ත හැමෝම පින්වතුනි මැරෙන්න බයයි. හරි මං මේ ඉතින් කියන්නේ විශේෂයෙන් අර දැන් ඔබට හම්බවෙයි ඔය වගේ මිනිස්සු. අපේ ජීවිත වලත් ඕන තරම් හම්බ වෙලා තියෙනවා. ඒ කියන්නේ ඒ ගොල්ල කරන්න කැමති තර්ක ඉදිරිපත් කරන්න. කිව්වොත් එහෙම ගිය අත්භවයේ මල පෙරේතයෙක් වෙලා තමයි හිටියෙ කියලා, ඔප්පු කරහන්, නැත්නම් මං පිළිගන්නේ නෑ. ඒ කියන්නේ එයාට යහපත කරන්න අපි එයාට ඔප්පු කරලා පෙන්නන්න ඕනෙ. දැන් ඔබ එයාට ඒක ඔප්පු කරල, අපි කියමු ඇත්තටම එයා මල පෙරේතයෙක් තමයි කියලා, ඉතින් ඒක ඔප්පු කරලා පෙන්නන්න බෑ තමයි. ඔබට ඒකට සාක්ෂි නෑ. ඔබට ඒක එහෙම හරියටම සනාථ කරන්න ක්‍රමයක් නෑ. නමුත් මේ අත්භවයේ ඕන තරම් එයා එහෙම වෙලා

තියෙනවා, ගිය අත් භවයෙත් මළ පෙරේතයෙක් තමයි. දැන් මේ මනුස්සයා ඒක විශ්වාස කරන්න කැමති නෑ. එයා විශ්වාස නොකරන එකෙන් පින්වතුනි අවැඩක් වෙන්නේ, ඔබට ද? නැත්නම් ඒ මනුස්සයට ද?

දැන් ඔහොම කර කර හිටියොත් එහෙම exame එක පාස් කරගන්න හම්බ වෙන්නේ නෑ. ගිහිල්ලා තමන්ගේ පාඩමක් කරගන්න. නිකන් කාලේ නාස්ති කරගන්න එපා. කියලා, කෙනෙක් කියනවා පින්වතුනි දරුවෙකුට. කවුරුහරි ළමයෙකුට කියනවා. කාලේ නාස්ති කරන්න එපා මනුස්සයෝ, ගිහිල්ලා පාඩම් කරගන්න. ඔය මොකක්ද ඔය කරන්නේ. ටීවී එක බල බල ඉන්නේ. දැන් ඒ ළමයා අහනවා එහෙම වෙන්නේ කොහොමද? ඔප්පු කරල පෙන්නනන්න. එහෙම වෙනවා කියලා. ඔප්පු කරල පෙන්නුවෙ නැත්නම් මම යන්නේ නෑ පාඩම් කරන්න, මං මෙහෙමම මෙහෙම ඉන්නවා. පින්වතුනි, ආන් ඒ වෙලාවට මොකක්ද කරන්න තියෙන්නේ? මොකද පින්වතුනි ඔබ එයාට ඒක ඔප්පු කරලා පෙන්නුවොත්, අපි හිතමු ඔප්පු කරලා පෙන්නුවා කියලා, දැන් ඒකෙන් යහපත වෙන්නේ කාටද? ඒ මනුස්සයට. ඔප්පු කරල පෙන්නනන්න බෑ. නමුත් ඇත්ත ඒක. එහෙනම් ඔප්පු කරලා පෙන්නනන්න පුළුවන් වුණා නැතා පින්වතුනි, ඒක පිළිගන්න එකෙන් යහපත වෙන්නේ කාටද? ඒ මනුස්සයාට.

බලන්න පින්වතුනි මේ මනුස්සයන්ගේ මේ ලෝකේ ජීවත් වෙන මනුස්සයන්ගෙන් වැඩි හරියකට යහපත කරන්න කොච්චර අමාරුද කියලා. අර කතාවක් කියන්නේ පිංවතුනි නරක වැඩ කරන්න ලේසියි, හොඳ වැඩ කරන්න අමාරුයි කියලා. ඔබ දන්නවාද ඒකෙන් වැඩි හරියක්ම හේතුව මොකක්ද කියලා? මේ ලෝකෙ ඉන්න මිනිස්සුන්ට යහපත කරන්න ඒ මිනිස්සු ඉඩ දෙන්නේ නෑ. හම්බ වෙලා නැද්ද ඔබට ඒ වගේ මිනිස්සු? යහපත කරන්න පින්වතුනි ආයෙ, හරියට වහ කන්න යනවා වගේ. පින්වතුනි යහපත කරන්න ඉඩ දෙන්නෙම නැනේ. මොකද ගොඩක් වෙලාවට අර තර්ක වාද ඉදිරිපත් කරනවා. ඒවා තමයි එළියට දාන්නේ. ඉතින් ඔබට සමහරවිට ඒ වගේ මිනිස්සු හම්බවෙයි. සමහර විට පින්වතුනි, ඔබයි අපිත් ඒ වගේ ඉන්න ඇති. අපිට අද තේරෙනවා නේද...? ඉතින් අපේ මැටි මෝල් කම නිසා කියලයි ඒ? අපේ මෝඩකම් ඒවා. ඒ නිසා පින්වතුනි කවුද දුක් වින්දෙ? අපට යහපත කියලා දෙන්න ආපු මනුස්සයාද නැත්තම් අන්තිමට අපිමද දුක් වින්දෙ? ඉතිං... ඒකයි ඉතින්.... අනුකම්පා කරන්න ඕනේ පින්වතුනි ඒ වගේ මිනිස්සු දැක්කහම.

නමුත් ඔබත් ඒ වගේ හෝ ඊට සමාන අදහස් තියෙන කෙනෙක් නම් පොඩ්ඩක් තේරුම් ගන්න පින්වතුනි. පොඩ්ඩක් අර තමන් බොහොම දැඩි ලෙස අරන් තියෙන මත වාද, විශේෂයෙන් දහමක් දේශනා වෙන වෙලාවක, දහමක් ශ්‍රවණය වෙන වෙලාවක පින්වතුනි, ඔබ හැමවෙලාවෙම මේ දහමත් එක්ක ගැටි ගැටී "මම දන්න එක පුලුවන් නම් වැරදියි කියලා ඔප්පු කරල පෙන්නනන්න, නැත්තං ඔබවහන්සේ ඔය කියන එක ඔප්පු කරල පෙන්වන්න". පින්වතුනි ඔන්න ඔතන... ඉන්න එපා. ඒ අය ටක් ගාලා ඕකට දාගන්න කතාව තමා පින්වතුනි "බුදුහාමුදුරුවොත් කියලා තියෙනවානේ අර කාලාම සූත්‍රයේ..., කියන දේ කියන ඒ පලියට විශ්වාස කරන්න එපා, ගුරු පරපුරෙන් ආව කියලා විශ්වාස කරන්න එපා, පොතේ තිබ්බා කියලා විශ්වාස කරන්න එපා, තර්ක වාදයට ගැළපෙනවා කියලා විශ්වාස කරන්න එපා", පින්වතුනි බලන්න හොඳට කල්පනා කරලා, ඔය එක එක ජාතියේ තර්ක වාද ඉදිරිපත් කරන මිනිස්සුන්ට මේ

ත්‍රිපිටකයේ මෙච්චර සූත්‍ර තියෙනවා, 84000ක් සූත්‍ර තියනවා මේ ත්‍රිපිටකයේ, ඔච්චරයි නේද හම්බෙලා තියෙන්නෙ, කාලාම සූත්‍රය විතරයි ඒ ගොල්ලන්ට අහු වෙලා තියෙන්නේ, එකම සූත්‍රයයි. බලන්න පින්වතුනි මොන කරුමක්කාරයෝද කියලා. වෙන එක තැනකින් හරි අහලා බලන්න. ධම්මචක්ඛපවත්තන සූත්‍රය එහෙම දන්නවා නම් කියන්න බලන්න. ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ මොනවද බුදු හාමුදුරුවෝ දේශනා කළේ?, ඒවා දන්නෙ නෑ. සච්චවිභංග සූත්‍රය? දන්නෙ නෑ. ආලවක සූත්‍රය? ඒ දන්නෙත් නෑ. මොකුත් දන්නේ නෑ. දන්න එක සූත්‍රයක් තියෙනවා හැබැයි: "කාලාම සූත්රතය". ඒකත් සූත්‍රය දන්නේ නෑ. නමුත් කාගෙන් හරි අහගත්ත ටිකක් තියෙනවා. ඒ නිසා මොකද කරන්නේ ඔක්කොටම කලින් පින්වතුනි අන්න ඒක දාගන්නව ඉස්සරහට. ඒ කියන්නේ අර shield එකක් දාගන්නවා, filter එකක් දාගන්නවා ඉස්සරහට. ඵලකයක් දාගන්නවා ඉස්සරහට පින්වතුනි. අර යුද්දෙට යන සෙබළු අරන් යන්නේ අතේ.

දැන් මේ බේරන්න හදන්නේ කාවද? ඒ කෙනාවමයි. ඒ කෙනාව බේරන්න තියෙන ලොකුම බාධකය මොකක්ද? ඒ කෙනාමයි. අන්න ඒකයි පින්වතුනි, මේ දහම තුළ යන්න ඕනේ විදිහ හරි වෙනස්. පින්වතුනි අනිත් ලෝක ශාත්‍ර වලට වඩා. ඒ නිසා ඔබත් මේ අතර ඉන්නවා නම්, දැන් සමහර විට මේ දේශනාව ඔබට අහම්බෙන් අහන්න හම්බෙන්නෙ. නිකං youtube එකේ ඔය මොකක් හරි වීඩියෝ එකක් බල බලා ඉන්න ගමන් ඔබට හම්බවෙනවා මේ දේශනාව. දැන් ඔබ ඒක ගන්නවා අහන්න. ඒ අතර ස්වාමීන් වහන්සේ කියන සමහර දේවල් එක්ක ඔබ ගැටෙනවා. "එහෙම කොහොමද සතර අපායක් තියෙන්නේ. පෙන්නපංකො සතර අපායේ යන හැටි". මං කියන්නේ පින්වතුනි. වැරදිලාවත් මේ කියන කතාව ඇත්ත නම්? පොඩ්ඩක් හිතල බලන්න. වැරදිලාවත් මේ කියන කතාව ඇත්ත නම්? දැන් ඔබට කිව්වොත් එහෙම සුනාමියක් එනවා කියලා ඔබ තර්ක කර කරා ඉන්නවද "පුළුවන් නම් ඔප්පු කරල පෙන්නන්න සුනාමි එනවා කියලා".මේ අනික් මිනිස්සු ඔක්කොම දුවනවා. ඔබ එතෙන්ට වෙලා බලන් ඉන්නවා. "ඔප්පුකරල පෙන්නන්න සුනාමියක් එනවා කියලා, නැත්තං මං හෙල්ලෙන්නේ නෑ". සුනාමියක් ආවේ නැත්නම් හොඳයි. පාඩුවක් නෑ. සුනාමියක් ආවොත්? ඉතිං කෝකටත් හොඳයි නේද පින්වතුනි ඇඟට ගුණයි නේද, එන්න පුලුවන් කියලා හිතාගෙන එතනින් අයින් වෙලා යන එක. දැන් ඔබ හිතලා බලන්න පින්වතුනි මිනිස්සු සල්ලි ඉතුරු කරන්නේ ඇයි? සමහර විට මේ දරු මල්ලො ඉන්න මිනිස්සුත් සල්ලි ඉතිරි කරන්නෙ නැද්ද?

(මං මේ කියන්නෙ පින්වතුනි, දැන් මේ මං දන්නවා වෙනම පැත්තක් මේ අපි කතා කරන්නේ, නමුත් දන්නෑ මේ ටික අහන්න කෙනකුත් ඇති ඔබ අතරේ. එක්කෙනෙක් හරි ඇති. නැත්නම් මේවා නිකං එන්නේ නැනේ.)

හරි දැන් හිතලා බලන්න ඔය විදියට එක එක තර්ක වාද ඉදිරිපත් කරන මිනිස්සු සල්ලි ඉතුරු කර ගන්නේ නැත්ද? ඇහුවොත් කියන්නේ "නෑ ඉතින් අපි..."(ඒ ගොල්ලන්ට දරු මල්ලොත් ඉන්නවා. පුතා ඕස්ට්රේ‍්‍රලියාවේ. දුව එංගලන්තෙ. අනෙක් දුව කැනඩාවේ. ඉතින් හොඳට ඉගෙන ගත්ත දරුවො. ඒගොල්ලොත් ඉන්නවා. හැබැයි

බැලුවහම ඒ ගොල්ලොත් තාම සල්ලි ඉතිරි කරනවා. මේ ජෝඩුව, නාකි ජෝඩුව සල්ලි ඉතිරි කරනවා. ඇයි කියලා ඇහුවොත්) "නෑ ඉතින් එහෙම ගියාට ඉතින් අපේ දරුවෝ අපිව දවසක බැලුවෙ නැත්තං එහෙම". ඉතින් ඇයි ඒකට විතරක් එහෙම කල්පනා කරන්නේ? ඉතින් ඒකටත් කියන්නකෝ ඉතිං ඔප්පු කරල පෙන්නහං කියලා. "අපේ දරුවෝ අපිව බලාගන්නේ නෑ කියලා ඔප්පු කරලා පෙන්නුවොත් අපි සල්ලි ඉතිරි කරන්නම්. නැත්තං අපි සල්ලි ඉතිරි කරන්නේ නෑ. මොකටද නිකම් මහන්සි වෙන්නේ". පින්වතුනි, එහෙම හිතන් නෑ නේද පින්වතුනි?

ඒ වෙලාවට එහෙම හිතන්නේ නෑ. ඒකයි කියන්නේ. ඒක තමයි මේ ලෝකෙ මිනිස්සුන්ගේ කරුමෙ. අන්න ඒව නම් පින්වතුනි, අකුසල් වල විපාක. සසරෙ කරගත්ත අකුසල කර්මයන්ගේ විපාකයන්. එයාට හිතෙන්නේ නැති එක, ඒ කියන්නේ තමන්ට යහපත වෙන පැත්තට හිතෙන්නේ නැති එක, ඒ තියෙන්නේ ඒ අය සසරෙ කරගත්ත අකුසල වල් වල විපාක. ඒ කියන්නේ එක එක මිනිස්සුන්ට අංචි ඇදපුවා, තව මනුස්සයෙක් යහපතක් කරගන්න යද්දී ඒ මනුස්සයාට යහපත කරගන්න ඉඩ දෙන්නේ නැතුව ඒ මනුස්සයාට මොකක් හරි වැරැදි දෘෂ්ටියක් දැම්මා. මනුස්සයෙක් මොකක් හරි ව්‍යාාපාරයක් හරි මොකක් හරි යහපතක් කර ගන්න හදන කොට, තමන් දියුණු වෙන්න උත්සාහයක් උනන්දුවක් නෑ, ඒ නිසා තව මනුස්සයෙක්ගේත් අර ගත්ත වීර්යදය, හිතට ගත් අදහස සම්පූර්ණයෙන් විනාශ වෙලා යන්න, එයාගේ වීර්යයය බාල වෙලා යන්න මොකක් හෝ වචනයක් දැම්මා. මේ සසරේ කර ගත්ත ඒවා පින්වතුනි. ඔබ අපි හැමෝම.ආන් ඒව තමයි පින්වතුනි දැන් මේ යහපත් මගට ඇහැරෙන්න යනකොට, තව කෙනෙක් අපිව යහමගට හරවන්න යද්දි ඒවා වල විපාක කැරකිලා එනවා.

එහෙම නැත්නම් තව මනුස්සයෙක් තව මනුස්සයෙක්ට උදව් කරනවා දැකලා, දැන් ඒ බලන් හිටපු ඔබට එක හරිගියේ නෑ. අර කියන්නේ දිරවන්නේ නෑ කියලා. "මොකද ඒ මනුස්සය මෙයාට විතරක් උදව් කරන්නේ, මට හරියන් නැත්තං තව මිනිස්සුන්ට හරි ගිහිල්ලා හරියන් නෑනේ මේ ලෝකයේ". ඒ නිසා මොකද කලේ, තව මනුස්සයෙක් ඇවිල්ලා තව මනුස්සයෙක්ට යහපතක් කියන වෙලාවේ ඔබ ගිහිල්ලා මොකද කළේ? ආන් ඒ මනුස්සයට කිව්වා "මේ ඔය මනුස්සයා කියන දේ විශ්වාස කරන්න එපා. ඔය කිව්වට ඇත්තද කියලා කවුද දන්නේ" දැන් පින්වතුනි ඔහොම ඔය කරපු ඒවල විපාක දැන් කැරකිලා එනවා. මොකද ඔබ ඒ කියපු වචනය ටික අහ ගත්ත මනුස්සයාගේ ජීවිතේට යහපතක් කරගන්න තිබ්ච්ච චාන්ස් එක සම්පූර්ණයෙන්ම නැති වෙලා ගියා. ඔබ දුන්න දෘෂ්ටිය හරි කියලා හිතාගෙන, අසත්පුරුෂ දෘෂ්ටිය, අසත්පුරුෂ මතිමතාන්තරය හරි කියලා හිතාගෙන පින්වතුනි ඒ පැත්තට කරකවන්න පටන් ගත්තා එයාගෙ ජීවිතය. කරලා එදා ඉඳන් ඒ මනුස්සයාගේ ජීවිතේ විනාසෙ තමා උදාවුණේ. අර යහපත් වචනයක් අහල යහපත කරගන්න තිබ්බ අවස්ථාව අහිමි වෙලා ගියා. කවුරු නිසාද? ඔය කරගත්ත දේ නිසා. ඔබ නිසා. දැන් මොකද වෙන්නේ පින්වතුනි. ඔබට යහපත කවුරු හරි කරන්න උත්සාහ කරද්දී, තව මනුස්සයෙක් වෙන්න ඕන් නෑ, ඔබටම හිතෙනවා පින්වතුනි ඔබේ යහපත ඔබට බ්ලොක් කරගන්න. මොකද පින්වතුනි හිතට ධම්මයක් බහින්නෙත් විපාකයට තමා. ඉතින් ඒකත් කර්මයක විපාකයක් වෙන්න එපැයි. ඔය කරගත්ත අකුසල කර්ම වල විපාක තමයි දැන් ඔය බහින්නේ.

මමත් විද්‍යා සරණ ගිහිල්ලා හිටපු මනුස්සයෙක්. මං හොඳටම දන්නවා පින්වතුනි මේ කියන කතාව. මං හිතන්නේ මට තමා වැඩිපුරම අදාල වෙන්නේ මේ කතාව. මට අදාළයි මේක ඒ ඔක්කොටමත් වඩා. මම දන්නවා පිංවතුනි, මාව එතනින් ගලවගන්න මට කොච්චර උත්සාහයක් ගන්න වුනාද කියල. අද මං මේ ඔබට දේශනා කරන දේවල් ඉස්සර මට කිව්වා නම් එහෙම මම තර්ක කරනවා. "එහෙම වෙන්නේ කොහොමද? සතර අපාය ඔප්පු කරන්නකො". ඒ පින්වතුනි සසරේ කරගත්ත කර්ම වල විපාක විදියට ඔලුවට බහින්නෙම, කෙනෙක් ඇවිල්ලා සතර අපායක් ගැන දේශණා කළොත් එහෙම ඔළුවට ඇවිල්ලා බහින්නෙම ඔය කියන ඒවා කොහොමද ඇත්ත වෙන්නේ? ඕවා බොරු නම්?" ටක් ගාලා පින්වතුනි ඒ ටික ෆිල්ටර් වෙනව. දැන් මේ ඒ මනුස්සයා ඒ ටික කියන්නේ ඇයි? මගේ යහපතට. මට හිතෙන්නෙ මොකක්ද? "ඔය කියන ඒවා බොරු නං". දැං එහෙම හිතෙන එකෙන් අවැඩ වෙන්නේ කාටද? දේශනා කරන උත්තමයන් වහන්සේට ද? නැත්තං තමන්ට ද? දැක්කද එහෙනම් පින්වතුනි තමන්ගේ වල තමන්ට කැපෙනවා. ඊට පස්සේ ආයිත් කපාගන්න දෙයක් නෑ. මොකද කපාගත්ත එක කලින් කලා. දැන් කැපෙනවා.

ඒ නිසා ඔබ පින්වතුනි සැලකිලිමත් වෙන්න. ඒකයි මේ අද දැන් මේ ගොඩක් වෙලාවට කතා කරන්නේ මේ දේශනාවක් තුල ඔබ හැසිරෙන්න ඕන විදිහ, දේශනාවක් හොඳට ශ්‍රවණය කරන විදිය, දේශනාවකට ඔබේ අවධානය දෙන විදිහ. මොකද ඒ ටික මුලින් හදලා ඉන්න එපැයි. ආරාමයට එනකොට හොඳට ඒ ටික අපි ඔබට කෙරෙව්වානේ. කාත් එක්ක වත් කතා කරන්න දුන්නේ නෑ. කොටින්ම, වතුර බෝතලයක් අරින සද්දයක්වත් අපි ඔබට කරන්න දෙන්නෙ නැනෙ ආරාමයට ආවයින් පස්සේ. දේශනාවක් යන වෙලාවේ එකක්වත් බෑ. ෆෝන් ඕෆ් කරගන්න ඕනෙ. මතක ඇති නේද. ආරාමයට මෙතුවක් කල් ආවෙ නැති අයට මේවා හරි අමුතු ඇති. "ඒ මොකද්ද ඒ නීතිය" එහෙම තමා හිතෙන්නේ. ඇයි අර මං කිව්වේ කරගත් ඒවා කියලා. මොකද පින්වතුනි අපි දන්නවා දේශනාවකට බාධා කරොත් ආයි එනවා අනිත් පැත්තට. ඒ නිසා තව කෙනෙක්ගේ දහම් සමාධියට බාධා කරොත් තමන්ගේ දහම් සමාධිය ලබන්න යන මොහොතේ ඒකට බාධා වෙනවා. ඒක නිසා සියලු දෙනාගේ යහපත පිණිස කියනවා ඒවා කරන්න එපා. ඒවා කරන්න එපා. ෆෝන් ගේන්න එපා ආරාමයට. ගෙනාවොත් ඇවිල්ල ඕෆ් කරගන්න. පාවිච්චි කරන්න එළියට ගිහිල්ලා, ඔබේ කටයුතු ඉවර උනයින් පස්සේ. ඔබට මතක ඇතිනේ. ඇතුලේ පින්වතුනි සිලි බෑග් එකක්වත් අරගෙන එන්න බෑ, ඒ එකක්වත් බිම තියලා වාඩි වෙලා, මොකද ඔබ මේ සාලාවේ සිලි බෑග් එකක් ගෙනැල්ලා ඊට පස්සේ ඒක සද්ද කරද්දී අනෙක් හැමෝටම සද්දබද්ද, බාධක. ඉතිං හරි කරදරයි. ඔබ දන්නවා දේශනාවල් මැද්දෙ විවේකයක් ගත්තත් අපි ඔබට කියන්නේ පුළුවන් තරම් කතා නොකර අහගත්ත දහම හොඳට මනසිකාර කරන්න දැන් මේ වෙලාවේ අවස්ථාව ලබා ගන්න.

අර රහතන් වහන්සේලා 500ක් වැඩහිටපු කාලේ පින්වතුනි, ගහෙන් වැටුණු කොලෙත් සද්දේ ඇහුනලු. ඔබට මතක ඇති නේද ගුරු හාමුදුරුවන් වහන්සේ ඔබට මතක් කරනවා " ඔන්න ඔබට දෙවනි විවේකය දෙන්නයි යන්නේ. අරිහතුන් වහන්සේලා මෙහි වැඩඉන්නවා කියලා අපට ඒත්තු ගන්වන්න." ඉදිකට්ටක් වැටෙන සද්දෙ අපිට ඇහෙන්න සලස්වන්න. ඔබ අන්න ඒ විදිහට ඉන්න" කියලා පින්වතුනි

ඔබට දුන්නා අභියෝගයක්. මට මතක විදිහට නම් ඔබ හැමෝම ඒක ඒ විදියටම පිළිගත්තා.

මට මතකයි පින්වතුනි අපේ ආරාමයේ, මං හිතන්නේ පැවිදි පින්කමක් තිබ්බ දවසේ, පිටින් වැඩපු ස්වාමීන් වහන්සේලා පිරිසක් ඔබ ගැන කතා කරා. කතාකරල මොකද්ද කිව්වේ "අපි නම් දැකලා නෑ මේ තරම් හික්මිච්ච පිරිසක්" කියලා. මතකද ඔබට? අපි කිව්වා ඔබට මේ කතාව. උන්වහන්සේලා කිව්වේ "අපි නම් දැකලා නැහැ මේ තරම් හික්මිච්ඡ පිරිසක්". පැවිදි පින් කම ඉවරවෙලා මං හිතන්නේ දානයට ලැස්ති වෙන වෙලාවේ ඒ දානයට සම්බන්ධ වෙන පිරිස, ඒ කියන්නේ ස්වාමීන් වහන්සේලා දන් වළඳලා ඉවරයි දැන්, ආපු උපාසක උපාසිකාවන්ට දානේ ගන්න තියෙන්නෙ. ලස්සනට පින්වතුනි පෝලිමෙන් පෝලිමට පේළියෙන් පේළියට පිරිස පෝලිමකට එකතු වෙලා ගිහිල්ලා දානය ගත්තා. කවුරුත් තමන්ගෙ වාරය එනකං නැගිට්ටෙ නෑ. හැමෝම බොහොම නිහඬව, බොහොම නිශ්ශබ්දව ඒ වෙලාවේ දහම් මනසිකාරයේ යෙදිලා හිටියා. හැමෝම පිංවතුනි පුදුම විශ්මයට පත්වුණා "මොකක්ද මේ වෙන්නේ? කොහොමද මෙහෙම වෙන්නේ? අපි මෙහෙම දේවල් දැකලා නැනේ මීට කලින්". අන්න ඒකයි පිංවතුනි. මහා ශ්‍රේෂ්ඨ පිරිසක්.

ඉතින් එතකොට ඔබ මේ දේශනාවක් අහන වෙලාවේ අන්න එහෙම තමා ඉන්නේ ආරාමයට ආවහම. එහෙම පරිසරයක් ඔබට හදලා දීලා, එහෙම පරිසරයක් තුළ තමයි ඔබට දහම හොඳට අවබෝධ කරගන්න සුදුසුම පරිසරය කියලා ඔබට තේරුම් කරල දීලා පින්වතුනි එහෙම ගත කරපු කාලයක් තිබ්බා. නමුත් දැන් කාලයක් ගත වෙලා ආපහු සැරයක් පරණ පුරුදු එක දෙක දැන් සමහරවිට එන්න පටන් අරන් ඇති. ඒකයි මම මේ ආයිත් මතක් කරන්නේ පින්වතුනි.

තමන් ගෙදර ඉඳගෙන මේක කරගෙන යන්න උත්සහ කරන වෙලාවේ, හොඳට මේ බණ ටික අහගන්න ආපහු සැරයක් පුරුදු වෙන්න ඕනේ. මොකද දහම අහනවා කියලා කියන්නේ, දහම කෙසේ වෙතත්, "අහනවා" කියලා කියන්නේ ඉගෙන ගන්න ඕනේ කුසලතාවයක්. ඒක දක්ෂතාවයක් අපි දියුණු කරගන්න ඕන.

ඉතින් මම දන්න තරමින් නම් පින්වතුනි දියුණු වෙච්ච රටවල් වල පින්වතුනි "අහනවා" කියන එක උගන්වනවා. කොහොමද යමක් හරියට අහන්නෙ කියලා. දියුණුවෙච්ච රටවල් වල පින්වතුනි පොත් ලියවිලා තියෙනව. වෙනම පින්වතුනි courses තියනවා. ඔන්ලයින් ගිහිල්ලා කරන්න පුළුවන්. හරියට ශ්‍රවණය කරන්නේ කොහොමද කියල. නමුත් දියුණුවෙමින් පවතින රට වල ඔබ අහල නෑ නේද පින්වතුනි ශ්‍රවණ තරඟ ගැන? අහල තියෙනවද.. ශ්‍රවණ තරග? අහල නෑ. නමුත් ඔබ අහල තියෙනවා නේද කථික තරග ගැන? හිතලා බලන්න පින්වතුනි.

එයා හොඳ කථිකයෙක් කියලා අපි සම්මාන දෙනවා, පිළිගන්නවා සමාජය. එයා හොඳ ශ්‍රාවකයෙක් කියලා පින්වතුනි කොහෙවත් කියවෙන්නෙ නෑ නේද. හැබැයි සාසනේ පින්වතුනි ඉන්න තරමක් ඉන්නේ ශ්‍රාවකයෝ නේද? භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා. ඒ කියන්නේ තථාගතයන් වහන්සේගේ ශ්‍රාවකයෝ. "තථාගත ශ්‍රාවකයෝ". තථාගත දේශකයෝ" නෙමේනේ. මොකද තථාගතයන් වහන්සේ තමා පින්වතුනි දේශකයාණන් වහන්සේ. උන්වහන්සේගේ මනසේ ඉපදුන දහම් උන්වහන්සේ දෙසුවේ.

එතනින් එහා පැත්තෙ පින්වතුනි හැමෝම, සියලුම අරිහතුන් වහන්සේලා සහ අරිහත් වෙන්න දරන උත්තමයන් වහන්සේලා සියලු දෙනාම පින්වතුනි තථාගත දේශනාව ශ්‍රවණය කරා, මුලින්ම. එහෙනම් හැමෝම පින්වතුනි, මුලින්ම දේශකයෝ වෙන්න කලින් ශ්‍රාවකයෝ වෙන්න ඕනේ. ශ්‍රාවකත්වය කියලා කියන්නේ මේ පින්වතුනි මේ අහසින් කඩා පාත් වෙන, අම්මගේ බඩෙන් එලියට එනකොට කෙනෙක්ට පිහිටන දෙයක් නෙමෙයි. ඒක ඉගෙන ගන්න ඕනේ දක්ෂතාවයක්. ඒ කියන්නේ දෙයක් හරියට අහන්න ඉගෙන ගන්න ඕනේ. ඒක ඇත්තටම skill එකක්. එක කුසලතාවයක්. ඒකයි කියන්නේ එක එක වැඩ කර කර මේ දේශනාව අහන්න එපා කියලා.

අර අර කතාව දැන් මං ආයිත් කියන්න ඕනෙද? ඔය කිව්වට තාමත් එක්කෙනෙක් දෙන්නෙක් ඇති..හරි කැතයි නේද පින්වතුනි ඒ කතාව ඉතින් මං ඒක ආයෙත් කියන්නෙ නැතුව ඉන්නම්කෝ. හැබැයි එහෙනම් ඔබ එහෙම නොකර ඉන්න ඕනේ. සමහර වෙලාවට මේ දේශනා මුලින් අහන පිරිස එහෙම තමා. දැන් මං මේ ආයිත් මෙහෙම කියන්නේ ඔබ එහෙම නම්, වෙනස් වෙන්න කියලා. සමහර වෙලාවට මේ දේශනා මුලින් අහන පිරිස එහෙම තමා. හැබැයි ටික කාලයක් ගියාට පස්සෙ දේශනා ටික හොඳට අහලා, ඊට පස්සේ ආරාමයටත් යනවා එනවා, ස්වාමීන් වහන්සේලාවත් දැන් ටික ටික දන්නවා, ආරාමය ගැනත් දැන් දන්නවා. අර මං එහෙම ස්වභාවයකුත් දකිනවා සමහර වෙලාවට. ඒ කියන්නේ දහමට ළංවෙන්න ළංවෙන්න, ඇත්තටම දහමට වඩා පුද්ගලයන්ට ළංවෙන්න ළංවෙන්න, ස්වාමීන් වහන්සේලාට ළංවෙන්න ළංවෙන්න, ගුරු හාමුදුරුවොන්ට ළංවෙන්න ළංවෙන්න, අර එකේ වටිනාකම නැති වෙලා යනවා, අඩුවෙලා යනවා. සමහර වෙලාවට ඔබ අද මුලින්ම නම් මේ දේශනාව අහන්නෙ පින්වතුනි, ඔබ තක්බීරි වෙලා වගේ මේ දේශනාව අහන් ඉන්නවා ඇති."අපි නං කවදාක්වත් මෙහෙම දේශනාවක් ඇහුවේ නෑ" කියලා වගේ පිංවතුනි. ඔබට හුස්ම ගන්න එකත් අමතක වෙලා ඇති. ඒක ඔටෝමැටික් වෙන නිසා වෙනවා ඇති. හිතලා හුස්ම ගන්න වුණා නම් මෙලහකට ඔබ මැරිලා. නමුත් ඔබම කල්පනා කරලා බලන්න ඔබ කාලයක් තිස්සේ බණ අහන කෙනෙක් නම් සමහර විට දැන් අවුරුදු දෙකක් තුනක් හතරක් පහක් තිස්සේ බණ අහන කෙනෙක් නම් සමහර විට ගුරු හාමුදුරුවෝ දේශකයාණන් වහන්සේ හිටපු කාලේ ඒ කියන්නේ උන්වහන්සේ ගිහි කාලයේ කරපු දේශනා වලට පවා සම්බන්ධ වෙලා අහගෙන ආපු කෙනෙක් නම්, ඔබ පොඩ්ඩක් ඔබ ගැන හිතලා බලන්න. ඔබ දේශනා අහන්නේ දේශනාවක් පළවෙනි දවසේ අහපු විදියටම ද කියල. නැත්තම් දැන් ටිකක් වෙනස් නේ? දැන් ඔබ පින්වතුනි දේශනාව අහන ගමන් ෆෝන් එක අතට එනවනේ ඔටෝමැටිකලි? මේ පැත්තෙන් දේශනාවට ටැබ් එකේ යද්දි අනිත් පැත්තෙන් ෆේස්බුක් යනවා නේ? දැක්ක නේද පින්වතුනි වටිනාකම අඩු වෙලා තියෙන හැටි. මේ පැත්තෙන් ගුරු හාමුදුරුවෝ දේශනාවක් කරද්දී, කවුරුන්ගේ හෝ දේශනාවක් යද්දි මේ පැත්තෙන් ඔබ කම්පියුටරේ ඇරගෙන වෙන වැඩක් නේද?

දැන් මේ කවුරුත් අරමුණු කරල කියනව නෙමේ. මේ විපාකයට ඔබට යහපත පිණිස ඇදෙන ඒවා. ඒ නිසා "කවුද එහෙම කරන්නේ ස්වාමීනි?", මං දන්නෑ කවුද එහෙම කරන්නේ කියලා. සිරිපාල වෙන්නැති. වෙන්නැති. ඉතින් ඔබේ නම සිරිපාල නං මේ ඔබ ගැන නෙමේ කිව්වේ. x නැමැති පුද්ගලයා. x ඔබ නම් මේ ඔබටයි කියන්නෙ. ඒ x ඔබ නෙමේ නම් සමහර විට අනාගතයේ ඔබ x උනොත් එහෙම, ඒ කියන්නේ දැනට

ඔබ x-1 නම් තව ඉස්සරහට තමයි ඔබ x වෙන්න ඉන්නේ. අන්න එදාට ගන්න බෙහෙත තමයි මේ කියන්න පිංවතුනි. මොකද හැමදාම මේ ටික කියන්න බැහැනේ. අපි ඉස්සරහට කතා කරගෙන යන්න ඕනේ.

දැන් ඉතින් ඒ නිසා ඔබ හොඳට තේරුම් ගන්න දැන් මේ මම ආපහු සැරයක් හදලා දෙන්නේ පින්වතුනි, ඔබ ආරාමයට නාවත් ආරාමයේදී ඔබ බණ අහපු විදියක් තියෙනවා. ආරාමයේදී ඔබට බණ ටික අහන්න පුරුදු වෙච්ච ක්‍රමයක් තියෙනවා. අන්න ඒ ක්‍රමයට ඕනේ ඔබ බණ ටික අහන්න. මොකද ඔබ බණයි මේ අහන්නේ පින්වතුනි. මේ නවකතාවක් කියවනවා නෙවෙයි. නවකතාවක් අහනවා නෙමෙයි. මේ සුරංගනා කතාවක් අහන් ඉන්නවා නෙවෙයි. මේ කතා කරන්නේ පින්වතුනි, ඔබේ පින මේ වැයවෙන්නේ මේ වෙලාවේ.

අද ඔබේ කෑම මේසෙට පින්වතුනි ෆයිව් ස්ටාර් හෝටලයකින් ගන්න පුළුවන් බත් පිඟානක් සමහරවිට බත් ගෙදර උයලා හරි පිටින් ගෙන්නලා හරි ආව ඇති. ඒකට ගියානම් පින්වතුනි ඔබ කරගත්ත පිනෙන් යම් කොටසක් ආන් ඒ වගේ ලක්ෂ ප්‍රකෝටි ගාණක් පින්වතුනි මේ වෙලාවේ ඔබෙන් ගත වෙනවා. මොකද ඔබට ශ්‍රී සද්ධර්මයයි මේ ඇහෙන්නේ. තථාගතවරු මේ ලෝකෙ පහළ වෙලා ඉන්න කාලේ විතරක් ඔබට අහන්න හම්බෙන කොටසක් පින්වතුනි මේ වැය වෙන්නේ. ඉතිං ආන් ඒ නිසා ඔබ පරිස්සම් වෙන්න ඕනේ. ඔබෙන් ලොකු දෙයක් වැය වෙන නිසයි පින්වතුනි මං මේ මෙහෙම වටිනාකම, මෙච්චර මේක ගැන කියන්නේ ඔබේ ලොකු දෙයක් වැයවෙනවා මේ වෙලාවේ. ඔබට පේන්නේ නැති වුණාට, ඔබට දැනෙන්නේ නැති වුණාට, ලොකු දෙයක් වැය වෙනවා මේ වෙලාවේ. පරිස්සම් වෙන්න. ඔබේ යහපත පිණිසමයි මං මේ කියන්නේ. ඔබ ආන්න ඒ මානසිකත්වය හරියට හදාගන්න. එතකොට අපි ගැඹුරු දහම් කොටස් කතා කරන්න පටන් ගනිමු ආපහු වතාවක්.

දැන් ඔබේ ඉල්ලීම පින්වතුනි, ආරාමයේ ස්වාමීන් වහන්සේලා, දැන් ඔබ ගිය සතියෙ වීඩියෝ එකේ දැක්කත් ඇති, ඊට පස්සේ ප්‍රශ්න ගොඩක් ආවනේ අපිට "අනේ අපේ හාමුදුරුවනේ අපිට මේ ඔබ වහන්සේලා යන මඟ තවදුරටත් අපිට පැහැදිලි කරලා දෙන්න. ඔබ වහන්සේලා අපිත් එක්ක කතා කරපු කොටස් තියෙනවා. එතනින් එහාට ඔබ වහන්සේලා අනිවාර්යෙන් මග වඩාගෙන යනවා ඇති. එතනදී ඔබ වහන්සේලා වඩන මග ඔබවහන්සේලාට අවබෝධ වන දහම් කොටස් අපිත් එක්ක කියන්න. මොකද අපිට ගෙවල් වල ඉඳගෙන ගිහි ජීවිතයක ඉඳගෙන දහම ගැන මනසිකාර කරන්න, ඒ කියන්නේ අලුතෙන් දහම අද්ද ගන්න සමහර විට පරිසරය නැහැ වෙන්න පුළුවන්".

මතකනේ මං ඔබට ගිය සතියේ කිව්වා පින්වතුනි දහම වඩනවා කියන එකයි මග වඩනවා කියන එකයි දෙකක් කියලා. ඔබට ගෙදර ඉඳගෙන මග වඩා ගන්න පුළුවන් පින්වතුනි. ඒකෙ කිසිම බැරි කමක් නෑ. සමහරවිට දහම වඩන්න අමාරු ඇති. ආන් ඒ නිසයි ඔබ මේ දහම ශ්‍රවණය කරන්නේ. ඔබ මග නෙමේනේ ශ්‍රවණය කරන්නේ. ඔබ මග වඩනවා දහම අහනවා. අපිට ඒ සඳහා පරිසරය තියෙන නිසා පින්වතුනි, භික්ෂූන් වහන්සේලා විදිහට අපි මඟත් වඩනවා දහමත් වඩනවා. ඉතින් දහම එක තැනක වැඩුනහම ඇති පින්වතුනි. මොකද මග වැඩුවහමනේ, ආර්ය අෂ්ඨාංගික මාර්ගය කියලා

මගනේ වඩන්න තියෙන්නෙ. ඒ නිසා ඒ දහම ඔබේ හිත තුළ උපදින්න එහෙම අවශ්‍යතාවයක් නැහැ. දැන් කෙනෙක් සෝතාපන්න වෙන්නේ කොහොමද? තමන්ගේ හිත තුළ දහම ඉපදිලා ද? නෑ පින්වතුනි. ගුරුවරයෙක් ගාව ඉපදිච්ච දහම හොඳට ඇහුම්කන් දීලා. එහෙනං වැදගත්ම කොටස ඇහුම්කන්දීම නෙවෙයිද? පින්වතුනි මේ මං මේ කතා කරන ටික ගිහි ලෝකයේ ස්ටේජ් එකක් උඩට නැගලා අතට මයික් එකක් අරගෙන කතා කරා නම් ඔබ දන්නවද පින්වතුනි මේ කතාව ඉවර උනාට පස්සේ අඩු තරමේ පින්වතුනි ලක්ෂ දහයක් විස්සක් හම්බ කරන්න පුළුවන්. ලක්ෂ පහලවක් විස්සක් අනිවාර්යයෙන්ම හම්බ කරගන්න පුළුවන්. මොකද මේ ඒ තරම් වටින කතාවක් මේ කියන්නේ. මේ වගේ කතාවක් පින්වතුනි හරි නම් සාමාන්‍යයන් කරන්නේ, ආයතනයක ඉහළම පෙළේ ඉන්න නිලධාරී පිරිසකට. තමන්ගේ ආයතනය කොහොමද පරිපාලනය කරගන්නේ කොහොමද කියලා. හොඳට මිනිස්සුන්ට ඇහුම්කන් දෙන්න කොහොමද කියලා. ඉතින් ඔබට දැන් මේ ටික නිකං ඇහෙනවා. නිකං ද ඇහෙන්නේ? ඇත්තටම නිකං ද මේ ටික ඇහෙන්නේ? ඔබ මොකුත් වියදම් කරන්නෙම නැද්ද? ලක්ෂ දහයද වියදම් කරන්නේ? ඊට වඩා දෙයක් ද වියදම් කරන්නේ? හොඳට හිතල බලන්න. ඒකයි

ඉතින් ඒ නිසා, ඔබට මේ ටික ඇහෙන්න පින තියෙනවා තමයි. ඒක ගැන අපිට සැකයක් නෑ. මේ ටික ඇහෙන්න පින තියෙනවා. මේ ටික අහන්න පින තියෙනවද කියන එකයි, මට තියෙන ප්‍රශ්නය. මොකද මේ ටික ඇහෙන්න පින්වතුනි, ඔබේ ගෙදර ඉන්න බල්ලාටත් පින තියෙනවා. හැබැයි බල්ලා දුගතියේ කියලා කියන්න හේතුව තමයි, ඌට කියන දේ තේරෙන්නේ නැති නිසා. මොකද ඌට කියන දේ අහන්න තේරෙන් නෑ. ඇහෙන්න මොකුත් කරන්න ඕනේ නෑ, ඒක ඉබේට වෙන දෙයක්. ඒක විපාකෙට වෙන දෙයක්. අහන්න නම්, හොඳ අවධානයෙන් අහන්න ඕනේ, ඒක අහන ක්‍රමයක් තියෙනවා. දැන් අපේ පුන්‍ය භාරයට සම්බන්ධ වෙලා ඉන්න පිරිස්, අපි නිතර නිතර මතක් කරන කාරණාවක්, ඕක. ඔබතුමන්ලා ආරාමයේ ළඟින් ඇසුරු කරා කියලා, ස්වාමීන් වහන්සේලා ලඟින් ඇසුරු කළා කියලා, කවදාක්වත් තමන්ට පාඩුවක් වෙන්න ඉඩ දෙන්න එපා. එහෙනම් ඔබටත් කියන්න තියෙන්නේ ඒ ටිකම තමයි පින්වතුනි.

දැන් ඔබ සියලු දෙනාම එක එක අයුරෙන් ආරාමයේ වැඩ වලට සම්බන්ධ වෙනවා. සමහර දැන් අද කොරෝනාව තිබ්බෙ නැත්නම් පින්වතුනි, දැන් අද හවසට ඒ කියන්නේ, සෙනසුරාදා හවසට, කඨින පිංකම ආරාමයේ හෙවත්, සර්ව රාත්‍රික පරිත්‍රාණ සද්ධර්ම දේශනාවෙන්, කඨින පිංකම ආරම්භ වෙනවා. ඉරිදට යෙදෙන කඨින පිංකම. ඉතින් කොරෝනා තිබ්බෙ නැත්නම් ඔබ අද ගෙදර නෑ නේද? අද සෙනසුරාදානේ මේ දේශනාව අහන්නෙ. එහෙනම් ඔබ මේ වෙලාවේ ගෙදර නැනේ, කොහෙද ඉන්නේ? අනිවාර්යයෙන් කොහෙද ඉන්නේ? අනිවාර්යයෙන් ආරාමයේ ඉන්නේ. ඉතින් ඒ කියන්නේ ඔබ හැමෝම පින්වතුනි, තමන්ට කරන්න පුලුවන් උපරිමයෙන් මේකට සම්බන්ධ වෙලා ඉන්න පිරිස ඉන්නේ. සමහර දානමාන පූජා කරන පිරිස් ඉන්නවා. ආරාමයේ අවශ්‍යනතාවයන් හොයලා බලලා ඒව කරන පිරිස් ඉන්නවා. ආරාමයේ වැසිකිලිය හෝදල දෙන පිරිස් ඉන්නවා. ලයිට් බිල ගෙවන පිරිස් ඉන්නවා. මොකද ඒවා අපි කරන ඒවා නෙමෙයිනේ පින්වතුනි. ඔබ පින සඳහා, ඔබේ නිවන උදෙසා ඔබ කරගන්න දේවල්.

මේ සම්බුද්ධ ශාසනයේ ඉතින් අපි සාසනය වෙනුවෙන් කවුරුත් කරන් නෑ දේවල්. ඔක්කොම කරන්නේ තමන් වෙනුවෙන් තමයි. ඔබත් එහෙම තමයි වෙන්න ඕනේ. ඒක ගැන ඔබ ලජ්ජා වෙන්න එපා. ඔබ හිතන්න එපා මේක නිකං අනේ හොඳ නැද්ද දන්නෑ, මං මේ මං වෙනුවෙන් කරගන්නේ. නෑ, තමන් වෙනුවෙන් තමයි කරගන්න තියෙන්නේ. තමන් වෙනුවෙන් තමයි පින්වතුනි ඔක්කොම කරගන්න තියෙන්නේ. ශාසනයට අවැඩක් කළොත්, මතක තියාගන්න සාසනයට නෙමෙයි ඒ අවැඩ කළේ. තමන්ටයි කරගත්තේ. මොකද සාසනයට අවැඩක් කරන්න බෑ. ශාසනය කියලා කියන්නේ, ගුණයක්. ගුණයට අවැඩක් කරන්න බැනේ. ඔබ කොච්චර ගැරහුවත් පින්වතුනි, ගුණය විනාශ වෙන්නේ නැනේ. ගුණය එහෙමමයි. ඔබ කොච්චර වර්ණනා කළත්, ගුණය ඩබල් වෙන්නේ නැනේ. ඒ ගුණය එහෙමමයි. ඒ නිසා ඔබ ගුණයට අවැඩක්, කරන්න බෑ. කරගන්නේ තමන්ට. හරියට කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා, "ඔබ කැතයි" කියලා කියනවා වගේ. කාටද කියන්නේ? කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා ඔබ කියනවා, "හරි ලස්සනයි ඔයා කියලා". දැන් කාටද කියන්නේ? අන්න ඒ වගේ පින්වතුනි සාසනය. කරගන්නේ තමන්ට. හරිද?

ඉතින් එහෙම එක එක විදිහට සම්බන්ධ වෙලා ඉන්න පිරිස් ඉන්නවා. පුන්‍ය භාරයේ ඉඳන්, අනිත් පැත්තට යනකොට එක එක මට්ටමින් ඉන්නවා. ඒ හැමෝටම මම මතක් කරන්නේ, ඔබ කොච්චර ළං වුණත් මේකට, මතක තියාගන්න බණක් අහන වෙලාවේ, ඒ බණ අහන කොට ඔබ ඉන්නේ පුන්‍ය භාරයේද, නැත්නම් මොකේද කියන එක මෙතනට අදාල වෙන්නේ නෑ. මොකද ඔබේ නිවන කරගන්න ආවෙ, ලෝකෙට ඉපදුනේ මිසක්, ඔබ ආරාමයට ඇවිල්ලා, ආරාමයේ වැසිකිලිය හෝදන්න නෙමෙයි මේ ලෝකයට ආවෙ. නිවන කරගන්න ලෝකයට ආපු නිසා පින්වතුනි ආරාමයේ වැසිකිලිය හෝදන්නවා මිසක්, ආරාමයේ වැසිකිලිය හෝදන්න, මේ ලෝකයට ඉපදිච්ච කෙනෙක් ඔබ අතර ඉන්න විදියක් නෑ. එහෙම අය අපේ ආරාමයට සම්බන්ධ වෙන්න විදිහක් නැහැ. මොකද ධර්මයයි ඔබයි, යටින් ගහන්නේ නැනේ, හුදෙක් වැසිකිළි සේදීම සඳහා පමණයි කියලා. අපි කියන්නේ හුදෙක් නිවන් අවබෝධය පිණිසයි. එහෙනම් කරන හැම දෙයක්ම නිවන් අවබෝධය පිණිසයි. එහෙනම් නිවන් අවබෝධය පිණිස නම් ඔබ ඒවා කරන්නේ පින්වතුනි, නිවන දෙසන වෙලාවට වෙන කිසිම දෙයක් කරන්න එපා. මං මේ ආයෙත් කියන්නෙ අර රාජකාරිය කරන ගමන් බණ අහන අය ගැන නෙමෙයි. ඒගොල්ලො පින්වතුනි හරි ශ්‍රේෂ්ඨයි. හරි ඒක ගැන මං කලින් සඳහන් කළානේ. මේ කියන්නේ පින්වතුනි බණ අහන වෙලාවට වෙන මොකුත් කරන්න යන්න එපා. ඒකෙන් ඔබටමයි පාඩුව සිද්ධවෙන්නේ. එතකොට පින්වතුනි ගැඹුරු දහම් කොටස් කියන්න කලින් ඔබට ඒ කියන දේ දරන්න පුළුවන් පරිසරය හදලා දෙන්න ඕනේ. ඒකයි මං මේ කරන්න උත්සාහ කරන්නේ. නැත්නම් බීරි අලින්ට වීණා වයනවා වෙනවා නේ. දැන් ඔබට තේරෙන්න ඕනේ පින්වතුනි, අපිට ඕන කම තියෙන්නෙ ඔබට නිකං බණ ටිකක් කියවන්න නෙමෙයි කියලා.

නැත්නම් පින්වතුනි දැන් මේ අද තුන්වෙනි දේශනාවනෙ මේ යන්නේ. එහෙනම් හරිනම් මේ වෙනකොට මම පටිච්චසමුප්පාදය කතා කරන්න පටන් අරන් තියෙන්නෙ එපැයි. අපි වඩපු දහම පින්වතුනි ඔබට කතා කරන්න පටන් අරන් තියෙන්න එපැයි. පින්වතුනි මාන අනුසයට ගහන්නේ කොහොමද කියලා පින්වතුනි අපි මේ දවස් වල ආරාමයේ අපි වඩන්නේ මේ දවස් වල. තනිකර පින්වතුනි ජාතිය හට ගන්න විදිහ,

ජාතිය හටගත්තොත් ජරාවට මරණයට යන විදිහ, අවිද්‍යාව තෘෂ්ණාව නිසා පින්වතුනි තනිකර මේ මම ඉන්නවා කියලා දැනුනට ඇත්තටම මමෙක් හැදෙන්නේ නැහැ, මෙතන තියෙන්නේ තනිකරම ජාතියක් පින්වතුනි. ඔන්න ඔය වගේ ගැඹුරු අතිශය ගැඹුරු දහම් කොටස් මේ, මේ දවස්වල අපි කතා කරන්නේ ආරාමය තුළ. මේ විපාක ශක්තිය පින්වතුනි මේ ලෝකෙ ක්‍රියාත්මක වන ආකාරය, අපි මේ කතා කරන්නේ මේ දවස් වල ආරාමයේ. නමුත් එක පාරට හරි නම්, එහෙනම් පින්වතුනි අපිට බණ ටිකක් නම් ඕනේ, ඔබට කියන්න ඕනේ මේ වෙනකොට ඒ ඔක්කොම කියලා ඉවරයි. තුන්වෙනි දේශනාව මේ යන්නේ. දැන් මේ වෙනකොට ඔබ පැය හයක් විතර බණ අහල. ඉතින් මේ පැය හය ඇතුළත මේ වෙනවිට පින්වතුනි මේ ටික අහල තියෙන්නෙ එපැයි. සමහර විට ඔබත් බලන් ඉන්නවා ඇති, අදවත් කියයිද දන්නෑ ටිකක් මොනවා හරි. හැමදාමත් කියන්නේ පොතේ ලියන්න කියනවා, දහම් කරුණු කියන්න කියනවා, බණ අහන්න හරියට වාඩිවෙන්න කියනවා, වෙන වැඩ කරන්න එපා කියනවා, මේ හාමුදුරුවො බණ දන්නෙම නැද්ද? ඔබට එහෙම හිතෙන්න පුළුවන්. පින්වතුනි මේ දහම දේශනා කරන්නේ හුදෙක් නිවන් අවබෝදය පිනිසයි. මිසක් හුදෙක් බණ දෙසීම පිණිසයි නෙවෙයි. අපිට ඕනේ නෑ ඔබව ධර්මධරයෝ කරන්න. අපිට ඕනේ පින්වතුනි ඔබේ හිත තුළ නිවන තැන්පත් කරන්න. ඒකට ක්‍රමක්‍රමයෙන්, අනුපූර්ව ප්‍රතිපදාවක් තියෙනවා. ඒක නිසා ඔබ හිතන්න එපා, මේ ඔබට අවැඩක් කරනවා, ඔබේ කාලය නාස්ති කරනවා. මේ හැම දේකින්ම කරන්නේ පින්වතුනි ඔබව සූදානම් කරන එක.

පහේ ශිෂ්‍යත්ව පන්තිය, පහේ ශිෂ්‍යත්වයට ලියන්න පින්වතුනි පටන් ගන්නෙ කවදා ඉඳන්ද? පහේ පන්තියේ ඉඳන් නෙමෙයි නේද? ඒක ඔබ හොඳටම දන්නවා නේ. පින්වතුනි මොන්ටි සෝරියටත් දාන්න බලනවා නේද දරුවා ශිෂ්‍යත්වේ ගැන ප්ලෑන් කරලා. හොඳම මොන්ටිසෝරිය හොයන්නේ ඇයි? එකේ පන්තියට යන ළමයට හොඳම ඉස්කෝලේ හොයන්නේ ඇයි පින්වතුනි? ශිෂ්‍යත්ව විභාගය පුළුවන් තරම් හොඳින් කරගන්න පුලුවන් වෙන්න නේද? ආන්න එතැනට පින්වතුනි මේ පරිසරය සකස් කරගෙන යන්නේ. ඒනිසා ඔබ හිතන්න එපා මේ දේශනාව නම් අහලා වැඩක් නෑ, උන්වහන්සේ පටිච්ච සමුප්පාදය කවද ද දන්නෑ, දේශනා කරන්නේ. ආන් එදාට ඇවිල්ලා හොඳට බණ ටික අහ ගන්න ඕනේ. ඔබ එහෙම එන්න එපා. මොකද එහෙම මේක කරන්න බෑ. කොහොමද දන්නෙ? අපිට ප්‍රතිඵල තියෙනවා. ඒ ප්‍රතිඵල තියෙන්නේ අපේ ගුරුවරු අපිට කියන දේවල් අපි කරන නිසයි. අපේ ගුරුවරු කවදාක්වත් කියලා නෑ පින්වතුනි, උඹලට පටිච්ච සමුප්පාදය විතරයි මං දේශනා කරන්නේ, අහගනිල්ලා කියලා.

පින්වතුනි ගුරු හාමුදුරුවෝ අපිට දිනපතා දේශනා කරනවා, අඩු තරමේ සතියකට දවසක් දෙතුන් සැරයක් හරි දේශනා කරනවා ඇවිල්ලා, පැය දෙක තුන දේශනා කරනවා, ඒ දේශනා කරන, ඒ කරන දේශනාවල පින්වතුනි මං කිව්වට විශ්වාස කරන්න, වැඩි හරියක් තියෙන්නේ ඒ දේශනාවල උපනිශ්‍රයන්. ඒ කියන්නේ නිවන කරගන්න හැටි, මිසක් නිවන නෙමෙයි. ඒ කියන්නේ නිවන නෙමෙයිද? නිවන කරගන්න හැටි. ඒ කියන්නේ වීර්යාය වඩා ගන්න හැටි. හරියට බණ ටික අහන හැටි. හොඳ අවධානයෙන් ඉන්න හැටි. ගරු ගුණ හිත වඩා වඩා ගන්න හැටි. අනික් අයට ගරු කරන හැටි. තමන් ගාව තියෙන ප්‍රශ්නෙ හොයාගන්න හැටි. ඒ ටික කතා කරල ඉවර

වෙලා සමහර වෙලාවට විනාඩි දහයක් පහලොවක් විතර උන්වහන්සේ ශුද්ධ නිවන දේශනා කරනවා. ඉතින් කලින් දේශනා කළේ එතකොට නිවන නෙමෙයිද?

ආන්න ඒකයි පින්වතුනි, ඒ නිසා ඔබ තේරුම් ගන්න ඕනේ, අපි ඔබ ගැන හිතන විදිහ, මේ. එහෙනම් ඔබ තේරුම් ගන්න පින්වතුනි, මෙතන අපිට ඕනේ දහමක් දෙසන්න නෙමෙයි. ඒ අපේ විදිහ පින්වතුනි. මොකද මට ඕන්නෑ කාගෙන්වත් දහමක් අහන්න. මට ඕනේ මගේ නිවන කරගන්න විදිහ දැනගන්න. මම ආපු ක්‍රමයක් තියෙනවා පින්වතුනි, ඒ ක්‍රමය සාර්ථකයි කියලා මට තේරෙනවා. ආන් ඒකයි ඒ ක්‍රමය ඔබටත් කියලා දෙන්නෙ. මට සාර්ථකයි කියල හිතෙන ක්‍රමය එපැයෑ පින්වතුනි මං ඔබට කියන්න. නැත්නම් මං ද්‍රෝහියෙක් නේ. මම කරන ක්‍රමය එකක්, මං මට, මම කරන ක්‍රමය සහ මට අවබෝධ වෙලා තියෙන ක්‍රමය සහ මට හරි කියන ක්‍රමය එකක්. මං ඔබට එකක් දේශනා කරන්නද? හාද?

දැන් එහෙනම් ඔබට වැටහෙන්න ඕනෙ පිංවතුනි, මේ හැම දෙයක්ම කරන්නෙ ඔබ කෙරෙහි තියන, අප්‍රමාණ අනුකම්පාවෙන්. ඒකයි මොකද අපි දන්නවා ගිහි ජීවිතයේ ඉඳගෙන, ගෙදර ඉඳගෙන බණ අහනවා කියන පරිසරය මොන තරම් සම්බාධක සහිතයි ද කියලා. "සම්බාධෝ ඝරා වසෝ" කියලා පින්වතුනි තථාගතයන් වහන්සේ "රජස් සහිතයි, කෙලෙස් රජස් සහිතයි ගිහි ජීවිතය" දැන් මං මේ ගිහි ජීවිතයට, ඒ කියන්නේ ඔබට ගරහනවා නෙමෙයි මේ. ඔබ ඉන්න තැන ඉඳගෙන මේක කරගන්න විදිහ මං මේ කියන්නෙ. මොකද නැත්තං ඔබට මෙහේ ඇවිල්ලා කරගන්න ක්‍රමය මං කියන්නද? ඔබ පැවිදි වුණාට පස්සේ මේක කරන්න ඕනේ ක්‍රමය මං කියන්නද? එහෙම නැත්නම් ඔබ දැන් ඉන්න තැන ඉඳලා කරගන්න ක්‍රමය කියන්නද? අන්න ඒකයි මේ කියන්නේ. ඔබට ප්‍රශ්නෙට උත්තරේ ඔබ ගාව තියෙනවනේ. එහෙනම් මේ දෙන හැම අවවාදයක්ම පින්වතුනි, ඔබ හොඳට හිතට ගන්න.

කාගෙවත් හිතක් රිද්දවන්න ඕන කමක් නෑ මෙතන. හැබැයි සමහර විට හිත රිදෙන්න පුළුවන් කෙනෙක්ගෙ. දැන් ඔබ මේ දේශනාව අහන ගමන් අනික් පැත්තෙ ෆේස් බුක් බල බල හිටියනම්, ඔබට ටිකක් හිත ගැටුනා වෙන්න පුළුවන්. ඒ මොකද උන්වහන්සේ එහෙම කියන්නේ. මම නවත්වයි ෆේස්බුක් බලන එක. සමහර විට ඔබට එහෙමත් හිතුනා වෙන්න පුළුවන්. උන්වහන්සේ ඔය කිව්වට ෆේස්බුක් බැලුවා කියලා මොකද වෙන්නේ. ඉතින් මට එතකොට කියන්න හිතෙන්නේ ෆේස්බුක් බලලා බලන්න, මොකද වෙන්නේ කියලා. ෆේස්බුක් එකත් එක්ක තරහක් නෑ. හැබැයි ඔබ නිවන කරගත්තේ නැත්නම් ඔබට තියෙන පාඩුව මට තේරෙන නිසයි මං කියන්නේ.

මං හැම වෙලාවෙම පින්වතුනි මාව දා ගන්නවා ඔබේ තැනට. දේශනාවක් කරන වෙලාවට මං ඔබව ඔබේ තැනට මාව දාගන්නවා පින්වතුනි. මාව දාගෙන බලනවා මම ඔබ ඉන්න තැන හිටියා නම් මට අහන්න ඕනේ ටික මොකක්ද? මං ඔබ ඉන්න තැන හිටියා නම් මම බලාපොරොත්තු වෙන අවවාද මොනවද? මටත් ගිහි ජීවිතයක් තිබ්බානෙ පින්වතුනි. මමත් ඔබ වගේම හිටපු කාලයක් තිබ්බා. රාජකාරි කරගෙන පවුලක් එක්ක ජීවත් වෙච්ච කාලයක් තිබ්බා. ඒ නිසා මම දන්නවා පින්වතුනි ඒ වගේ පරිසරයක ඉඳන් මේ කටයුත්ත කරගද්දි තියෙන බාධක මොනවද කියලා. තියෙන ලොකුම බාධකය තමයි පින්වතුනි හරියට බණ ටික අහගන්න තියෙන බාධකය. මොකද එක එක පැතිකඩවලින් පින්වතුනි ලෝක සත්වයා ඔබෙන් දේවල්

බලාපොරොත්තුවෙලා එනවා. කොටසක් එනවා ෆෝන් එක හරහා. කොටසක් එනවා ඊමේල් එක හරහා. නැද්ද? කොටසක් එනවා දොරට තට්ටු කරලා. කොටසක් එනවා පිටට තට්ටු කරලා. නැද්ද? ඔය බාධක ඔක්කොම මැද්දේ නේද ඔබට මේක කරගන්න වෙලා තියෙන්නේ. එහෙනම් මම ඔබට කියලා දෙන්න ඕනේ, සිවුරු පොරෝ ගත්තට පස්සේ මේක කරන හැටි ද, නැත්නම් දැන් ඉඳන් කරන හැටි ද? ඔය ඉන්න තැන ඉඳන්. එහෙනම් එහෙම කියනවා නම් ඒ කියන්නේ ඔබත් එක්ක තියෙන අමනාපයකට ද? නැත්නම් ඔබේ යහපත පිණිස ද? ඒනිසා ඔබ තේරුම් ගන්න.

හරි, ඉතින් ඒ නිසා සියලු දෙනාම හොඳට තේරුම් ගන්න පින්වතුනි, හරියට බණ ටික අහන්න, එතකොට ක්‍රමක්‍රමයෙන් ඔබට මම පොරොන්දු වෙනවා, අපි වඩන දහම ඔබට හීන්සැරේ අපි කියලා දෙන්නම්. බයවෙන්න එපා. නමුත් ඒ ටික කියලා වැඩක් නෑ ඔබ දරන්න සූදානම් නැත්නම්. මුට්ටිය අනිත් පැත්ත හරව ගෙන පින්වතුනි ඔබ මට කිව්වොත් එහෙම වතුර හලන්න කියලා. මට කියන්න ඒ වතුර හලන හලන්න ඉල්ලපු ඔබ ද මෝඩ වැඩේ කරන්නේ, නැත්නම් වතුර හලන මමද මෝඩ වැඩේ කරන්නේ? නැත්නම් අපි දෙන්නම ද? ඔබ එහෙම ඉල්ලුවත් කමක් නැහැ පින්වතුනි මම දානවා නම්, මම හලනවා නම් ඒකට වතුර එහෙනම් ඔබට තේරිලාත් නෑ, මට තේරිලාත් නෑ නේද? ඒකයි මේක හරි ප්‍රායෝගික දෙයක් කියලා අපි ඔබට ගිය සතියෙත් මතක් කරේ. ප්‍රායෝගිකයි. නිවන, නිවන තරම් ප්‍රායෝගික දෙයක් මම නම් දැකලා නැහැ තවත්. ප්‍රායෝගිකයි කියලා කියන්නේ පිංවතුනි ඒක කරන විදිහ අතිශය වැදගත්. කරන්න ඕන දේ විතරක් නෙමෙයි, කරන විදිහ අතිශය වැදගත්. ඒක තමයි ප්‍රායෝගික දේවල් වල ස්වභාවය.

විද්‍යාව කියලා කියන්නේ ප්‍රායෝගික දෙයක්. ඔබ විද්‍යාගාරයේ කරන්න ඕන දේ විතරක් දැන ගත්තා නෙමෙයිනේ, මතකද පින්වතුනි විද්‍යාගාරයේ පරීක්ෂණයක් කරන්න යද්දි, ස්ටෙප් බයි ස්ටෙප් එකක තිබ්බා, ස්ටෙප් වන්, ස්ටෙප් ටූ, ස්ටෙප් ත්‍රී, මෙන්න මෙහෙම කරන්න, මෙහෙම කරන්න, මෙහෙම කරන්න. කරන්න ඕන දේ විතරක් නෙමෙයිනේ, කරන්න ඕන පරීක්ෂණය විතරක් නෙමෙයි ඒකෙ තිබ්බෙ. පරීක්ෂණය කරන විදිහත් තිබ්බනෙ පින්වතුනි. ඔක්කොමටම කලින් තිබ්බේ නැද්ද ලැබ් කෝට් එක දාගන්න කියලා. ඊට පස්සේ ඇස් වලට අර ගොගල්ස් දාගන්න කියලා තිබ්බේ නැද්ද, සේෆ්ටි ගොගල්ස්? ඉතින් ඒක මොකක්ද, පරීක්ෂණයත් එක්ක තියෙන සම්බන්ධය? කෙනෙක්ට එහෙම අහන්න පුළුවන්නේ. සෝඩියම් කැටයක් වතුරේ දැම්මහම පුපුරනවලු. ඉතින් ඒක, ඒක ටෙස් කරලා බලන්න කලින් මේ මොකද මේ ගොගල්ස් දාගන්න කියන්නේ? ඉතින් ඒකයි සෝඩියම් එකයි අතර තියෙන සම්බන්ධයක් නැනේ. කෙනෙක්ට එහෙම හිතෙන්න පුළුවන් නේ. එහෙම හිතෙනවනම් කොච්චර මෝඩයි ද ඒක? එහෙනම් පින්වතුනි විද්‍යාගාරයට ගියාට පස්සේ, මුලින්ම කියලා දුන්න පාඩම, සෝඩියම් වතුරට දාන හැටි ද? එහෙම නැත්නම් විද්‍යාගාරය තුළ පරිස්සමින් ආපු විදිහටම එළියට යන්න පුළුවන් වෙන්න තමන්ගෙ පරිසරය හදාගන්න විදියද මුලින්ම කියලා දුන්නේ? ඔබ ඒක බොහොම ඉවසීමෙන් ඉගෙන ගත්තා නේද එදා? ඕන කම තිබ්බේ නම් ටක් ගාලා ගිහිල්ලා අරවා අරගෙන මේකට දාන්න, මේකෙන් අරකට දාන්න. අරකෙන් බීකරයට දාන්න. ඒකෙන් ඒකට දාන්න. ඔය ඒ ටික නේ ඔබට කරන්න ඕනේ උනේ. නමුත් ගුරුවරයා ඒක කරන්න දුන්නෙ නෑ නේද පින්වතුනි? ඒ ඔබත් එක්ක තියෙන තරහවකට ද? නෑ එහෙනම් ඔබට වැටහෙනවා ඇති.

ඒ නිසා මේ ඔබ ගැන තියෙන අනුකම්පාවටමයි මේ ටික කියන්නේ, මං මෙච්චර කියන්නේ පිංවතුනි මේ කාරණාව ගැන, ඒකෙ තියෙන වැදගත්කම සහ ඔබට වෙන විදිහකට හිතෙන්න පුළුවන්. මේක මීට ටිකක් වෙනස් විදියකට හිතෙන්න පුළුවන්, ඒකයි මං කිව්වේ මේක කියනකොටත් කෙනෙක්ට හිතෙන්න පුළුවන් අතේ ෆෝන් එක තියෙනවා නං, ඔය කිව්වට ප්‍රශ්නයක් වෙන්නේ නෑ කියලා. ප්‍රශ්නයක් වෙන නිසයි කියන්නේ. ඔබට තේරෙයි ප්‍රශ්නයක් වෙනවා කියලා, ප්‍රශ්නය වෙච්ච දවසට. ඊට වඩා හොඳ නැද්ද, ගුරුවරයෙක් දෙයක් කියද්දී, ඒක කලින් අහගත්ත නම්. එතකොට ඒ ප්‍රශ්නේ වෙන්නේ නැනේ.

දවසක් අපේ ස්වාමීන් වහන්සේ නමක් දේශනාවක් කරා පින්වතුනි මේ ලඟදි. ඒ දේශනාවේ උන්වහන්සේ සඳහන් කරා බොහොම වටින කාරණාවක්. ඔබ කවුරුත් දන්න අපේ අයි ටී අංශය සම්බන්ධයෙන් මූලිකත්වය අරගෙන කටයුතු කරන අපේ රේවත ඥාන හාමුදුරුවන් වහන්සේ, උන්වහන්සේ දේශනාවේ පින්වතුනි සඳහන් කරනවා, මේ ලෝකයේ කරන්න තියෙන අමාරුම සහ, ලේසිම දෙය, ඔබට නිකං හිතලා බලන්න මොකක්ද ඒ කිව්වේ ඇත්තේ කියල? දැන් ඔබට එක එක උත්තර එනවා ඇති. කිරි කන්න. සමහර කෙනෙක් කියන්න ඇති නිවන් දකින්න. ඒවත් හරි වෙන්න ඇති. උන්වහන්සේ දේශනාවේ සඳහන් කළා පින්වතුනි මේ ලෝකෙ තියෙන කරන්න ලේසිම සහ කරන්න අමාරුම දේ තමයි ගුරුවරයා කියන දේ අහන එක කියලා. ගුරුවරයා කියන එක අහන එක. ඇයි මේ ලෝකේ ඒක තමයි කරන්න ලේසිම දේ කියලා කිව්වේ? ඉතින් ගුරුවරයා කියන එක අහන්න අමුතු දෙයක් ඕනේ නැනේ. කන් දෙකක් තියෙනවා නම්, අහන්න සූදානම් නම්, දැන් අහන්නයි තියෙන්නේ. එතකොට තමන් හිතන්න ඕනෙත් නෑ මොකක්ද කරන්න ඕනි කියල. ගුරුවරයා කියන දේ කරන්නයි තියෙන්නේ. ඒක ලේසි නැද්ද? හැබැයි ඒක තමයි කරන්න තියෙන අමාරුම දේ. ඒ ඇයි? මූලිකම හේතුව තමන්ට හිතෙනවා තමන් හරි කියලා. තමන්ට හිතෙනවා තමන් හරි කියලා. තමන් දේවල් දැන ගත්තහම ගුරුවරයා කියන දේවල් එක්ක තර්ක වෙන්න පටන් ගන්නවා. තර්ක වාද ඇතිකරගන්න පටන් ගන්නවා. දැන් ඒක හැරෙන්න අනිත් ඒව ඔක්කොම කරන්න හිතෙනවා. පින්වතුනි ඒ තමයි හිතේ ස්වභාවය. ඔබේ ස්භාවය එහෙම නෙමෙයි ඔය. හිතේ ස්වභාවය. ඇයි ඒ? මතකද මං කලින් කිව්වා, පෙර කරගත්ත කර්මවල විපාක ඔය. මොකද හිතට ධර්මයක් බහින්නේ කර්මයක විපාකයක් නිසා. එහෙනම් ඔය බහින විපාක බහීද පින්වතුනි, ඔබ අවධානයෙන් ඉන්න, ඕන් බැහැගත්තා සසරේ කරගත්ත අමුම අමු, අමු මහා අසත්පුරුෂ කමක් කරපු, අමුම අමු මහා මෝඩ වැඩක් කර ගත්තු එකක විපාක බැහැලා. මට හිතාගන්න බෑ, මට කියන දේ අහන් ඉන්න හිතෙන්නෑ. මට තර්ක කරන්නමනේ හිතෙන්නේ මේ කියන දේත් එක්ක. ඒක ගැන අවබෝධයෙන් ඔබ බණ ටික අහන්න. දැන් ඔබ එන එක නවත්තන්න හදන්න එපා. ඒක එයි. විපාක නවත්තන්න බෑ පින්වතුනි. විපාක එන වෙලාවට එනවා. නමුත් ක්‍රමක්‍රමයෙන් ඔබ මේ ගමන කියන විදියට කරගෙන ගියාම, ටික ටික යනකොට පින්වතුනි ඕක ඔහොම වෙන එක නවතී. මොකද ඔබට අවබෝධ වෙන්න පටන් ගන්නවා මේ කියන කාරණා. ඊට පස්සේ ඔබට ඒවා කරන්න හිතෙන්නෙ නෑ. ඉතින් අන්න ඒකයි ඒකෙ තියෙන වැදගත්කම.

එතකොට අර මං පොඩි කාරණාවක් ඔබට කියන්නම් කියලා කිව්වේ, ඒ තමයි අර, මේ ලෝකේ නැවත උප්පත්තියක් නෑ කියලා විශ්වාස කරන පිරිස් ඉන්නේ. ඒ

ගොල්ලන්ගෙන් ඇහැව්වොත් ඒගොල්ලො මැරෙන්න ලැස්තිද? නෑ. නෑ මැරෙන්න ලැස්ති නෑ. එහෙනම් මොකක්ද කරන්නද කැමති? සතුටින් ඉන්න කැමතියි. එතකොට ඇහැව්වොත් අපි දැන් ඔයා සතුටින්ද ඉන්නේ? ඔව්. ඉතින් මෙහෙම ඉන්නවා වරදක් නෑ. දරු පවුලත් එක්ක, මොනා හරි තියෙන දෙයක් කාල, ඒ, ඒ ඉන්නේ සතුටින්, කැමතියි. හැබැයි ඒ ගොල්ලන්ගෙන් ඇහැව්වොත් ලබන අත් භවයක්, එහෙම එව්ව නැහැ. ඇයි? තර්ක තර්ක. තියෙනවා නම් ඔප්පු කරල පෙන්නහංකෝ. තර්ක. පින්වතුනි, ඒගොල්ලන්ට හොඳ නැද්ද, ලබන අත් භවයක් තියෙන එක? ඇයි හත් දෙයියනේ මළාට පස්සෙ උපදිනවා නම්, ඉතින් ඉපදුනොත් නේද ඔය, ඔය කියන විදියට හොඳින් ඉන්න පුළුවන්. ඉතින් ඒගොල්ලන්ට ඒක ගුඩ් නිව්ස් එකක්නෙ. හොඳ සුබ ආරංචියක්නේ, පින්වතුනි. ලබන අත් භවයක් නෑ කියලා හිතන් ඉන්න මනුස්සයාට, ඔය දැන් ඔය ඔහොම ජීවත් වෙලා ඉන්න එක හොඳයි කියලා එයා කියනවා නම්, එහෙනම් හොඳ නැද්ද දෙයියනේ ආපහු සැරයක් ඉපදෙන එක? ඉතින් හොඳින් ඉන්න පුළුවන්නේ එතකොට. එතකොට කෙනෙක් කියයි නෑ, නෑ, මෙහෙම ඉන්න එක හොඳ නෑ. හොඳ වෙලාවට මේ මේකට ආයෙ ලබන අත් භවයක් නැත්තෙ, මෙහෙම ඉන්න එක හොඳ නෑ. මේ මං හරිම දුකෙන් ඉන්නේ. ඊට පස්සේ අහන්න තියෙන ප්‍රශ්නේ තමයි, ඉතින් හරිම දුකෙන් නම් ඉන්නේ, ආයෙ උපදින්නෙත් නැත්නම්, මොකටද මනුස්සයෝ ඉන්නේ? ඒ කියන්නේ, මොකටද ජීවතුන් අතර ඉන්නේ? ඉන්න එකත් දුකයි නම්, ඉතින් මොකටද ජීවතුන් අතර ඉඳලා ආයෙ ඉපදෙන්නෙත් නැත්නම් මලාට පස්සේ, මොකටද ජීවතුන් අතර ඉන්නේ? අඟ්ඟ් නෑ නෑ ඉන්න එක හොඳයි. ඉතින් එහෙනම් ලබන අත්භවයක් තියෙන එක කොච්චර හොඳයිද?

ඒකයි පින්වතුනි, තර්ක වාද වලට තැනක් නෑ. මොකද ඔය හැම තර්කයක්ම මහ පුස් තර්ක. කොහොමද දන්නෙ? අපිත් ඔය තර්ක තමයි දැම්මේ. ඒව මහා පුස් තර්ක. ඔය එකකටවත් ඔබ පැටලෙන්න යන්න එපා. ඔය එකක්වත්, ඔය එකක්වත් ඔබ දරන්න යන්න එපා පින්වතුනි. හිත ඇතුලෙන් ඒ එක එක තර්ක වාද, ඒවා පැත්තකින් තියන්න. ඒ කියන්නේ ඒවා එකපාර අයින් කරලා දාන්න කිව්වත් නෙමෙයි. පොඩ්ඩක් පැත්තකින් තියන්න. පයින් ගහලා දාන්න කිව්වා නෙමෙයි පින්වතුනි, පොඩ්ඩක් පැත්තකින් තියන්න. පැත්තකින් තියලා, මේ කියන දේත් එක්ක, අරකත් එක්ක තර්ක කර කර යන්න නෙමෙයි කියන්නේ. මේ කියන වෙලාවට කියන ටික හොඳට අහගන්න. ඊට පස්සේ ඔබේ වෙලාව අරගෙන හීන් සීරුවේ, මේ කියන ටික හරි වෙන්න ඇති කියලා අරගෙන පින්වතුනි, මේක හරි, එහෙනම් මම හිතන් ඉන්න එක බොරු වෙන්නේ කොහොමද කියලා පොඩ්ඩක් හිතලා බලන්න. මොකද ගොඩක් වෙලාවට හිතෙන්නේ මම හිතන එක හරි, මේ කියන එක කොහොමද බොරු වෙන්නේ? කියලා ඔප්පු කරන්න හදනවා. මං එහෙම අයත් එක්ක, මට...කතා කරලා තියෙනවා පින්වතුනි. ඒකයි මං ඔබට කියන්නේ, ඔබත් එහෙමනම්, එහෙම වෙනස්, ස්වභාවය වෙනස් කරගන්න. මේ තමයි පින්වතුනි ඔබට දහම ඇබ්සෝබ් කරගන්න තියෙන බාධක,

මම මේ අයින් කරල දාන්න හදන්නේ, මුලින්ම. අර ගමනක් යන්න හදද්දි පින්වතුනි පාරේ තියෙන දේවල් ඉස්සරලා අයින් කරලා දාන්නේ. ලොකු ගල්, පර්වත වගේ ගල්, ඒවා අයින් කරලා දාන්නේ. රොඩු බොරඩු තියන ඒවා අයින් කරලා දාන්නෙ පින්වතුනි, ගමනක් යන්න හදද්දි. හොඳට අතුපතු ගාලා, අස් පස් කරල, ඊට පස්සේ තමයි අද්දන්නේ. එතකොට හරි ලේසියි මේ ගමන යන්න. නැත්නම් මගක් දුර ගිහිල්ලා

පින්වතුනි වාහනය නවත්වන්න වෙන්වානේ අර මැද්දෙ තියෙන කොටේ අයින් කරලා දාන්න. මැද්දෙ තියෙන මහා ගල අයින් කරලා දාන්න. එතකොට වාහනෙන් බැහැල එන්න වෙනවා නේ. ඉතින් ලේසි නැද්ද ඉස්සෙල්ලා ඒ ටික පොඩ්ඩක් අයින් කර ගත්තා නම්? අඩු තරමේ ඇහැට පේන මානෙක තියෙන ටික හරි. ඉතින් ඔය තියෙන ලොකු බාධකයක් තමයි මිනිස්සු ගාව තියෙන තර්ක වාද. ආන් ඒ නිසා, ඒ තර්ක වාද පොඩ්ඩක් පැත්තකින් තියලා මේ අහගන්න එක ගැන යම් විශ්වාසයක් හිතට අරගෙන, මොකද ඔබ දැන් ඒ වෙනුවෙන් කාලය දැම්මනේ. ඒ කියන්නේ ඉන්වෙස්ට් කලානේ පින්වතුනි, දැන් ඒකට එන ප්‍රතිලාභයනේ මේ එන්නේ. එතකොට මේකට එන ප්‍රතිලාභය ගන්න ඔබ දක්ෂ වෙන්න. ඒක ප්‍රතික්ෂේප කරන්න එපා. මොකද එහෙනම් අපරාදෙනෙ බණ ටික ඇහුවේ. ඒ නිසා මේ ටික අරගෙන, මේක හරි වෙන්න ඇති කියලා හිතාගෙන, දැන් බලන්න ඔබ හිතන් හිටපු එක බොරු කරන්න. මොකද අන්න එහෙම තමයි පින්වතුනි බුදුහාමුදුරුවෝ කිව්වේ දහමට දාලා බලන්න කියලා. සූත්‍රයට ගලපලා බලන්න. එතකොට ඔබ හිතන් ඉන්න එක බොරු වෙනවානම් පින්වතුනි, දැන් ආපහු සැරයක් පොඩ්ඩක් බලන්න. හිතන් ඉන්න එක බොරු වෙන්න මෙන්න මේකෙ එක්ස්ප්ලනේශන් එකක් ආවද? මං අද අහගත්ත දේශනාව තුළින් මං මෙතුවක් කල් හිතන් ඉන්න එක බොරු උනාද? දැන් ඒක ඔබ අන්න ඒ විදිහට කල්පනා කරලා බැලුවහම, ඔබට තේරෙයි පින්වතුනි, මේ මෙතන නොගැලපෙන ස්වභාවයක් තියෙනවනේ. ඒත් ඔබට හිතෙනවා නම්, නෑ මං හිතන් හිටපු එක තමයි ඇත්ත කියලා, සමහර විට ඔබට ඊළඟ දේශනාවේ දී ඕක තේරෙයි. එහෙම නැත්නම් කවුරුහරි ස්වාමීන් වහන්සේ කෙනෙක් මුණ ගැහිච්ච වෙලාවක ඔබ අහන්න, "ස්වාමීනි ඔබවහන්සේ කරපු දේශනාවේ මට, මේ ටික ඇත්තටම මම අහගත්තා, මට ඒක ඒ වෙලාවේ හරියි කියලා තේරුණා. නමුත් මං ගාව තියෙනවා මෙහෙම අදහසක්. ඒකට මට මේක දාගන්න තේරෙන්නේ නැනේ. ඒක දැම්මහම මට හිතෙනවානේ මේ අහගත්ත ටික වැරදියි කියලා" අන්න ඒ විදියට අහන්න පින්වතුනි, මිසක් කියන කියන එකට පුළුවන්නම් ඔප්පු කරල පෙන්නන්න? ඔන්න ඔතනින් බණ අහන්න යන්න එපා. ඒ අහන බණෙන් පින්වතුනි ඔබේ පින් ටික වැය වෙනවා කියන එක විතරයි සිද්ධවෙන්නේ. ඔබට මෙලෝ වැඩක් වෙන්නේ නෑ. ඊට වඩා හොඳයි පින්වතුනි ඒ දේශනාව අහන්නේ නැතුව ඉන්න එක. මොකද අඩුගානේ ඔබේ පින් ටික ඉතුරු වෙනවානේ. එතකොට ඒකෙන් පින්වතුනි අඩු තරමේ අද රෑට චිකන් බුරියානි එකක් කන්න පුළුවන්නේ. නැත්නම් අපරාදෙ නේද? කනට බණ ටිකත් ඇහිලා, පින් ටිකත් ගිහිල්ලා, අන්තිමට රෑට කන්න වෙන්නේ ඊයෙ ඉතුරු වෙච්ච ඉඳුල් ටික. අපරාදෙනෙ. චිකන් බුරියානි එකක් කන්න තියෙන වෙලාවේ පින්වතුනි, ඊයෙ ඉතුරු වෙච්ච පාන් කෑල්ලෙන්, පාන් භාගයෙන් පෙත්තක් කන එක අපරාදෙනෙ.

හ්ම්... ඒකයි. ඒ නිසා සියලු දෙනා බොහොම අනුකම්පාවෙන්, බොහොම කරුණාවෙන් පින්වතුනි මේ කරුණ මතක් කරන්නේ, ඔබ කවුරුත් හිත් රිදවා ගන්න එපා. කවුරුවත් මේක වරදවා තේරුම් ගන්නත් එපා. ඔබට දහම්, ගැඹුරු දහම මම මේ කියන්න සූදානම් වෙන්නේ. දේශනා කරන්න සූදානම් වෙන්නේ. හැබැයි ඊට කලින් ඔබ ඒ සඳහා සූදානම් විය යුතුයි. ඔබේ මානසික පරිසරය ඒ වෙනුවෙන් සාදාගත යුතුයි. එහෙම නැත්නම් ගැඹුරු දහම තේරුම් කරලා දීලා වැඩක් නෑ. විශේෂයෙන් පින්වතුනි මේ වගේ ක්‍රමවේදයක් පාවිච්චි කරලා අපි දහම දේශනා කරන වෙලාවේ. ඔබ මගේ

ඉස්සරහ නෑ, මට පේන්න මේ කියන වෙලාවේ මේ කියන ටික ඔබට තේරුනාද නැද්ද කියලා බලන්න. මම ඔහේ කියාගෙන යන්න පුළුවන්, නමුත් ඔබට වචනයක්වත් තේරිලා නැත්නම්, දැන් කියපු එකත් අපරාදෙනෙ. අහං හිටපු එකත් අපරාදෙනෙ. ඉතින් එහෙනම් මං බණ කියලා තියෙන්නේ මට බණ කියන්න ඕන නිසානේ. අපිට එහෙම වුවමනාවක් නැහැනේ පින්වතුනි. අපිට බණ කියන්න එපා කිව්වට පස්සේ අපි තර්ක කරන්න ගියෙ නෑ නේ, "එහෙම කොහොමද කරන්නේ? අපිට අයිතිවාසිකම් තියෙනවනේ බණ කියන්න. කතා කරන්න. මූලික අයිතිවාසිකම හිතට එන අදහස ඉදිරිපත් කරන්න." ඔබට ආරංචි ද අපි එහෙම කිව්වා කියලා?" අපිට කිවුවහම පිටට ගිහිල්ලා බණ කියන්න එපා කියලා අපි මොකද්ද කිව්වේ? "බැරිද ඒක තාවකාලික කරන්නෙ නැතුව, ජීවිතාන්තය දක්වා කරලා දෙන්න." එහෙම කිව්වේ නෑ. නමුත් එහෙම තමයි අපිට හිතුනෙ. පින්වතුනි අපි ඉපදුනේ එක කටක් එක්ක. ඒ නිසා පුළුවන් තරම් මේක (කට) පාවිච්චි වෙන ප්‍රමාණය තමයි අඩු කර ගන්න ඕන. මෙන්න මේ දෙක (කන) පාවිච්චි වෙන ප්‍රමාණය තමයි අපි වැඩි කරගන්න ඕනි. සම්බුදු සාසනයේ ඉන්නේ ශ්‍රාවකයෝ මිසක් දේශකයෝ නෙමෙයි. ශ්‍රාවකයෝ තමයි පින්වතුනි අරිහත් වුනේ. තථාගතයන් වහන්සේගේ ශ්‍රාවක පරිනාමයක් තමයි පින්වතුනි සොතාපන්නය කියලා කියන්නේ. මිසක් දේශක පරිනාමයක් නෙමෙයි. ඒ නිසා දේශනා කරන්න එහෙම, එහෙම ආසාවක් නෑ පින්වතුනි. පින් සිද්ධ වෙනවා. පින උදෙසා දේශනා කරනවා. ඔබට දහම අවබෝධ කරල දෙන්න. ඔබටත් යහමග, සුගති මඟ, නිවන් මග විවර කරල දෙන්න දේශනා කරනවා.

ආන් ඒ නිසා ඔබ තේරුම් ගන්න ඕනි මේ දේවල් කියන්නෙ අපිට ඔබට බණ කියන්න ඕන නිසා නෙමෙයි, මේ දෙන බණ, ඔබ තුළ, නිවන උදෙසා, ඒ කියන්නේ බණ නිබ්බාන කරගන්න. ඔබට පුළුවන් වෙන්නේ ඕනේ, ආන් ඒකයි පින්වතුනි අපේ පරමාර්ථය. ඒකයි මෙහෙම කතා කරන්නේ. ඒකයි මෙහෙම ඔබට අවවාද දෙන්නේ. ඒ නිසා සියලු දෙනා එක්ක කරුණාවෙන් තේරුම් ගන්න. තේරුම් අරගෙන කටයුතු කර ගන්න ඕනේ.

දැන් ඔබට ගිය සතියෙ අපි කිව්වා, ඔබට තියෙන ප්‍රායෝගික ප්‍රශ්න අප වෙත ඉදිරිපත් කරන්න කියලා. ඉතින් කීප දෙනෙක් එහෙම ප්‍රශ්න ඉදිරිපත් කරලා එවලා තිබ්බා. ඒ ඇත්තටම අදහස තිබ්බේ එයින් ප්‍රශ්නයක් දෙකක් අද අරගෙන කතා කරන්න. නමුත් ඊට වඩා ටිකක් වෙනස් කොටසක් තමයි ඇදිලා ආවේ. ඒක තමයි කියන්නේ හැමදාමත් එක plan එකක් එක්ක එනවා නමුත් ඊට වඩා බොහොම වෙනස් ටිකක් තමයි ගොඩක් දුරට සිද්ධවෙන්නේ. ඉතින් ඒක ලෑස්ති කරගෙනත් ආවා. නමුත් අන්තිමට වෙන පැත්තක් තමයි ඉවර උනේ. මොකද ඉතින් ඒක මේ බණ එක අහන්න ඉන්න පිරිස අනුව තමයි ඒක තීරණය වෙන්නේ. අන්තිමට ඔබට දවසක තේරෙයි මේ මම හාමුදුරුවෝ දේශනා කරනවා නෙමේ කියලා. මේ විපාක ගොන්නක් පින්වතුනේ මේ ඇදෙන්නේ. ඔච්චරයි සිද්ධවෙන්නේ.

කර්මයකින් කරන්න පුළුවන් දුක හදන එක විතරයි. කර්මයකින් ඔබට බණ කියන්න බෑ. කර්මයකින් ඔබට බණ අහන්න බෑ. කර්මයකින් වෙන්නේ දුක හැදෙන එක විතරයි. පැත්තකින් දුකයි. අනිත් පැත්තෙන් විපාක හැදෙනවා. එච්චරයි වෙන්නේ පින්වතුනේ. ඉතින් අන්න ඒක අපි ඔබට තේරුම්කරලා දෙන්නම්. ඒවා ඔක්කෝම

තේරුම්කරලා දෙන්නම් පින්වතුනේ. ඔබට නිවන පූර්ණය කරන්න ඔබගේ අරිහත් ඵලයට අවශ්‍ය කරන සියලුම කරුණු කාරණා පින්වතුනේ අපි ඔබට ඇපවෙනවා ඒ ටික ඔබට තේරුම්කරලා දෙන්නම්. අපිට වැහුනොත් අපි ඔබට තේරුම්කරලා දෙන්නම්. අපිට වැටහුනේ නැත්නම් ඉතින් කරන්න දෙයක් නෑ. ඉතින් ඔබ අප ගැන විශ්වාසයක් තියාගෙනනේ පින්වතුනේ මේ ගමන එන්නේ.

කාලයක් තිස්සේ ඔබ මේ බණ අහගෙන එද්දී ඔබටම තේරෙනවා අපි මෙහේ ඉදගෙන අල බතල තම්බ තම්බ ඉන්නවා නෙමේ කියලා. ඔබටම තේරෙනවා පින්වතුනේ අපි මේ නිවන් මඟ තුල යන පිරිසක් කියලා. මොකද ඔබට අපි කතා කරන දහම තුල, අපේ චර්යාව තුල ඔබට ඒවා පේනවා ඇති. අපි විශ්වාස කරනවා එහෙම. ඒ වගේ අපිටත් පින්වතුනේ ඔබ තුල වෙනසක් පේනවා. ඔබ යහමඟට හැරිලා. ඉස්සර ගත කරපු ජීවිතයට වඩා අද ගොඩාක් වෙනස් ඒ ජීවිතය. ඔව්ද නැද්ද? ඉතින් ඒ කියන්නේ අපි දෙන දහම ඔබ ගන්න ලෑස්තියි. ඒ ලෑස්ති පිරිසක් ඉන්නවා. නැති පිරිස යනවා. එච්චරයි. ඔච්චරයි තියෙන්නේ. තථාගතයන් වහන්සේගේ පහළවීමත් එක්ක පින්වතුනේ උන්වහන්සේ දෙන දේ ගන්න පිරිසක් ඉන්නවා. නැති පිරිස යනවා. එච්චරයි තියෙන්නේ. කවදත් එහෙමයි.නැත්නම් මෙච්චර බුදුවරු ඕන්නෑනේ. අනන්ත ගාණක් මේ වන විට බුදුවරුන් පහළ වෙලානේ. අනන්ත ගානක් තව ඉස්සරහාට පහළ වෙන්නත් තියෙනවානේ. ඉතින් උන් වහන්සේලාගේ සාසනයෙත් නිවන් දකින්න පිරිසක් ඉතුරු වෙන්න එපැයි. නැත්නම් උන්වහන්සේලා පව්නේ. ඒ නිසා හැමෝම තේරුම් ගන්න ඒ කාරණාව.

ප්‍රශ්න කිහිපයක් ඇවිල්ලා තිබ්බා. අපි ඒ ප්‍රශ්න ලබන සතියේ උත්සාහ කරමු දේශනාවට අරගෙන ඒවා කතා කරගෙන යන්න. ඉතින් ඔබට තියෙන ප්‍රායෝගික ප්‍රශ්න. ඇත්තටම සතුටු උනා ඒ අහපු ප්‍රශ්න ප්‍රායෝගික ප්‍රශ්න මිසක් මේ දහමෙ කරුණු ගැන නෙමේ තිබ්බේ. උදාහරණ පවා ඇතුලත් කරලා තමයි ප්‍රශ්න ආවේ. මෙන්න මෙහෙම ප්‍රශ්නයක් මට තියෙනවා ස්වාමින් වහන්ස මෙන්න මේ ප්‍රශ්නයට කොහොමද මම දහම දාගන්නේ. සමහර කෙනෙක් මම මෙහෙමයි දාන්නේ මේක හරිද කියලා පවා අහලා එවලා තිබුණා. යමක් උත්සාහ කරලා තිබ්බා. අන්න ඒක හරි වටිනවා පින්වතුනේ.

මතකද ගුරුවරයාගෙන් ගිහිල්ලා ගාණ, අනේ ටීච මේක හදලා දෙන්න කිව්වහම ගුරුවරයා මොකක්ද කිව්වේ. ඉස්සරලා හදන් එන්න. හදන් ආවට පස්සේ වැරදිලා නම් මම කියලා දෙන්නම්. මොකද පින්වතුනේ එතකොට ගුරුවරයා දන්නවා මෙයා හදන්න හදන එක තුල එයාගේ අවබෝධය වැඩෙනවා.අඩුතරමේ චක්කරේ හරි පාඩම් හිටිනවා. ඒ හදන්න හදන එක තුල. ඒ නිසා යහපතක් මිස අවැඩක් වෙන්නේ නෑ.

ඒ නිසා ඔබ ඒ ප්‍රශ්නේ තේරුම්ගන්න විදිහ ඔබට තේරෙන විදිහට ඔබ ලියලා එවන්න. ප්‍රශ්නයක් නෑ. කෙටියෙන් ලියන්න. ප්‍රශ්නයක් නෑ. එතකොට ඒකෙන් අවශ්‍ය කොටස අපි දේශනාවට ගමු. ඒ නිසා ඔන්න ඔය කියන කරුණු ඔබ සියලුදෙනාම හිතේ දරාගන්න. අපි හෙමින් සැරේ ඉදිරියේදී කෙමෙන් කෙමෙන් දවසින් දවස දහම කතා කරගෙන යමු. තව කාලයක් කොරෝනා තියෙයිනේ. ඒ නිසා අපිට කාලය ප්‍රශ්නයකුත් නෑ. නමුත් වැදගත්ම කාරණාව පින්වතුනේ අර ඔබට නිකන් ඔහේ දහම දෙන්න නෙමේ අපිට ඕනකරන්නේ. ඒක අපේ වැරැද්දක්ද, නැත්නම් ඔබ ඇත්තටම ඒකද අපෙන් බලාපොරොත්තු වෙන්නේ. ඔබට ඕන අපෙන් දහමද නැත්නම් ඔබට නිවනද අපෙන්

ඕනේ. දහම නම් ඕනේ, ඇත්තටම අපෙන් වැඩක් නෑ. මොකද ත්‍රිපිටකයෙන් copyයක් ගත්තානම්, internet එකෙන් download කරගත්තා නම් ඒකේ තියෙනවා කප්පරයකට දහම. එහෙමනම් අපිව ඕන්නෑ. සංසයා ඇසුරු කරන්න ඕනේ දහමට නෙමේ. සංසයා ඇසුරු කරන්න ඕනේ පින්වතුනේ නිවනට ලන්වෙන්න. ඒකටයි අට්ට පුරිස පුග්ගලෝ ඇසුරු කරන්න කියලා කිව්වේ. නිවන ගන්න මිසක් දහම ගන්න නෙමේ. හුදෙක් දහම් අවබෝධ පිනිසයි නෙමෙයි. හුදෙක් නිවන් අවබෝධය පිනිසයි. ඒකයි මම පෙන්වන්නේ. හැම පැත්තෙන්ම අපි ඔබව එකම තැන කරා මේ අරගෙන යන්නේ. එකම strategy එකක් මේ තියෙන්නේ.එකම vision එකක් මේ තියෙන්නේ. ඒක එදත් එහෙමයි. අදත් එහෙමයි පින්වතුනේ.හෙටත් එහෙමයි. හැබැයි ඔබට ඒක ගැලපෙන්නේ නැත්නම් සමහරවිට මෙතෙන නෙමේ වෙන්න පුළුවන් ඔබ  නිවන කරගන්න තියෙන තැන. නෑ ඔබට දහමම නම් ඕනේ එහෙම නම් සමහර විට ඔබ වෙන තැනකට වෙන්න ඇති යායුත්තේ. සමහර විට ඔබ වැරදිලා වෙන්න ඇති මේ Youtube  channel එකට connect වුනේ. මොකද අපි යන ක්‍රමයක් තියෙනවා පින්වතුනේ. ඒ ක්‍රමයෙන් ප්‍රතිඵල ලබන ලොකු පිරිසක් ඉන්නවා. ඉතින් ඒ අයට යහපත කරන්න අපි යහපත කරගන්න විදිහ. ඒ නිසා අපි  කරන දේ තමයි අපි ඔබට දේශනා කරන්නේ. අපි එකක් කරගෙන අපි ඔබට වෙන එකක් කියන්නේ නෑ. ඉතින් ඒ අයට යහපත කරන්න, අපි යහපත කරගන්න විදිහ, ඒ නිසා අපි කරන දේ තමයි අපි ඔබට දේශනා කරන්නේ. අපි එකක් කරගෙන ඔබට වෙන එකක් කියන්න නෑ. එහෙම කියනවා නම්, එහෙනම් අපි ද්‍රෝහියෝ නේ. අපි කියන ඒවා අහන්න වටින්නෑ එහෙනම්. ඉතින් ඒ නිසා අපි හීන් සැරේ කරුණු කාරණා කතා කරගෙන යං. මේ කියපු කරුණු, දුන්නු අවවාද, පින්වතුනි ඔබ පුළුවන් තරම් පිළිපදින්න උත්සාහ ගන්න. ඔබ බණ අහන වෙලාවට වෙන කිසිම දෙයකට යොමුවෙන්න එපා. හොඳ අවධානයෙන්, දැන් ගිය සතියේ කියපු කොටස් වගයක් තියෙනවා, දවසකට දහම් කරුණක් ගන්න කිව්වා, අපි විශ්වාස කරනවා ඔබ ඒව දැන් කරන්න පටන් අරන් ඇති කියලා. මොකද ඔය ටික කරන හිත තුළ තමයි පින්වතුනි, ඊට පස්සේ නිවන දේශනා කරපුහම ඒක පැලපදියම් වෙන්නේ. නැත්නම් ඔබ දන්නවා වගේ ඉදියි, නමුත් ඔබට අවබෝධ වෙලා නෑ. හරි. ඒ නිසා දවසකට දහම් කරුණක් ගන්න කිව්වා, දේශනාවක් පස්සේ හැමෝම විසිරිලා ගිහිල්ලා, තම තමන්ගේ වැඩ කටයුතු කරගන්නේ නැතුව, පොඩ්ඩක් දේශනාව අහන්න කීප දෙනෙක් වාඩි උනානම්, ඒ අය එකතු වෙලා පොඩ්ඩක් ඒ අහගත්ත කරුණු ටිකක් මනසිකාරය කරන්න කිව්වා. ඔබ විතරනම් බණ ටික අහගන්නේ ඒ ටික පොඩ්ඩක් හිතන්න කිව්වා. කොළයක් පෑනක් අරන් ඇවිල්ලා තමන්ට නැගෙන දහම් කරුණක් හරි එතන ලියාගන්න කිව්වා. මතකද? ඊට පස්සේ දවසෙ අන්තිමට ඒ ලියාගත්ත දහම් කරුණු ටික පොඩ්ඩක් එක සැරයක් කියවගන්න කිව්වා, මතකද? ඒවා මතක ඇති කියලා අපි විශ්වාස කරනවා. ඉතින් ඔබට මේ දේශනාව ආයෙ බදාදත් අහන්න හම්බ වෙනවා. එතකොට ඔබට සාමාන්‍යන් මං හිතන්නේ තුන් හතර වතාවක්වත් මේ දේශනාව විකාශනය වෙනවා. මං දන්න තරමින්. සෙනසුරාදා දෙසැරයක්. බදාදා දෙසැරයක් ආදි වශයෙන්. එනිසා ඔබ ඉන්න රටේ, ඔබ ලෝකෙ කොහේ හරි ද ඉන්නේ, ඒකට ගැලපෙන කාලය අනුව, වෙලාව අනුව බලලා සුදුසු විදිහක් බලන්න පින්වතුනි ඒ නිසා, අන්න ඒක තමයි ඔබගේ දක්ෂතාවය. හරිද? හොඳයි එහෙනම් අපි පුණ්‍යානුමෝදනාව සිද්ධ කරලා, මෙතනින් දේශනාව අවසන් කරමු.

ඒ වගේම පින්වතුනි විශේෂයෙන් දැන් මේ පුණ්‍යානුමෝදනාව යන වෙලාවේ, ඔබට පුළුවන් නම් දේශනාව පුරාවට රැඳී හිටියනම් පින්වතුනි, පුණ්‍යානුමෝදනාවටත් රැඳී ඉන්න එක තමයි වැදගත්කම. ඒක අපිට කරන උදව්වක් එහෙම නෙමෙයි, මොකද මේක අහනවද නැද්ද කියලවත් පින්වතුනි අපි එහෙම හොයලා බලන්නේ නැහැ. අපෙන් වෙන්න ඕන ටික අපි කලා, ඔබෙන් වෙන්න ඕනේ ටික ඔබ නේ කරගන්න ඕනි. ඒක ඔබ කරනවද නැද්ද කියලා හොයලා බලන්න ඒක පින්වතුනි, ඒක අපිට ඉතුරු කරන්න එපා. ඒ නිසා පුණ්‍යානුමෝදනාව කියලා කියන්නේ දස පුන්‍ය ක්‍රායාවෙන් එකක්. ඉතින් අපරාදේ, ඔබට කරන්න තියෙන්නේ, මේ කියන ටික අහගෙන පින් අනුමෝදන් කරන්න. ඔබට කියන්න ඕනෙත් නැනෙ. කියන ටික අහන් ඉන්නයි තියෙන්නෙ.

ඉතින් ඒ නිසා ඒක පාඩු කරගන්න එපා. ඒ වගේ, ඒ නිසා අර පොඩි පොඩි තැන්වලින් පින්වතුනි, අපරාදේ, ලිස්සලා යන්න දෙන්න එපා. මොකද ඒ පොඩි පොඩි තැන් යනකොට අර, අපරාදේ ඉතින් ඒවා නිකං කරගන්න පුළුවන් පින්. මේවත් ලොකු දේවල් මහා පින් පිංවතුනි. මොකද මුළු සසරක් පුරාවට ඔබත් එක්ක හිටපු අයට, ශක්‍ර දේවේන්ද්‍ර තුමාට පවා පින්වතුනි ඔබෙන් ගන්න යමක් තියෙනවා මේ වෙලාවේ. ඔබත් එක්ක විවිධාකාරයෙන් ණය ගනුදෙනු ඇතිකරගෙන තියෙනවා. ඔබේ අතින් අවැඩකම් ලක්වෙච්ච පිරිස්, අද ඔබට විනාසය කැන්දවන්න ඒගොල්ලො බලන් ඉන්නේ. අන්න ඒ ගොල්ලො යම් සහනයක් ලබාගන්න පින්වතුනි, ආයෙ දේවාල ගානේ යන්න ඕනෙ නෑ. මොකද ඒගොල්ලෝ බලාපොරොත්තු වෙන්නේ පින්වතුනි සහනය. සමහර වෙලාවට ඒගොල්ලො බලාපොරොත්තු වෙන්නේ ඔබේ අතින් අවැඩක් අසාධාරණයක් වෙච්ච බව ඔබ පිළිගන්න එක. එහෙනම් පින්වතුනි ඒකට ගිහිල්ලා පොල් ගහන එක නෙමෙයි කරන්න තියෙන්නේ. දෙහි කපන එක නෙමෙයි කරන්න තියෙන්නේ. ඒක කරන්න ඕන කෙනෙක් ඉන්නවනම් කරන්න. හරි. මං කියන්නේ පින්වතුනි එතනින් මෙහා පැත්තේ ඒ අය කෙරෙහි අනුකම්පාවෙන්, තමන්ගේ අතින් වරදක් වුණා කියලා තමන් පිළිගන්න. එහෙම නැද්ද පින්වතුනි මිනිස්සු. ඒගොල්ලන්ට ඕන එකම දේ තමයි ඔබේ අතින් වරදක් වුණා කියලා පිළිගන්න එක. තමන්ට අසාධාරණයක් වුණා කියලා ඔබ පිළිගත්තට පස්සේ ඒගොල්ලෝ ඒක අත ඇරලා දානවා. එහෙම නැද්ද, ඔබට හම්බ වෙලාම නැද්ද ඒ වගේ අය? ඒ කියන්නේ වරදක් වුණාට පස්සේ, ඔබ සොරි කිව්වට පස්සේ ආයෙ පස්සෙන් පන්නන්නේ නෑ. සොරි කියනකං පස්සෙන් පන්නනවා. ඉතින් එහෙම ඉන්නවා පින්වතුනි. ඉතින් එහෙම මිනිස්සු ඉන්නවානම්, මිනිස්සු මලාට පස්සේ ඒ ගති වෙනස් වෙන්නේ නැනේ. ඒ ඒ ගති තියෙන මිනිස්සු නොවෙන පිරිසකුත් ඉන්නවා, ඔබේ අතින් අවැඩකම් අසාධාරණකම් වලට ලක්වෙලා. ඉතින් ඔබට කරන්න තියෙන්නේ, ඒ අයගේ, තමන්ගේ අතින් වෙච්ච වැරදි වලට වන්දි ගෙවන්න, සමහරවිට ඔබට කරන්න තියෙන එකම දේ තමයි ඒ වැරදි පිළිගන්න එක. ඉතින් ඒ වැරදි පිළි අරන් නේද, පින්වතුනි අපි ඒ අයට පුණ්‍යානුමෝදනාව කරන්නේ. තමන්ගෙ අතින් අවැඩකම් අසාධාරණකම් වලට ලක්වෙච්ච අයට මේ පින හේතු වෙලා, ඒගොල්ලන්ට ඒ අභව්‍ය ස්ථාන වලින් අත මිදිලා, නිදහස් කරලා, අන්න ඒ ආකාරයෙන්, ඉතින් ඒ නිසා ඔබ මේ පුණ්‍යානුමෝදනාව කියන එක සුළුවට තකන්න එපා. දේශනාව දැන් අහගත්තා. දැන් පුණ්‍යානුමෝදනාව මොකටද? එහෙම කරන්න එපා. මේක අහන්න

ඔබට වෙලාව නැත්නම් අඩුම තරමින් ඔබට පුළුවන් වෙලාවක හරි පුණ්‍යානුමෝදනාව කරන්න. අන්න ඒකයි වැදගත් කම. හොඳයි.

හොඳයි පින්වතුනී එහෙනම් සියලු දෙනාම සිහිපත් කරගන්න...,

අද උදෑසන පටන් මේ මොහොත දක්වාත් නන් අයුරින් පින් දහම් කටයුතු වල නියත වෙලා, සද්ධර්මය ශ්‍රවණය කරලා, සද්ධර්මය දේශනා කරවගෙන, ත්‍රිවිධ රත්නයට වන්දනාමාන ඇප උපස්ථාන කරගෙන මේ නගා ගත්තු අනන්ත අප්‍රමාණ පුණ්‍ය කුසල ආශීර්වාද ශක්තියෙන් පළමුකොටම මෙතුවක් කාලයක් මේ ශ්‍රී සම්බුදු සාසනයට කර උර දීගෙන කටයුතු කළාවූ, සම්බුදු සාසනය පෝෂණය කළා, වූ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා කියන්නාවූ සිව්වනක් පිරිසටත්, මේ ලෝකයේ කොහේ හෝ තැනක වැඩ ඉඳගෙන මග වඩා ගන්නා වූ උත්තරීතර ස්වාමීන් වහන්සේලා, භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා කියන්නාවූ සිව්වනක් පිරිසටත් ඒ වගේම, සම්මා සම්බුදු ශාසනයේ චිර ජීවනය උදෙසා වෙහෙස මහන්සි වී කටයුතු කරන තමන්ගේ දිවි හිමියෙන් කටයුතු කරන මහා නායක අනු නායක ආදී නානා නම්ගොත් වලින් පෙනී සිටින්නාවූ උත්තරීතර මහා ගරුතර සංඝරත්නයත් මේ මොහොතේ සිහිපත් කරගෙන ඒ සෑම සියලුදෙනාටම  මේ පුණ්‍යත ශක්තිය විහිදුවා පතුරුවා හරින්න,

ඒ වගේම පින්වතුනි ආරාමයේ වැඩ වාසය කරන ගුරු හාමුදුරුවන් වහන්සේ ඇතුළු සියලුම ස්වාමීන් වහන්සේලාටත් අනගාරික මහත්ම මහත්මීන් සෑම සියලු දෙනාටත් පුන්‍ය බාරයට සම්බන්ධව කටයුතු කරන ඒ සෑම සියලු දෙනාටත් ඒ වගේම ඒ සියලු දෙනාම කෙරෙහි මහත්වූ, ශ්‍රද්ධාවෙන් යුක්තව තමන්ගෙ දහඩිය මහන්සියෙන් කඳුලින් උපයා සපයා ගත්තා වූ මිල මුදල් වියපැහැදම් කරල, කිසිම අඩුපාඩුවකින් තොරව සිවුපසයෙන් සංග්‍රහ කරන්නා වූ ඔබ වැනිම දායක දායිකාවන් සෑම සියලු දෙනාවත් මේ මොහොතේ සිහිපත් කරගෙන, ඒ සියලු දෙනා කෙරෙහිම මේ පුණ්‍ය ශක්තිය විහිදුවා පතුරුවා හරින්න. මේ පින් විහිදවා පැතිරී යාමෙන් ඒ අයගේ නිවන් මහට බාධා වෙලා තියෙන මොනයම් හෝ කරුණු කාරණා ඇත්නම් ඒ සියල්ල, ඒ සියලු බාධා කරදර හිරිහැර මුලින් නිදහස් වෙත්වා! ඇස්වහ කටවහ, හෝවහ. අවුල්, දෙවිල්, සැක සංකා අනවින කොඩිවින හිර බන්ධන යම්තාක් ඇත්නම් ඒ සියල්ලගෙන්ම නිදහස් වෙත්වා! අටඅනූවක් රෝග නව අනූවක් ලෙඩ අන්තරා ඇත්නම් ඒ සියල්ලකින්ම නිදහස් වෙත්වා! දස අකුසලයෙන්ම මිදෙත්වා! දස කුසලයම වඩත්වා! දස පුණ්‍යක්‍රියාම කරත්වා! නිබ්බාන පරම සුඛයෙන් සුඛිතතර වෙත්වා! කියලා සාධුකාරයක් දීල පින් අනුමෝදන් කරන්න.

ඒ වගේම පින්වතුනි මෙතුවක් කාලයක් මේ ශ්‍රී සම්බුදු සාසනයේ සම්බුදු දේශනයේ සම්බුදු ශ්‍රාකයින් වහන්සේලා ආරක්ෂා කරගෙන ආවා වූ, ශක්‍ර දේවේන්ද්‍ර තුමා ප්‍රධාන සදෙව් ලෝකවාසී සියලු දෙවි දේවිතාවුන් වහන්සේලාටත්, ඒ වගේම ඉන්ද්‍ර උපේන්ද්‍ර, චන්ද්‍රසේකර, ප්‍රජාපති කියන්නාවූ දෙවි දේවතාවුන් වහන්සේලා ඇතුළු ඒ අයගේ පරිවාර පිරිසටත්, ඒ වගේම යක්ෂ සේනාධිපතිවරු ඇතුළු ඒ අයගේ පරිවාර පිරිසටත්, ඒ වාගේම ඔබේ ඉෂ්ටකාමී හිතකාමී දෙවි දේවතාවුන් වහන්සේලා සෑම සියලු දෙනාටත්, ඒ වගේම මේ ආරාමයට යන එන සෑම සියලු දෙනාටම ආරක්ෂා සම්පත්තිය සලසා දෙන්නාවූ ගහක් ගහක් ගානේ, කොළයක් කොළයක් ගානෙ විමන් මවාගෙන වැඩසිටින භූමාටු දෙවියන්ගේ පටන් අකනිට්ට බ්‍රහ්ම ලෝකය දක්වා විහිදී පැතිරී සිටින

සෑම සියලු දෙව් දේවතාවුන් වහන්සේලාටත් මේ පුණ්‍ය ශක්තිය විහිදේවා පැතිරේවා පිහිටත්වා, මේ පින් විහිදී පැතිරී පිහිටීමෙන් ඒ අයටත් තමන්ගේ නිවන් මගට බාධා වෙලා තියෙන මොනයම් හෝ කරුණු කාරණා ඇත්නම් ඒ සියල්ලකින්ම නිදහස් වෙත්වා! ආයුෂය වර්ණය සැපය බලය පටිභාන ඥාණය පිහිටත්වා! දස අකුසලයෙන්ම මිදෙත්වා! දස කුසලයම වඩත්වා! දස පුණ්‍ය ක්‍රියාම කරත්වා! නිබ්බාන පරම සුඛයෙන් සුඛිත තර වෙත්වා! කියලා සාධුකාරයක් දීල පින් අනුමෝදන් කරන්න.

ඒවගේම පින්වතුනි ඔබේ සුජීවත්ව සිටින මව් දෙමව්පියන් සහෝදර ඥාති හිතමිත්‍රාදී පිරිසත්, ඔබට කරදරයක් හිරිහැරයක් වෙච්ච වෙලාවට ඔබට උදව් පදව් කරන්නාවූ යහළු යෙහෙළියන්, මිතුරු මිතුරියන් ඒ වගේම පින්වතුනි පුංචි කාලේ ඉඳන් මේ මොහොත දක්වා ඔබට ගුරුහරුකම් ලබා දුන්නා වූ ඒ ගුරුවරු සෑම සියලු දෙනාටත් ඒ වගේම පින්වතුනි, ඔබට ඉඳුම්-හිටුම්, වාසස්ථාන නිර්මාණය කරල දෙන්නට ඔබ ජීවත්වෙන නිවාස වල මුල් පදිංචිකරුවන් ගෙන් පටන් අද මේ මොහොත දක්වා ඒ වෙනුවෙන් වෙහෙස මහන්සි වෙලා කටයුතු කරපු සෑම සියලු දෙනාටත්

ඒ වගේම, ඔබට මැසි මදුරුවන්ගෙන් කරදර හිරිහැර වලින් බේරිලා ඉන්න ඇඳුම් ආයිත්තම් නිර්මාණය කරලා දෙන ඒ වෙනුවෙන් වෙහෙස මහන්සි වෙලා කටයුතු කරන සෑම සියලු දෙනාටමත්, ඒ වගේම පින්වතුනි අසනීපයක් රෝගාබාධයක් ඇති වෙච්ච වෙලාවක ඔබට බෙහෙතක් හේතක් ලබා කරලා දෙන්න. ඔබට ඔබේ සුඛ විහරණය උදෙසා වෙහෙස මහන්සි වී කටයුතු කරපු සෑම සියලු දෙනාටත් මේ නගා ගත්තා වූ පුණ්‍ය කුසල ආශීර්වාද ශක්තිය විහිදේවා පැතිරේවා පිහිටත්වා

ඒ වගේම ඔබේ කුසගින්න, බඩගින්න නිවාගන්නට ඒ වෙනුවෙන් වෙහෙස මහන්සි වෙලා කටයුතු කරපු එදා ඈත අතීතයේ ඉඳන් ඒ වැඩ සිටියාවූ මහරජ වරුන්ගෙන් පටන් මේ මොහොත දක්වා පින්වතුනි ඔබට දානයෙන් මානයෙන් ඇප උපස්ථාන කරන්න ආහාර වේලක් ඔබට උපයා සපයා දෙන්නට වෙහෙස මහන්සි වී කටයුතු කරන ඒ සෑම සියලු දෙනාටත් මේ පුණ්‍ය ශක්තිය විහිදේවා පැතිරේවා පිහිටත්වා.

ඒවගේම ඔබේ ස්වාමිදරුවන් ස්වාමි දියණියන් සේවක සේවිකාවන් ආදි වශයෙන් පින්වතුනි ඔබගේ සුඛ විහරණය උදෙසා නන් අයුරින් ඔබට උදව් පදව් කරන්නාවූ ඒ සෑම සියලු දෙනාටත් මේ පුණ්‍ය ශක්තිය විහිදවා පැතිරවා හරින්න. ඒවගේම පින්වතුනි විශේෂයෙන් අද රටේ මේ දරුණු වසංගත රෝගයක් පැතිරිලා තියෙන හැදිලා තියෙන කාලෙක පින්වතුනි ඒ වෙනුවෙන්, ඒ රෝගයෙන් අහිංසක ජනතාව බේරා ගැනීමට මහත්සේ වෙර වීරියක් දරලා මහන්සියක් දරල දිවා රෑ නොබලා වෙහෙස වීරිය දරන ඒ සෑම සියලු දෙනාටත් පින්වතුනි රාජතාන්ත්‍රික නිලධාරී පිරිස ඇතුළු කොටගත් ඒවගේම පෞද්ගලික අංශයේ සම්බන්ධ වෙලා කටයුතු කරන්නාවූ ඒ සෑම සියලු දෙනාටත් මේ පුණ්‍ය  ශක්තිය විහිදුවා පතුරුවා හරින්න.

ඒවගේම මේ රට පාලනය කරන්නාවූ රට සංවර්ධනය කරන්නාවූ රට ආරක්ෂා කරන්නාවූ රටට ආරක්ෂක සම්පත්තිය ලබා දෙන යම්තාක් පිරිසක් ඉන්නව නම් පින්වතුනි ඒ සෑම සියලු දෙනාටමත් මේ පුණ්‍ය ශක්තිය විහිදුවා පතුරුවා හරින්න, ඒ පින් විහිදී පැතිරී යාමෙන් ඒ අයටත් වැළඳී ඇති මොනයම් හෝ රෝගාබාධ අතුරු අන්තරා ඇත්නම් ඒ සියල්ලක්ම නිදහස් වෙත්වා, තමන්ගේ නිවන් මඟට බාධා වී තියෙන

මොනයම් හෝ කරුණු කාරණා ඇත්නම් යම්තාක් ඒ සියල්ලකින් නිදහස් වෙත්වා ඇස්වහ කටවහ හෝවහ අවුල් දෙවුල් සැක සංඛාර අනවින හිර බන්ධන යම්තාක් ඇත්නම් ඒ සියල්ලකින්ම නිදහස් වෙත්වා දස අකුසලයෙන්ම මිදෙත්වා දස කුසලයම වඩාත්වා දස පුණ්‍යක්‍රියාම කරත්වා නිබ්බාන පරම සුඛයෙන් සුඛිතතර වෙත්වා කියලා සාධුකාරයක් දීල පින් අනුමෝදන් කරන්න.

ඒ වගේම පින්වතුනි ඔබේ නමින් ජන්මාන්තර ගතවෙන්නට යෙදුනා වූ යම්තාක් පිරිසක් ඉන්නවනම් මේ අනන්ත සංසාරයක් පුරාවට ඔබත් එක්ක සහ සම්බන්ධ වෙලා කටයුතු කරගෙන ආවා වූ ඔබට අම්මා, තාත්තා, සහෝදර සහෝදරී, ඥාති හිතමිත්‍රාදීන් සැම සියලු දෙනාටමත් ඒවගේම, වතුර බින්දුවක තරමකින් වැලි කැටයක තරමකින් ඔබට උදව් පදව් කළා වූ සිනහ පොදක තරමකින් හිතක් රිදුනු වෙලාවක වචනයකින් උදව් පදව් කලාවූ යම්තාක් පිරිසක් ඉන්නව නම් මේ අනන්ත සංසාරයේ පින්වතුනි ඒ සියලු දෙනාටත් මේ පුණ්‍ය ශක්තිය විහිදුවා පතුරුවා හරින්න.

ඒ වගේම අනු එක් කල්පයක් පුරාවටම ඔබගේ අතින් අවැඩ අසාධාරණකම් වලට ලක් වෙලා අද ඔබව කපනවා, කොටනවා, මරනවා, කියලා හිතාගෙන ඔබගේ ලෞකික ලෝකෝත්තර අභිවෘද්ධියට බාධා ඇති කරන්න හිතාගෙන ඉන්න යම් පිරිසක් ඉන්නව නම් පින්වතුනි, ඔබේ අතින් වුණා වූ ඒ වැරදි වලට අවැඩ අසාධාරණකම් වලට වන්දියක් විදියට මේ පුණ්‍ය ශක්තිය විහිදුවා පතුරුවා හරින්න ඒ සියලු දෙනා කෙරෙහි මේ පින් විහිදී පැතිරී යාමෙන් ඒ අතර යම් කිසි කෙනෙක් අභව්‍යගාමීව ඉන්නවනම් එයින් අත මිදේවා, සම්බුදු සුගතිගාමී ධර්මය ලබත්වා, සසර පුරාවට කරගත්තාවූ යම්තාක් ණය ගනුදෙනු ඇත්නම් ඒ සියල්ලකින්ම නිදහස් කරත්වා, දස අකුසල්යෙන්ම මිදෙත්වා, දස කුසලයම වඩත්වා, දස පුන්‍යක්‍රියාම කරත්වා, නිබ්බාන පරම සුඛයෙන් සුඛිත තර වෙත්වා කියලා සාධුකාරයක් දීල පින් අනුමෝදන් කරන්න.

එහෙනම් පින්වතුනි අවසාන වශයෙන් සිහිපත් කරගමු අද උදෑසන සිට මේ මොහොත දක්වා ඔබ සියලු දෙනාම සද්ධර්මය ශ්‍රවණය කරලා නන් අයුරින් පින් දහම් කටයුතු වල නියැලිලා මේ නගා ගත්තු අනන්ත අප්‍රමාණ පුණ්‍ය කුසල ආශිර්වාද ශක්තියෙ බල මහිමයෙන් මේ මිහි මඩල මත නැවත වරක් ලක්ෂ ගණනින් අරිහතුන් වහන්සේලා පහල වෙත්වා කියලා සාධුකාරයක් දීල අධිෂ්ඨාන කරන්න.

ඒ පහළ වන්නා වූ අරිහතුන් වහන්සේලා අතරට ඔබ සියලු දෙනාටම එකතුවන්නට වාසනාව ලැබිලා මේ මනුෂ්‍යඅ අත්භවය තුළදිම, ශ්‍රී ගෞතම සම්බුද්ධ ශාසනය තුලදීම, බුදු පසේබුදු මහ රහතුන් වහන්සේලා නිවී සැනසී පැමිණි වදාළ නිත්‍ය මංගල, පරම සුන්දර අමෘත මහා නිර්වාණ ශාන්තිය ඒකාන්තයෙන්ම සාක්ෂාත් වෙත්වා කියලා සාධුකාරයක් දීල පින් අනුමෝදන් කරන්න.

හොඳයි පින්වතුනි එහෙමනම් මෙත් ආශීර්වාද ලබාගන්න සියලු දෙනාම වන්දනා කරගන්න.

රාග ගින්නෙන් මිදෙත්වා!
ද්වේශ ගින්නෙන් මිදෙත්වා!
මෝහ ගින්නෙන් මිදෙත්වා!
නිබ්බාන පරම සුඛයෙන් සුඛිතතර වෙත්වා!

නිබ්බාන පරම සුඛයෙන් සුඛිතතර වෙත්වා!!

මම ද සියළු ලෝක සියලු සත්වයෝ
නිබ්බාන පරම සුඛයෙන් සුඛිතතර වෙත්වා!
නිබ්බාන පරම සුඛයෙන් සුඛිතතර වෙත්වා!!
නිබ්බාන පරම සුඛයෙන් සුඛිතතර වෙත්වා!!!

රාග ගිනි නිවේවා!
ද්වේශ ගිනි නිවේවා!
මෝහ ගිනි නිවේවා!
නිවන් සැප ලැබේවා!
නිවන් සැප ලැබේවා!!
නිවන් සැප ලැබේවා!!!

තුණුරුවන්ගේ සූවිසි අනන්ත මහා ගුණ බලෙන් සියළු ලෝක සියලු සත්වයෝම නිබ්බාන පරම සුඛයෙන් සුඛිත තර වෙත්වා!

සාදු! සාදු!! සාදු!!!